202 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 202 - இல. 8
**Volume 202 - No. 8**

2011 සැප්තැම්බර් 23 වන සිකුරාදා
2011 செப்ரெம்பர் 23, வெள்ளிக்கிழமை
**Friday, 23rd September, 2011**



# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශෝක ප්‍රකාශය:**
ගරු ආර්.එම්. ධර්මදාස බණ්ඩා මහතා

**කල් තැබීමේ යෝජනාව:**
උතුරු හා නැඟෙනහිර පළාත්වල ඉඩම් ලියා පදිංචි කිරීමේ අලුත් වැඩ පිළිවෙළ අවලංගු කිරීම

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**அனுதாபத் தீர்மானம் :**
மாண்புமிகு ஆர்.எம். தர்மதாச பண்டா

**ஒத்திவைப்புப் பிரேரணை:**
வடக்கு, கிழக்கில் காணிகளைப் பதிவுசெய்யும் புதிய முறைமையை இரத்துச் செய்தல்

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
Hon. R.M. Dharmadasa Banda

ADJOURNMENT MOTION:
Cancellation of New System for Registration of Lands in Northern and Eastern Provinces

WRITTEN ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2011 සැප්තැම්බර් 23 වන සිකුරාදා***
*2011 செப்ரெம்பர் 23, வெள்ளிக்கிழமை*
*Friday, 23rd September, 2011*

***අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.30 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා 2010 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා 2008 සහ 2009 වර්ෂ සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2010 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්.- [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පිළිගන්වන ලද වාර්තා
## சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
## REPORTS PRESENTED

### ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### ஸ்ரீ தம்மாலங்கார சமூக சேவைகள் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### SRI DHAMMALANKARA SOCIAL SERVICES FOUNDATION (INCORPORATION) BILL

**ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි,"ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ 'ඒ' ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

***පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2011 ඔක්තෝබර් 06 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***
*சட்டமூலம் நிலைக்குழு "ஏ" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2011 ஒக்ரோபர் 06, வியாழக்கிழமை பரிசீலிக்கப்பட விருக்கிறது.*
*Bill, as reported by Standing Committee "A", to be considered upon Thursday, 06th October, 2011*

### රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இராமகிருஷ்ண சாரதா மிஷன் (இலங்கைக்கிளை) (கூட்டிணைத்தல்) சட்டமூலம்
### RAMAKRISHNA SARADA MISSION (LANKA BRANCH) (INCORPORATION) BILL

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු කථානායකතුමනි,"රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ 'බී' ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

***පනත් කෙටුම්පත "බී" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2011 ඔක්තෝබර් 06 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***

*சட்டமூலம் நிலைக்குழு "பி" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2011 ஒக்ரோபர் 06, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*

*Bill, as reported by Standing Committee "B", to be considered upon Thursday, 06th October, 2011*

## දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත

### தெஹிவளை, நெதிமாலை பௌத்த கலாசார நிலையம் (கூட்டிணைத்தல்) (திருத்தம்) சட்டமூலம்

### BUDDHIST CULTURAL CENTRE OF NEDIMALA, DEHIWALA (INCORPORATION) (AMENDMENT) BILL

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

(மாண்புமிகு சந்திம வீரக்கொடி)

(The Hon. Chandima Weerakkody)

ගරු කථානායකතුමනි, "දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ 'බී' ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

***පනත් කෙටුම්පත "බී" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2011 ඔක්තෝබර් 06 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***

*சட்டமூலம் நிலைக்குழு "பி" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2011 ஒக்ரோபர் 06, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*

*Bill, as reported by Standing Committee "B", to be considered upon Thursday, 06th October, 2011*

## උපදේශක කාරක සභා වාර්තා

### ஆலோசனைக் குழு அறிக்கைகள்

### CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි:

(1) 2007 වර්ෂය සඳහා ජනරාල් ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා අවසන් ගිණුම්;

(2) 2008, 2009 වර්ෂ සඳහා සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(3) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(1) 2008 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව;

(2) 2008 සහ 2009 වර්ෂ සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තා;

(3) 2007 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(4) 2009 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(5) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තා සහ වාර්ෂික ගිණුම්;

(6) 2008 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(7) 2005, 2006 සහ 2007 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තා;

(8) 2006, 2007 සහ 2008 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා (පරිපාලන හා ගිණුම්);

(9) 2009 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(10) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස් එක් වැනි වාර්ෂික වාර්තාව 2009.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )

(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(1) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව;

(2) 2009, 2010 වර්ෂ සඳහා ඩී.එෆ්.සී.සී. බැංකුවේ විගණකවරුන්ගේ වාර්ෂික වාර්තා හා ගිණුම්;

(3) 2010 වර්ෂය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව;

(4) 2010 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව; සහ

(5) 2010 වර්ෂය සඳහා ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කරාගෙඩ, යටමලගල, පාසල අසල පදිංචි ඩී.ජී.පී. විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) උණවටුන, ගොඩේවත්ත පදිංචි ඩල්සි ආර්. හත්තෙටුවේගම මහත්මියගෙන් ලැබුණු පෙත්සම: සහ

(3) ගාල්ල, බෝපෙ පාර, මහමුදලි මාවත, අංක 120 දරන ස්ථානයේ පදිංචි එච්.එල්. විල්ප්‍රඩ් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர் )
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

ගරු කථානායකතුමනි, මම කෑගල්ල, දේවාලගම, රණවල පදිංචි ඊ.එම්. සුනේත්‍රා ඒකනායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු කථානායකතුමනි, මම දෙහිවල, අත්තිඩිය, අංක 193/11 දරන ස්ථානයේ පදිංචි එල්.එම්.ඩබ්ලිව්.බී. කොලුගල මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රංජිත් සියඹලාපිටිය මහතා - පැමිණ නැත.

ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මොරපිටිය, සීලදොල පදිංචි එල්.පී. හර්ෂව තනුජය ලීලානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වවුනියාව, පොලිස් මූලස්ථානයේ සේවය කරන ජේ.පී.එල්.ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ඩුලිප් විජේසේකර මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துலிப் விஜேசேகர - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Duleep Wijesekera - Deputy Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, මම පැපිලියවල, ගිනිගම උතුර පදිංචි කේ.එල්.අයි.රූපසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු තලතා අතුකෝරළ මහත්මිය - පැමිණ නැත.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මම කොළඹ 05, නාවල පාර, අංක 163/24 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජේ.ටී.ආර්.ආර්.එම්. ප්‍රනාන්දු මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු දිළුම් අමුණුගම මහතා - පැමිණ නැත.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ගරු කථානායකතුමනි, මම නාත්තන්ඩිය, කච්චිරාව, අංක 282 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. පුබුදු නිසංසලා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා - පැමිණ නැත.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය - පැමිණ නැත.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා - පැමිණ නැත.

ගරු සුජීව සේනසිංහ මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## මහාමාර්ග ඉදි කිරීම සඳහා පවරා ගත් ඉඩම්: වන්දි
## நெடுஞ்சாலை நிர்மாணத்துக்காகச் சுவீகரித்த காணிகள்: நட்டஈடு
## ACQUISITION OF LAND FOR HIGHWAYS : COMPENSATION

0330/'10

1. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) පසු ගිය වර්ෂ 20ක කාලය තුළ මහාමාර්ග ඉදි කිරීම සඳහා වාර්ෂිකව පවරා ගත් ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා ගෙවිය යුතු වන්දි ප්‍රමාණය කොපමණද;

(iii) එයින් දැනටමත් ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) එම මුදල් ගෙවා නිම කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 20 வருடங்களில் நெடுஞ்சாலைகளை நிருமா ணிப்பதற்காக வருடாந்தம் அரசாங்கத்தி னால் பெற்றுக்கொள்ளப்பட்ட காணிகளி னளவை வெவ்வேறாகவும்,

(ii) அவற்றுக்காக செலுத்தப்பட வேண்டிய நட்டஈட்டுத் தொகையின் அளவு என்னவென்பதையும்,

(iii) அதில் இதுவரையில் செலுத்தி முடிந்துள்ள தொகை யினளவு என்ன என்பதையும்,

(iv) இன்னும் செலுத்துவதற்காக எஞ்சியுள்ள தொகையி னளவு என்ன என்பதையும்,

(v) அவை எப்பொழுது செலுத்தி முடிக்கப்படும் என்ப தையும்

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways :

(a) Will he state -

(i) separately, the extent of lands acquired annually for constructing highways during the past 20 years;

(ii) the amount of compensation that should be paid for the above mentioned acquisition;

(iii) the total amount of money which has already been paid as compensation;

(iv) the amount which remains to be paid; and

(v) the date on which the payments will be completed?

(b) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා. දීර්ඝ පිළිතුරක් නිසා මම එය **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හෙක්ටයාරවලිනි.

| වර්ෂ | 1990 | 1991 | 1992 | 1993 | 1994 |
|---|---|---|---|---|---|
| ඉඩම් ප්‍රමාණය | 39.28 | 13.9 | 3.77 | 9.6 | 43.93 |

| වර්ෂ | 1995 | 1996 | 1997 | 1998 | 1999 | 2000 |
|---|---|---|---|---|---|---|
| ඉඩම් ප්‍රමාණය | 22.72 | 47.43 | 95.81 | 42.48 | 18.68 | 280.27 |

| වර්ෂ | 2001 | 2002 | 2003 | 2004 | 2005 |
|---|---|---|---|---|---|
| ඉඩම් ප්‍රමාණය | 643.03 | 193.55 | 262.04 | 352.22 | 339.2 |

| වර්ෂ | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| ඉඩම් ප්‍රමාණය | 197.36 | 123.03 | 136.31 | 115 | 40.94 |

(ii) රුපියල් මිලියන තිස්හතරදහස් හයසිය හැත්තෑපහයි.
(රුපියල් මිලියන 34,675)

(iii) රුපියල් මිලියන විසිහතරදහස් හතරයි.
(රුපියල් මිලියන 24,004)

(iv) රුපියල් මිලියන දසදහස් හයසිය හැත්තෑඑකයි.
(රුපියල් මිලියන 10,671)

(v) යම්කිසි හිඟ මුදලක් සෑම අවස්ථාවකදීම පවතී. සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කිරීමට නොහැක්කේ රජයේ සංවර්ධන අවශ්‍යතාවයන්ට ඉඩම් අත්පත්කර ගැනීම නිරන්තරයෙන් සිදුවන ක්‍රියාවලියක් නිසාවෙනි. වාර්ෂික ප්‍රතිපාදන ලැබීම අනුව ගෙවීම් සිදු කෙරෙන අතර ගෙවීමට ඇති මුදල අවම මට්ටමකින් පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. ප්‍රමාද වූ ගෙවීම් සඳහා පොලී මුදලක් ද ගෙවනු ඇත.

(ආ) පැන නොනඟී.

## මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසල්: ගුරු ඌනතා
## மாத்தறை மாவட்ட தேசிய பாடசாலைகள்: ஆசிரியர் பற்றாக்குறை
## NATIONAL SCHOOLS IN MATARA DISTRICT: TEACHER SHORTAGE

0801/'10

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ රජය මඟින් පාලනය වන ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල් අතරින් ගුරු අතිරික්තයක් පවතින පාසල් කවරේද;

(iv) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාසල්වලින් ගුරු ඌනතා පවතින පාසල් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වලට ගුරුවරුන් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் அரசாங்கத்தினால் நிர்வகிக்கப்படும் தேசிய பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளின் பெயர்கள், விலாசங்கள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி பாடசாலைகளில் ஆசிரியர் மிகை நிலவும் பாடசாலைகள் யாவையென்பதையும்;

(iv) ஆசிரியர் மிகை நிலவும் பாடங்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறை நிலவும் பாடசாலைகள் யாவையென்பதையும்;

(ii) ஆசிரியர் பற்றாக்குறை நிலவும் பாடங்கள் யாவையென்பதையும்;

(iii) ஆசிரியர் பற்றாக்குறை காணப்படும் பாசாலைகளுக்கு ஆசிரியர்களை பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) அவ்வாறாயின், அதற்குத் தேவைப்படும் காலம் எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House of -

(i) the number of National Schools administered by the Government in Matara district;

(ii) the names, addresses and telephone numbers of those schools;

(iii) the schools which are overstaffed, out of the schools mentioned in answer for (ii) above;

(iv) the subjects with respect to which they are overstaffed ?

(b) Will he state -

(i) the schools where shortage of teachers exists, out of those schools

(ii) the subjects with respect to which shortage of teachers exists;

(iii) whether action will be taken to provide teachers to the schools where shortage of teachers exists;

(iv) if so, the time frame required for providing teachers ?

(b) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසල් සංඛ්‍යාව 21කි.

(ii) ඇමුණුම් 1 බලන්න.

(iii) ඇමුණුම් 2 බලන්න.

(iv) ඇමුණුම් 2 බලන්න.

(ආ) (i) ඇමුණුම් 3 සිට 6 දක්වා බලන්න.

(ii) ඇමුණුම් 3 සිට 6 දක්වා බලන්න. ඇමුණුම් **සභාගත*** කරමි.

(iii) ඔව්.

(iv) ඉදිරියේදී සිදු කිරීමට නියමිත විද්‍යාපීඨ ඩිප්ලෝමා පත්වීම්, සෞන්දර්ය උපාධි පත්වීම්, පළාත් රාජ්‍ය සේවයෙන් ජාතික පාසල් සේවයට අනුයුක්ත කිරීම හා ස්ථාන මාරු වීම් මඟින් ජූලි මාසය වන විට මෙම කාර්යය ඉටු කිරීමට අපේක්ෂා කෙරේ.

(ඇ) අදාළ නොවේ.

---

***** *ප්‍රස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, අවස්ථා 3ක් කල් ගිහිල්ලා 4 වන අවස්ථාවේදී හෝ එම ප්‍රශ්නයට අංග සම්පූර්ණ පිළිතුරක් දීම පිළිබඳව අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයටත් මම ස්තුතිවන්ත වෙනවා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. 1989 වසරෙන් පසුව පළාත් සභා පාසල්වලට ගුරු පත්වීම් ලැබූ ගුරුවරුන්ට ජාතික පාසල් සඳහා ස්ථාන මාරු වීම් ලබා ගැනීමට බාධා වන ආකාරයේ චක්‍රලේඛයක් පවතිනවා. ඒ චක්‍රලේඛය නිසා බොහෝ පළාත් සභා පාසල්වල ඉන්න ගුරු භවතුන්ට, පුරප්පාඩු තිබුණත් ජාතික පාසල්වලට එන්න බැරිකමක් තිබෙනවා. ඒ නිසා ඒ චක්‍රලේඛය පිළිබඳව යළි සලකා බලන ලෙසට මා අමාත්‍යාංශයේ අවධානය යොමු කරනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ විශාල ප්‍රමාණයක් තිබෙනවා. එම චක්‍රලේඛ ඔබටත්, මටත් අවශ්‍ය විධියට නොවෙයි සකස් වෙන්නේ. මේ රටේ අධ්‍යාපන සේවාව සෘජුවම අපේ දරුවන්ට ලබා දීමේ පරමාර්ථය පෙරදැරි කර ගෙන යම් යම් ආරක්ෂක විධිවිධාන ඇති කිරීම සඳහා තමයි ඒ චක්‍රලේඛ නිකුත් කර තිබෙන්නේ. අදාළ කාලයේදී අපි ඒ මණ්ඩල මඟින් යම්කිසි සලකා බැලීමක් කරනවා. ඔබතුමා ඉල්ලීමක් කරනවා නම් එය කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේකත් ගුරුවරුන්ටම අදාළ කාරණයක්. මේක සෘජුවම මේ ප්‍රශ්නයට සම්බන්ධ වන්නේ නැහැ. නමුත් මා හිතනවා, මේකට සාධාරණ අවසරයක් ලැබේවිය කියලා.

ඔක්තෝබර් 6වන දාට යෙදෙන ලෝක ගුරු දිනය වෙනුවෙන් ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කර ඉදිරිපත් කරන්නට බලාපොරොත්තුවක් තිබෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ගුරු සේවා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මේ රටේ සියලුම වෘත්තීය සමිති කැඳවා සාකච්ඡා කර ඒ අයගේ අනුමැතිය, ආශිර්වාදය ඇතිව ඒ අයගේ අදහස්, යෝජනා අප දැනට අර ගෙන තිබෙනවා. ඒ අනුව ගුරු සේවා ව්‍යවස්ථාව ඉතා ඉක්මනින් සංශෝධනය කිරීමේ බලාපොරොත්තුවෙන් අප කටයුතු කර ගෙන යනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. ජාතික පාසල්වලට රේඛීය අමාත්‍යාංශය මඟින් යවනු ලබන සමහර කාරණාවලට අදාළ මුදල් ඇතැම් කලාප කාර්යාලවලදී අදාළ පාසල්වලට නොදී වෙනත් කාරණා සඳහා යෙදවීම පිළිබඳව සාක්ෂි ඇතිව ඔප්පු කළ හැකි අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට කොන්ත්‍රාත්කරුවන්ට ඉදිකිරීම්වලට අදාළ මුදල් ගෙවීම සඳහාත් මේ මුදල් පාවිච්චි කළ අවස්ථා තිබෙනවා. කරුණාකර මේ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර සොයා බලා ජාතික පාසල් සඳහා යවන මුදල් ජාතික පාසල්වලටම යවන්නට පුළුවන් වැඩ පිළිවෙළ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරනවාද? මොකද, ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව සැහෙන කාලයකින් තියලාම නැහැ වාගෙයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ඌව පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍යවරයා -අධ්‍යාපන අමාත්‍යවරයා- හැටියට මටත් ඒ පිළිබඳව අත් දැකීම් තිබෙනවා. මම දන්නවා, එවැනි කාරණා සිද්ධ වන්නට ඉඩ තිබෙනවා කියන එක. එවැනි කාරණා සිද්ධ නොවීම සඳහා අවශ්‍ය කටයුතු අප යොදනවා.

## ජනාධිපති අරමුදල: වෙන් කරන ලද මුදල
### சனாதிபதி நிதியம்: நிதி ஒதுக்கீடு
### PRESIDENT'S FUND: MONEY ALLOCATED

1215/'11

4. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ජනාධිපති අරමුදලට මුදල් ආධාර ලැබෙන ආකාරය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2008, 2009 සහ 2010 වර්ෂයන්හිදී, වෙන් වෙන් වශයෙන්,

(i) ජනාධිපති අරමුදලට වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එම අරමුදලින් ලබා දුන් ආධාරවල එකතුව කොපමණද;

(iii) ජනාධිපති අරමුදලින් ආධාර ලබා දෙන ක්ෂේත්‍ර හා එක් එක් ක්ෂේත්‍රය වෙනුවෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(iv) ආධාර ලබා දුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) சனாதிபதி நிதியத்துக்கு எவ்வாறு நிதி உதவிகள் கிடைக்கின்றன என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2008, 2009 மற்றும் 2010 ஆம் ஆண்டுகளில்,

(i) சனாதிபதி நிதியத்துக்கு ஒதுக்கப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(ii) அந்த நிதியத்தினால் வழங்கப்பட்ட மொத்த நிதி உதவி எவ்வளவென்பதையும்;

(iii) சனாதிபதி நிதியத்தினால் உதவிகள் வழங்கப்படும் துறைகள் மற்றும் ஒவ்வொரு துறைக்காக வழங்கப்பட்ட பணத்தொகை யாதென்பதையும்;

(iv) நிதி உதவிகள் வழங்கப்பட்டவர்களின் பெயர்கள் யாவையென்பதையும்

வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs :

(a) Will he inform this House of the ways in which the President's Fund receives financial aid ?

(b) Will he state, separately with reference to years 2008, 2009 and 2010-

(i) the money allocated for the President's Fund ;

(ii) the total value of the financial assistance provided by the President's Fund;

(iii) the areas of activity for which financial assistance is provided by the President's Fund and the amounts granted for each such area of activity ; and

(iv) the names of the recipients of such assistance?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

1. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ටිකට් පත් අලෙවියෙන් ලැබෙන ආදායම.

2. ජනාධිපති අරමුදලේ ස්ථාවර තැන්පතුවලින් ලැබෙන පොලිය.

3. විවිධ පාර්ශ්වයන් විසින් කරනු ලබන මුදල් පරිත්‍යාග.

(ආ) (i) අදාළ නොවේ.

(ii) 2008 වර්ෂයේදී ලබා දුන් මූල්‍යාධාර මුදල රුපියල් මිලියන 884.3යි.

2009 වර්ෂයේදී ලබා දුන් මූල්‍යාධාර මුදල රුපියල් මිලියන 1,028.3යි.

2010 වර්ෂයේදී ලබා දුන් මූල්‍යාධාර මුදල රුපියල් මිලියන 845.2යි.

(iii)

| **වර්ෂය** | **වෛද්‍යාධාර රුපියල් මිලියන** | **ජනාධිපති ශිෂ්‍යත්ව රුපියල් මිලියන** | **සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා සමාජ සුභසාධන කටයුතු සඳහා රුපියල් මිලියන** |
|---|---|---|---|
| 2008 | 855.9 | 9.7 | 8.7 |
| 2009 | 919.5 | 101.7 | 7.1 |
| 2010 | 839.5 | 4.0 | 1.7 |

(iv) ඇමුණුම් වල දැක්වේ. ඇමුණුම් **සභාගත*** කරමි.
ඇමුණුම් අංක I - 2008 වසර
ඇමුණුම් අංක II - 2009 වසර
ඇමුණුම් අංක III - 2010 වසර

(ඇ) අදාළ නොවේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට ප්‍රමාදයකින් තොරව පිළිතුරු ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ජනාධිපති අරමුදලින් අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ කටයුතුවලදී විශේෂයෙන්ම දුක්ගැනවිලි හැටියට බොහෝ ජනතාවගෙන් ඉදිරිපත් වන දෙයක් තමයි හදවත් රෝග සම්බන්ධයෙන් bypass සැත්කම් වැනි දේවල්වලට ජනාධිපති අරමුදලින් මුදල් ලබා ගැනීම පිළිබඳව. ක්‍රීඩා ක්ෂේත්‍රය හා අනෙකුත් දේවල්වලට වඩා මහජන නියෝජිතයන් හැටියට අපට එන ප්‍රධාන දුක්ගැනවිල්ලක් තමයි මෙන්න මේ කාරණාව.

එහිදී මොන මට්ටමේ රෝගීන්ටද ඒ ප්‍රතිකාරවලට මුදල් ලබා දෙන්නේ කියන එක මගේ ප්‍රශ්නය ඇසීමේ එක අරමුණකුත් වුණා. ඔබතුමාගේ සභාගත කළ දීර්ඝ පිළිතුරේ ඒ සම්බන්ධව ඇති කියා මා විශ්වාස කරනවා. හදවත් රෝගීන්ගේ ස්වභාවය, ඒ කියන්නේ මොන මට්ටමේදීද ඒක ලබා දෙන්නේ කියන එක ප්‍රසිද්ධ කිරීමක් වෙන්නේ නැහැ. එහෙම ප්‍රසිද්ධ කිරීමක් කර තිබෙනවාද කියලා දැන ගන්නට අවශ්‍යයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විස්තරාත්මකව තිබෙනවා. අනෙක් කාරණය තමයි ජනාධිපති අරමුදලේ කමිටුවක් තිබෙනවා. ඒ කමිටුවේ ආණ්ඩු පක්ෂයේ අය, විපක්ෂ නායකතුමා ඇතුළු සියලු දෙනා කටයුතු කරනවා. ඒ අනුව යම් කිසි ප්‍රතිපත්ති මාලාවක්, අනුගමනය කළ යුතු කාර්ය පිළිවෙතක් සකස් කරලා තිබෙනවා. හෘදය සාක්ෂියේ- මට වැරදිලා සාක්ෂිය කියලා කියවුණා. මොකද, මම ජනතා විමුක්ති පෙරමුණ ගැන හිතමින් කථා කළේ. ඔබතුමා දැන් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ ජනතා විමුක්ති පෙරමුණෙන් නොවන නිසා මම ඒක කීම අසාධාරණයි. ඔබතුමා ඉන්නේ වෙනත් පක්ෂයක. හෘදය සැත්කම් පිළිබඳව වෛද්‍යවරු අලුතෙන් එක් එක් දේවල් සොයා ගනිමින්, ඒ පිළිබඳව අලුතින් ප්‍රතිකර්මයන් යෝජනා කරමින් සිටින බව ගරු මන්ත්‍රීතුමා ඇතුළු අප කවුරුත් දන්නවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මා හිතන්නේ ඔබතුමාට හෘදය සාක්ෂියයි, හදවත් සැත්කමයි අතර වෙනස තේරෙනවා කියලායි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හොඳට තේරෙනවා.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම හරිම කනගාටුවෙන් ඊයේ විද්‍යුත් ජන මාධ්‍ය දිහා බලා ගෙන හිටියා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒවා ගණන් ගන්න එපා.

ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේක ජනාධිපති අරමුදල සම්බන්ධ ප්‍රශ්නයක් වුණත් රටට වැදගත් නිසායි මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ. ජනාධිපති ලේකම්වරු සහ ජනාධිපති උපදේශකවරු හැටියට බොරුවට පෙනී සිටින අය බොරු හැඳුනුම්පත් මඟින් පෙනී සිටලා විවිධ අකටයුතුකම්වලට සම්බන්ධ වෙලා අහු වෙනවා කියලා හුඟක් මාධ්‍යවල වාර්තා වෙනවා. මේක ප්‍රශ්නයට සෘජුව අදාළ නොවුණත්, ඇත්තටම ජනාධිපති අරමුදලේ ඉන්න අය, ජනාධිපති උපදේශකවරු, ජනාධිපති ලේකම්වරු හැටියට කටයුතු කරන අය කවුද කියලා රටට ප්‍රසිද්ධ කරන්න.

ඒක මාධ්‍ය මඟින් හෝ රටට ප්‍රසිද්ධ කරන ක්‍රියාවලියක් හදන්න. මේ මේ විෂයයන් භාරව ඉන්නේ මෙන්න මේ අයයි කියලා ප්‍රසිද්ධ කරන්න. අපි දන්නවා ජනාධිපතිතුමා තනි පුද්ගලයකු වුණත් අමාත්‍යාංශ විශාල ප්‍රමාණයක් එතුමා යටතේ තිබෙන නිසා එවැනි විවිධ ලේකම්වරු ඉන්න බව. රට ඒ අය ගැන දන්නේ නැහැ. ඒ නිසා බොරු identity cards හදා ගත්ත අයත් ඉන්නවා. ඒ තත්ත්වය රටට පැහැදිලි කරන්න පියවරක් ගන්නවාද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජනාධිපති අරමුදලේ කටයුතු කරන සියලු දෙනා කවුද කියන එක ප්‍රසිද්ධයි. ඒක අප්‍රසිද්ධියේ කෙරෙන දෙයක් නොවෙයි, ගරු කථානායකතුමනි. ගරු මන්ත්‍රීතුමාට වැඩි විස්තර ඕනෑ නම් උපදේශක කාරක සභාවේ දී දෙන්න පුළුවන්. කවුරුවත් අප්‍රසිද්ධියේ කටයුතු කරන්නේ නැහැ. ජනාධිපති අරමුදල, President's Fund Act, No. 7 of 1978 කියලා ඉතා පැහැදිලිව පාර්ලිමේන්තුවේ සම්මත කරලා තිබෙනවා. ඒ පිළිවෙත අනුව තමයි කටයුතු කරන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 - 0812/'10 - (2), ගරු බුද්ධික පතිරණ මහතා

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය ඒ අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මම ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

## විල්පත්තු අභය භූමිය: වැලි ගොඩදැමීම
## வில்பத்து சரணாலயம்: மணல் அகழ்வு
## WILPATTU SANCTUARY: SAND MINING

0984/'10

10. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගොවිජන සේවා හා වන ජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) විල්පත්තු අභය භූමිය තුළ වැලි ගොඩ දැමීමක් සිදුවී තිබේද;
(ii) එසේ නම්, ඒ සඳහා ලබා දී ඇති අවසර පත්‍රය ඉදිරිපත් කරන්නේද;
(iii) එම බලපත්‍රය ලබා දුන් බලධාරියා කවරුන්ද;
(iv) එම බලපත්‍රය මඟින් වැලි ඉවත් කිරීමට අවසර ලැබී ඇති පුද්ගලයා හෝ පුද්ගලයන් කවරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අභය භූමියෙන් මේ වන විට ඉවත් කර ඇති වැලි ප්‍රමාණය කොපමණද;
(ii) එම වැලි කවර කටයුත්තක් සඳහා රැගෙන යනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வில்பத்து சரணாலயத்தில் மணல் அகழ்வு இடம் பெற்றுள்ளதா என்பதையும்;
(ii) அவ்வாறெனின் வழங்கப்பட்டுள்ள அனுமதிப்பத் திரத்தை சமர்ப்பிப்பாரா என்பதையும்;
(iii) அந்த உரிமப் பத்திரத்தை வழங்கிய அதிகாரி யார் என்பதையும்;
(iv) அந்த உரிமப் பத்திரம்மூலம் மணல் அகழ்வதற்கு அனுமதி பெற்றுள்ள நபர் அல்லது நபர்கள் யார் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அந்த சரணாலயத்திலிருந்து இதுவரை அகற்றப் பட்டுள்ள மணலின் அளவு எவ்வளவு என்பதையும்;
(ii) அந்த மணல் எந்தப் பணிகளுக்காக எடுத்துச் செல்லப்படுகின்றது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agrarian Services and Wildlife:

(a) Will he inform this House-
(i) whether sand mining has taken place in the Wilpattu Sanctuary ;
(ii) if so, whether he will submit the permit granted for this purpose;
(iii) the authority which granted the aforesaid permit; and
(iv) the person or persons who have been authorized by the aforesaid permit to engage in sand mining ?

(b) Will he state -

(i) the quantity of sand removed from the aforesaid sanctuary by now; and

(ii) the purpose for which the sand is taken away?

(c) If not, why ?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

(අ) (i) ඔව්.

(ii) මෝදර ගං ආරු ගංගාවේ මෝය කට ආසන්නව අධික ලෙස වැලි තැන්පත් වී ඇත. පැවැති අධික වර්ෂාව හේතුවෙන් ගඟ පිටාර ගැලීමෙන් උද්‍යානයට හානි වීම වැළැක්වීම සඳහා ජල මට්ටම පාලනය කිරීමට අවශ්‍යව තිබුණි. ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා නාවික හමුදාව සාකච්ඡා කර ගං වතුර තත්ත්වය වැළැක්වීම සඳහා ක්‍රියා මාර්ගයක් වශයෙන් එම අතිරේක වැලි තිඩි නාවික හමුදාවෙහි සහාය ලබා ගෙන ඉවත් කරන ලදී.

(iii) අදාළ නැත.

(iv) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉවත් කරන ලදී.

(ආ) (i) ගං වතුර ඇති වීමට බලපාන වැලි ප්‍රමාණය ඉවත් කර ඇත.

(ii) අදාළ නැත.

(ඇ) අදාළ නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මෝදර ගං ආරු ඔයෙන් වැලි කියුබ් 15,000ක් ගොඩ දාලා තිබෙනවා. වන ජීවී නිලධාරින් ඒවා අල්ලා ගෙන තිබෙනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
15,000ක් කියලා තමුන්නාන්සේ කොහොමද ඒක ගණන් කළේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම තොරතුරු ඇතිව කියන්නේ. වන ජීවී නිලධාරින් මෙය වැටලුවා. මේක නාවික හමුදාව කරපිට ගහන්න හදන්න එපා. මේක වෙනත් විධියකට කරන ජාවාරමක්.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ සිද්ධියට අදාළ නිලධාරින් ගණනාවක් දැන් මාරු කරලා තිබෙනවා. ඉතින් මම ඔබතුමාගෙන් අහන්නේ -

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නිලධාරින් කවුරුවත් මාරු කරලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ වැලි ගොඩ දමන්න භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ බලපත්‍රය කවදාද දුන්නේ කියලා කරුණාකරලා ඔබතුමා කිව්වොත් මට ලේසියි. ගරු කථානායකතුමනි, මේ වැලි ගොඩ දැමීමට කිසිම බලපත්‍රයක් අරගෙන තිබුණේ නැහැ. බලපත්‍රයක් අරගෙන ඒක කරන්න තිබුණා. මම ඒකයි කියන්නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ ඔය කියන 15,000 ගැන නම් කොහේවත් ගණන් හිලවු නැහැ. මෝදර ගං ආරු ඔය පිටාර ගලලා, වැලි විශාල ප්‍රමාණයක් හිර වෙලා තිබුණා.

ඒ හේතුවෙන් විල්පත්තු අභය භූමියට වතුර ගලන්න යෙදුණ නිසා, නාවික හමුදාව තමයි මේ වැලි ඉවත් කළේ. ඒ වාගේම නාවික හමුදාව තමයි මේ වැලි ප්‍රයෝජනයටත් ගත්තේ. නාවික හමුදාවේ ඉදිකිරීම්වලටයි මේ වැලි ගත්තේ. වෙන කොහේවත් ප්‍රයෝජනයට අරගෙන නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කොහේ ඉදිකිරීම්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නාවික හමුදාවේ ගොඩනැඟිලි ඉදි කරන්න. එක තැනක නොවෙයි කිහිප තැනක. නාවික හමුදාව මේ වැලි ගොඩ දැම්මේ. වෙන කවුරුවත් නොවෙයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා එහෙම කියන නිසා මම ඒ ගැන වැඩිය හාරා අවුස්සන්න යන්නේ නැහැ. මම හිතන හැටියට අදාළ නිලධාරිනුත් මාරු කළා මේ ප්‍රශ්නය නිසා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
කිසිම නිලධාරියෙක් මාරු කරලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක වැටලීමක් කළා. මම ඒකයි ඔබතුමාට කියන්නේ. හොඳයි, කමක් නැහැ.

මම දෙවැනි අතුරු ප්‍රශ්නයට යන්නම්.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, නැහැ. තමුන්නාන්සේට වැරදි තොරතුරක් දීලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම වැරදි තොරතුරු මත ප්‍රශ්න අහන්නේ නැහැ. හරියට තොරතුරු තියා ගෙන තමයි මම ප්‍රශ්න ටික ඇහුවේ. වනජීවී අධ්‍යක්ෂවරයාවත් ඔබතුමන්ලා මාරු කළේ ඒකට. හොඳයි, කමක් නැහැ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි, කමක් නැහැ. අපි දෙවැනි අතුරු ප්‍රශ්නයට යමු.

දැන් විල්පත්තු උතුරු අභය භූමිය මැදින් පාරක් හදලා තිබෙනවා, තලෙයිමන්නාරම පාර තියෙද්දී. ඇත්තටම මේ විල්පත්තුව අභය භූමියක් විධියට තිබෙන එකක්. ඒක බෙදා වෙන් කිරීමේ වැඩ පිළිවෙළක් විධියට තමයි විශේෂයෙන්ම පරිසරවේදියෝ මේ පාර සම්බන්ධව කථා කරන්නේ. ඒ වාගේම දැන් මේ වන කොට විල්පත්තු උතුරු අභය භූමියේ ප්‍රේරක කලාපයේ පැල්පත් දහස් ගණනක් ඉදි කර ගෙන තිබෙනවා. ඒ පැල්පත්වල පින්තූර මගේ ළඟ තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් පෙන්වන්න පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. පැල්පත් ඉදි කර ගෙන තිබෙනවා. ඇත්තටම- [බාධා කිරීමක්]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔබතුමා දැක්කාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, ඔව්. මේ, photos ඔක්කෝම තිබෙනවා. මුස්ලිම් අමාත්‍යවරයෙකුගේ මැදිහත් වීමෙන් දහස් ගණනක් පැල්පත් එතැන හදලා තිබෙනවා. ඉතින් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි-

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
කොහේද තිබෙන්නේ? මම මේ ළඟදී ගියා. [බාධා කිරීමක්] මම ඔය මුහුදු තීරයේම ගියා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට මේ, photos ටිකත් එක්කම මම දෙන්නම්. [බාධා කිරීමක්]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඕවා වෙන කොහේ හරි photosද දන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා අහන එකට පිළිතුරු දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අහන්න දෙන්නේ නැහැ නේ, ගරු කථානායකතුමනි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔබතුමා කිව්වා නේ, පාර කැපුවා කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
පාර කපපු එකට-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉන්න, මම මේක අහලාම ඉවර කරන්නම්. එකක් පාර කැපීම සම්බන්ධව. ඒ එක්කම දහස් ගණනක් ජනතාව ඇවිල්ලා මේ අභය භූමියේ අනවසර ලෙස පදිංචි වීම ඇත්ත වශයෙන්ම 2009 වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 56 සමඟ කියවිය යුතු, 20වැනි වගන්තිය උල්ලංඝනය කිරීමක්. ඒකේ තිබෙනවා මේ අභය භූමි ශුද්ධ කිරීම, ඒවායේ පදිංචි වීම සහ ඒ සම්බන්ධව කිසිම දෙයක් කරන්න බැහැයි කියලා. මම අමාත්‍යතුමා විධියට ඔබතුමාගෙන් අහන්නේ, මේ පැල්පත්වාසීන් ඉවත් කරලා ඔවුන්ට වෙනත් ස්ථානයක් හදලා දීලා මේ අභය භූමිය බේරා ගැනීම සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඔබතුමා බලාපොරොත්තු වෙනවාද කියලායි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අපි අභය භූමිය බේරා ගෙන ඉවරයි. ඒකේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන් තමයි වැඩිපුර සිටියේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බේරා ගත්ත එක දැන් දීග යනවා. ඒකයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒක අප එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් බේරා ගත්තා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක දැන් තව ත්‍රස්තවාදීන් කණ්ඩායමකට දෙන්න යන්නේ. ඒක නේ, වැඩේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, කිසිම ත්‍රස්තවාදියෙක් නැහැ. මම මේ ළඟදී ගියා. විල්පත්තුව හැම තැනම ගිහිල්ලා- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අප ඔබතුමාට ඉතාම වග කීමෙන් මේ කියන්නේ. ඔබතුමා අලි ගණින්න ගිහිල්ලා කර ගත්ත අලකලංචිය නේ ඒ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමනි, පාර ගැන උත්තරයක් මෙතැන දෙන්න බැහැ, ඒක අධිකරණයේ සාකච්ඡාවට භාජනය වෙලා තිබෙන කාරණයක් නිසා. ඒකට අධිකරණයෙන් තීන්දුවක් දෙයි. පරිසර සංවිධාන උසාවි ගිහිල්ලා තිබෙනවා.

ඊ ළඟට තමුන්නාන්සේ කියන ඔය පැල්පත් 1,000 අනිවාර්යයෙන්ම- [බාධා කිරීමක්] මේ ළඟදී මම ගියා.

විල්පත්තුව ජාතික වනෝද්‍යානයේවත් එහෙම නැත්නම් ජේ්‍රක කලාපයේවත් තිබෙන පැල්පත් නොවෙයි. වෙන කොහේ හරි තිබෙන ඒවා තමයි තමුන්නාන්සේ photo ගහගෙන ඇවිල්ලා පෙන්වන්නේ. [බාධා කිරීම්] මම ගියා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. පැල්පත් නැති ලු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා එහෙම කථා කරන එක හරිම කැතයි. මොකද, අපට වටේ ගිහිල්ලා photo ගහගෙන ඇවිල්ලා පෙන්වන්න ඕනෑ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තවත් ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා ඒක පිළිගන්නේ නැත්නම් පුදුම වැඩක් නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අපට ආරංචි වෙලා තිබෙන්නේ, කොළඹ නගර සභාවට තමුන්නාන්සේලා ගහලා තිබෙන photo ටිකක් ගෙනැල්ලා පෙන්නුවාය කියලායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මාර කථාවක් නේ කියන්නේ. කොළඹ නගර සභාවේ පැල්පත් ලු ගහලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේවාට හිනා යනවා. කමක් නැහැ, මම තුන්වැනි අතුරු ප්‍රශ්නයත් අහනවා. ගරු අමාත්‍යතුමා, ඔබතුමාගේ අමාත්‍යාංශයට වී වගාවත් සම්බන්ධ නිසායි මම මේ අහන්නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වී වගාව.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්. වී වගාව මගේ අමාත්‍යාංශයට සම්බන්ධයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නිසායි මම මේක ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔබතුමා මගෙන් අහන්නේ වන ජීවී ප්‍රශ්නයක් නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පසු ගිය 20 වැනි දා පොළොන්නරුව දිස්ත්‍රික් කමිටුවේ-

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
දැන් ඕක වනජීවී ද ගොවිජන සේවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් විල්පත්තුවේ වී වගා කරලාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විල්පත්තුවේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමනි, විල්පත්තුවේ වී වගා කරන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකේදී සාකච්ඡාවට බඳුන් වෙලා තිබෙනවා-

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
විල්පත්තුවේ වී වගා කරන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම මේ කියන්නේ. ඒකේදී සාකච්ඡාවට බඳුන් වෙලා තිබෙනවා- [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අහගන්නේ නැහැ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොළොන්නරුවේ කුඹුරුවල තණ කොළ වැවීමට යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
තණ කොළ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොළොන්නරුවේ කුඹුරුවල තණ කොළ වැවීමට යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
දැන් තණ කොළ වවන්න වෙනවා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙට්‍රික් ටොන් විශාල ප්‍රමාණයක වී අස්වැන්නක් දෙන තැනක තමයි ඔබතුමන්ලා තණ කොළ වගා කරන්න හදන්නේ. මේකට ඔබතුමා කැමතිද, අකැමතිද කියලා කියන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න ඇසීමේ ක්‍රමයක් තිබෙනවා. සභාව විහිළුවට ලක් නොකර කරුණාකරලා-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විහිළුවකට ලක් කරනවා නොවෙයි, ගරු කථානායකතුමනි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, පොළොන්නරුවේ කුඹුරුවල වී-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පොළොන්නරුවට ගියේ නැහැ තවම, විල්පත්තුවේයි ඉන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විල්පත්තුවෙන් පොඩ්ඩක් පල්ලෙහාට ආවා. කොළඹට එන්න පුළුවන් නම්, විල්පත්තුවේ පැල්පත් ගැන කියන කොට කොළඹ ගැන කථා කරන්න පුළුවන් නම්- [බාධා කිරීමක්]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අපි සිරිකොතේ ඉන්න අයටයි තණ කොළ වවන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තණ කොළ වවලා කන්න වෙන්නේ තමුන්නාන්සේලාටයි. [බාධා කිරීම්]

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල: පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சு

### MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011 : MINISTRY OF REHABILITATION AND PRISON REFORMS

1217/'11

11. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்களினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத்துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின்கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he state the total amount of money spent by the Ministry of Rehabilitation and Prison Reforms on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments;and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above-mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව් - රු. 2,827,664.99කි.

(ආ) (i)

| ආයතනය | මුදල (රු.) |
|---|---|
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 483,650.00 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 1,040,000.00 |
| ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | 188,313.00 |
| තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය ජනරාල් කාර්යාංශය | 526,334.99 |
| පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය | 589,367.00 |
| **මුළු මුදල** | **2,827,664.99** |

(ii) **පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

මෙම අමාත්‍යාංශය අලුතින් පිහිටුවන ලද අමාත්‍යාංශයක් වන අතර මේ යටතේ දෙපාර්තමේන්තු ආයතන 04ක් ඇති බැවින් ඒ අනුව අමාත්‍යාංශයේ අරමුණු හා කාර්ය භාරය ආදිය සම්බන්ධයෙන්ද ජනතාව දැනුවත් කිරීමට හැකි වන පරිදි මුද්‍රිත පත්‍රිකා හා ප්‍රදර්ශන කවුළු මඟින් තොරතුරු ඉදිරිපත් කරන ලදී.

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් වැලිකඩ බන්ධනාගරයේ ආදර්ශ ආකෘතියකට අනුව සකස් කරන ලද ප්‍රදර්ශන කුටියක් නිර්මාණය කර එහි පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතනවලට තම කාර්ය භාරයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ඉඩ කඩ පහසුකම් ලබා දීම සිදු කෙරිණි. එසේම බන්ධනාගාර රැඳවියන් විසින් පවත්වාගෙන යන ලද ආපන ශාලාවක් මඟින් ප්‍රදර්ශන භූමිය නැරඹීමට පැමිණි අය වෙනුවෙන් ආහාර සැපයීමද සිදු කරන අතර ඒ මඟින් ආදායමක් ලබා ගන්නා ලදී.

මීට අමතරව බන්ධනාගාර කර්මාන්ත හා කෘෂි කාර්මාන්ත අංශය මඟින් රැඳෙවියන්ගේ නිෂ්පාදන ඇතුළත් අළෙවි කුටි පවත්වාගෙන යන ලදී.

එසේම බන්ධනාගාර ප්‍රදර්ශන කුටියේ මහජනතාවගේ දැනගැනීම හා පාසල් ළමුන් සඳහා පැරණි දඬුවම් ක්‍රම ඇතුළත් ආකෘතීන් ප්‍රදර්ශනය කරන ලද අතර ඒ අතුරින් එල්ලුම්ගසේ ආකෘතිය විශාල ආකර්ෂණීය අංගයක් විය.

**ප්‍රජා පාදක විශෝධන පෙදාර්තමේන්තුව**

මේ යටතේ බන්ධනාගාර ගත වීම වෙනුවට ප්‍රජා විශෝධන ආඥා ලබා ගැනීමේ වැදගත් ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ කෙටි චිත්‍රපටයක්

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ප්‍රදර්ශනය කිරීම ද අත් පත්‍රිකා මඟින් ජනතාව දැනුවත් කිරීමද සිදු කෙරිණි.

**තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය**

පුනරුත්ථාපන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ණය වැඩසටහන් හා ආධාර වැඩ සටහන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටද අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටිය යටතේ අමාත්‍යාංශය සම්බන්ධ කාර්ය භාරය සම්බන්ධ අත් ප්‍රතිකා මඟින් ජනතාව දැනුවත් කිරීමේ පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක විණි.

**පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය**

මෙම කාර්යාංශය යටතේ පුනරුත්ථාපනය වන අභ්‍යාසලාභීන් සම්බන්ධව තරුණ වරදකරුවන් ගේ අත්කම් නිර්මාණ සහිත ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යන ලදී.

(iii) **පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

| | |
|---|---|
| ප්‍රදර්ශන කුටිය සඳහා | 390,000.00 |
| නවාතැන්, ගමන් වියදම් හා ආහාර සඳහා | 57,331.00 |
| ඉන්ධන වියදම් සඳහා | 36,319.00 |
| **එකතුව** | **483,650.00** |

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

| | |
|---|---|
| ප්‍රදර්ශන කුටිය සඳහා | 1,040,000.00 |
| **එකතුව** | **1,040,000.00** |

**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

| | |
|---|---|
| ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම සඳහා | 108,846.00 |
| ආහාර නවාතැන් හා යැපීම් දීමනා සඳහා | 79,467.00 |
| **එකතුව** | **188,313.00** |

**තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය**

| | |
|---|---|
| ප්‍රදර්ශන කුටිය සඳහා | 390,000.00 |
| ඉන්ධන වියදම් සඳහා | 32,520.00 |
| අතිකාල හා ගමන් වියදම් | 103,814.99 |
| **එකතුව** | **526,334.99** |

**පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය**

| | |
|---|---|
| ප්‍රදර්ශන කුටිය සඳහා | 390,000.00 |
| නවාතැන් හා ආහාර වියදම් | 199,367.00 |
| **එකතුව** | **589,367.00** |

(ඇ) අමාත්‍යාංශ වැය ශීර්ෂ 174

(ඈ) අදාළ නොවේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ඇත්තටම අනෙකුත් අමාත්‍යාංශවල කාර්ය භාරය, කර්තව්‍ය ගැන පැහැදිලි කරන්න මුදල් වියදම් කරන එක හරි. නමුත්, අපි දන්නවා බන්ධනාගාරවල දුෂ්කරතා ගොඩක් තිබෙන බව. අපේ ගරු විජිත් විජයමුණි ද සොයිසා නියෝජ්‍ය ඇමතිතුමා මීට පෙර බන්ධනාගාර කටයුතු භාරව හිටියා. බොහොම මැදිහත් වුණා. එතකොට එතරම් දුෂ්කරතා තිබියදී, රුපියල් විසිඅටලක්ෂයක් මේ දැයට කිරුළ වැඩසටහනකට වියදම් කිරීම සාධාරණද කියන ප්‍රශ්නය මා අහනවා. ඔබතුමන්ලාට දැනෙන ප්‍රමාණයෙන් වුණත් ඒක තේරුම් ගන්න පුළුවන්, වෙනත් කටයුත්තකට වඩා.

මොකද, වෙනත් අමාත්‍යාංශ promote කරන්නේ ඒ අයගේ ප්‍රදර්ශන කුටිවලින් ආකර්ෂණය ඇති කරන්නයි. බන්ධනාගාරයට එන්න කියලා ආකර්ෂණය ඇති කරන්න promote කිරීමක් කරන්නේ නැහැ නේ. ඒ නිසා මේ මුදල සාධාරණද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. මේ තරම් මුදලක්?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මේ මුදල වැය කර තිබෙන්නේ දෙපාර්තමේන්තු හයක් සම්බන්ධවයි. ගරු කථානායකතුමනි, එය පැහැදිලි කර දුන්නා. එතැනට දවසකට ආපු ලක්ෂ හතරහමාරක් පමණ වූ අයට ආහාර සැපයීම, සුභසාධන කටයුතු කිරීම, සේවා පහසුකම් සැපයීම මේ මඟින් කළ බවත් කිව්වා. කෑම දුන්නා. ඒ, සිරකරුවන්ට එකතු වෙලා කළ හැකි කටයුතු හැටියට. ඒ වාගේම ඔබතුමන්ලා දැකපු නැති නිසා එල්ලුම් ගසේ ආකෘතියකුත් පෙන්නුම් කළා. මොකද, ඒක තමයි සාමාන්‍යයෙන් ඒ කාලයේ මරණීය දණ්ඩනය දීමේ පිළිවෙත. ඉතින් එයත් ප්‍රදර්ශනය කළා. එහෙම කරන්න එපාද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

රාජ්‍ය දේපළ හොරකම් කරපු ජාතියේ කට්ටියටත් ඒ එල්ලුම් ගස පෙන්නුවාද? [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔව්, රාජ්‍ය දේපළ-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

රාජ්‍ය දේපළ ගිනි තියපු අයට.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

බොහොම ස්තුතියි. [බාධා කිරීම්] ඔක්කෝම උත්තර කියනවා නේ. එහෙම කියන්න අරින්න. හැමෝටම උත්තර කියන්න අරින්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඇති නේද? අද වඩා හොඳයි ඔබතුමා ඉඳ ගන්නා එක.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13-1271/'11-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා හිතන හැටියට මුදල් අමාත්‍යාංශය තමයි දැයට කිරුළ වැඩසටහන සම්පූර්ණයෙන්ම කළමනාකරණය කළේ. අනෙකුත් අමාත්‍යාංශවලට පිළිතුරු ලබා දෙන්න පුළුවන්කම තිබුණා නම් 2011 දැයට කිරුළ වැඩසටහන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයට උත්තර දෙන්න ප්‍රමාදයක් ඇති වන්නේ ඇයි කියන ප්‍රශ්නය මම අහනවා. ඇත්තටම ඒක සාධාරණ නැහැ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, ආයතන 44ක් තිබෙනවා. අමාත්‍යාංශයේ සහභාගි වූ අංශ 20ක් තිබෙනවා. 20කින් තොරතුරු ලැබිලා තිබෙනවා. තවත් 24කින් තොරතුරු ලබා ගන්නට නියමිතයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම නම් සැහෙන ලොකු ගණනක් ඇති.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## බෙරගල ප්‍රජා ජල ව්‍යාපෘතිය: ඉදි කිරීම් කටයුතු
## பெரகல சமூக நீர் வழங்கல் கருத்திட்டம்: நிர்மாணப் பணிகள்
## COMMUNITY WATER PROJECT BERAGALA : CONSTRUCTION WORK

1275/'11

14. **ගරු බුද්ධික පතිරණ මහතා**
( மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, බෙරගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ප්‍රජා ජල ව්‍යාපෘතියේ වැඩ අතර මග නතර කිරීම නිසා ප්‍රදේශයේ ජනතාව අපහසුතාවට පත්ව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ප්‍රජා ජල ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා අරමුදල් සපයනු ලබන ආයතනය කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය නවතා දැමීමට හේතු කවරේද;

(iv) එහි ඉදි කිරීම් සම්බන්ධයෙන් පවතින බාධා කඩිනමින් ඉවත් කොට ඉදි කිරීම් නැවත අරඹා ජනතාවගේ ජල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) பதுளை மாவட்டத்தின் ஹல்துமுல்ல பிரதேச செயலகப் பிரிவைச் சேர்ந்த பெரகல கிராம உத்தியோகத்தர் பிரிவில் அமைந்துள்ள சமூக நீர் வழங்கல் கருத்திட்டத்தின் வேலைகள் இடையில் நிறுத்தப்பட்டிருப்பதால் பிரதேச மக்கள் அசௌகரியங்களுக்கு உள்ளாகியுள்ளனர் என்பதை அறிவாரா?

(ஆ) (i) மேற்படி சமூக நீர் வழங்கல் கருத்திட்டத்தின் நிர்மாணிப்புப் பணிகளுக்கு நிதி வழங்குகின்ற நிறுவனம் யாதென்பதையும்;

(ii) இதற்காக ஒதுக்கப்பட்டுள்ள மொத்த பணத்தொகை எவ்வளவென்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்தை நிறுத்துவதற்கான காரணங்கள் யாவையென்பதையும்

(iv) அதன் நிர்மாணிப்புப் பணிகள் தொடர்பாகவுள்ள தடைகளை நீக்கி நிர்மாணிப்புப் பணிகளை மீண்டும் ஆரம்பித்து மக்களின் நீர்த் தேவைகளை பூர்த்தி செய்வதற்கு துரிதமாக நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(v) ஆமெனில், அத்திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage :

(a) Is he aware that the people of the area have been inconvenienced as the construction work of the Community Water Project in the Beragala Grama Niladhari Division in the Haldummulla Divisional Secretary's Division in the Badulla District has been stopped half way?

(b) Will he inform this House-

(i) the name of institution which provides funds for the construction of the aforesaid Community Water Project;

(ii) the total amount of money that has been allocated for that purpose;

(iii) the reasons for stopping the aforesaid project;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iv) whether action will be taken to fulfil the water requirements of the people by removing the obstacles prevailing in the construction work of the aforesaid project expeditiously and re-starting the construction work;

(v) if so, the date on which it will be done?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බෙරගල ග්‍රාම නිලධාරි වසමේ ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති දෙකක් ඇත.

මෙම ව්‍යාපෘති දෙකෙහිම සම්පූර්ණයෙන් වැඩ නිම කර ජනතා අයිතියට පත් කර ඇති බැවින්, ප්‍රතිලාභී පවුල්වලට ගැටලුවකින් තොරව දැනට ජලය සපයනු ලැබේ. එහෙත් මෙයින් එක් ව්‍යාපෘතියක් වූ ස්වශක්ති ප්‍රජාමූල සංවිධාන ජල ව්‍යාපෘතිය මඟින් දැනට සපයන ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල මඟින් ඉදි කිරීමට සැලසුම් කරන ලද ජල පිරිපහදු ටැංකි ඉදි කිරීමට යෝජිත ඉඩමේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් මත එම ඉදි කිරීම් නවතා ඇත.

(ආ) (i) එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල.

(ii) රුපියල් ලක්ෂ විස්සයි. (රු.2,000,000.00)

(iii) ඉඩමේ අයිතිය පිළිබඳ රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මතු කළ ප්‍රශ්නය මත නවතා ඇත. දැනට එම ගැටලුව විසඳා ඇත. වැඩ කටයුතු ආරම්භ කිරීම සිදු වනු ඇත.

(iv) ඔව්.

(v) දැනට එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ මේ සඳහා වෙන් කරන ලද අරමුදල් නොමැති බැවින් අරමුදල් ලැබුණු වහාම ඉදි කිරීම් ආරම්භ කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ස්තුතියි, ගරු ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් අසනු ලබන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. බොහෝ ප්‍රජා ජල ව්‍යාපෘති ආරම්භ කරන්නට සිදු වන්නේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල වැනි විදේශ ආධාර මතයි. හැබැයි ඒ විදේශ ආධාර මත මෙම ව්‍යාපෘති ආරම්භ කරලා, පසු කාලීනව එක්කෝ එම ව්‍යාපෘති පවරා දෙන්නට සිදු වනවා. එය පවත්වාගෙන යාම පිළිබඳ ගැටලු සහගත තත්ත්වයන් ඇති වනවා. මේක බොහෝ ප්‍රජා ජල ව්‍යාපෘතිවලට තිබෙන ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, මා අහන්නේ මේවා නඩත්තු කිරීම සඳහා විදේශ ආධාර ලබා ගැනීමේ වෙනම ව්‍යාපෘතියක් ආරම්භ කරන්න අපට පුළුවන්කමක් තිබෙනවාද, එහෙම නැත්නම් සමස්තයක් විධියට රට පිළිබඳව සලකා රජයට මේ කටයුත්ත කරගෙන යාමේ හැකියාවක් තිබෙනවාද කියලායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රජා ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ප්‍රජාවගේ දායකත්වය සහ රජයේ ආධාර ඇතිව සිදු වන ග්‍රාමීය ජල යෝජනා ක්‍රමයක්. එම නිසා එම මූල ධර්මය ඉතාම වැදගත් වනවා. මොකද, ජනතාව සහභාගි වන ව්‍යාපෘති හැටියටයි කෙරෙන්නේ. ඒවායේ ඉතාම අඩු ප්‍රතිශතයක් ව්‍යාපෘති අර්බුදවලට මුහුණ දෙනවා. මෙහි ජල සැපයුම් කටයුතු නිම කරලා යි තිබෙන්නේ. ඊට වඩා ධාරිතාව වැඩි කරන්නට තමයි UNDP එකෙන් ආධාර ලැබෙන්නේ. එහෙම නැතිව මූලික ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා නොවෙයි. එතකොට ධාරිතාව වැඩි කර ගැනීම සඳහා ලැබෙන UNDP ආධාර මුදල ඉඩමේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් නිසා නැවතිලා තිබෙනවා. ඔබතුමා යෝජනා කරන පරිදි ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව සිදු කරන නඩත්තු කටයුතු, පිරිපහදුව සඳහා අවශ්‍ය වන filters ලබා ගැනීම සහ තාක්ෂණික හා කාර්මික දෝෂයන්ට උදවු වීමට අපට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මෙවර දිස්ත්‍රික් මට්ටමෙන් වැය ශීර්ෂයන් වෙන් කර දී තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ප්‍රජාව බොහෝ විට ජල සමිති හදා ගෙන තමයි මේ කටයුත්ත සිදු කරන්නේ. ඇතැම් අවස්ථාවලදී සිදු වන නඩත්තුවේ වියදම වැඩි නම් ගමේ තිබෙන සමාජ ආර්ථික යථාර්ථය තුළ ඒ අයට ඒ වියදම දරන්න බැහැ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් කරන මුදල් ඒ වාගේ අතරමඟ ඇණ හිටීම් නවත්වන්න ප්‍රමාණවත් වෙයි කියා ඔබතුමා විශ්වාස කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඊට අතිරේකව ගරු කථානායකතුමනි, දැන් ව්‍යාපෘතිය හමාර වෙලා තිබෙන නිසා ක්‍රමානුකූලව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැය ශීර්ෂ මඟින් එවැනි කටයුතුවලට යම්කිසි ආධාරයක් ලබා දීමට අපි තීරණයක් අරගෙන තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ අවසන් අතුරු ප්‍රශ්නය මෙසේයි. මගේ ප්‍රශ්නයෙන් මතු කරන බෙරගල කියන්නේ කඳු බෑවුම් සහිත ප්‍රදේශයක්. එහි එළවලු වගාව බොහෝ දුරට සිද්ධ වෙනවා. ඒ නිසා එළවලු සඳහා යොදන රසායනික ද්‍රව්‍ය ජලයට මුසු වීමේ හැකියාව තිබෙනවා. ජලය පවිත්‍ර කිරීමේ වැඩ පිළිවෙළ මේකෙදී වඩා ශක්තිමත්ව තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් ජලය අපවිත්‍ර වෙලා එක පැත්තකින් බෝවන රෝග ඇති වනවා. බෝවන රෝග නොවුණත් රසායනික ද්‍රව්‍ය එකතු වීම නිසාත් රෝග ඇති වෙන්නට පුළුවන්. මේ වාගේ කඳුකර ප්‍රදේශවල ප්‍රජා ජල ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ ලබන පාරිභෝගිකයන්ට කෙටි කාලීන නොව දීර්ඝ කාලීනව එවැනි අවදානමකට මුහුණ දීමට සිදු වනවා. මෙවැනි ප්‍රදේශ සම්බන්ධයෙන් සුවිශේෂී විමර්ශනයක් හෝ මැදිහත් වීමක් සිදු කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ lab එකට උපදෙස් දීලා තිබෙනවා. දැනට දහස් ගණනක් පාවිච්චි කරන ජලය පර්යේෂණ කරලා -test කරලා- ඒ ගැන සහතිකයක් ලබා ගැනීමට ප්‍රජා මූල සංවිධානවලට අවස්ථාව සලසා දී තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සහතිකය දුන්නොත් විතරද ඒක සිදු කරන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
බීමට සුදුසු නම් සහතිකය දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

## රජයේ පාසල් සිසුන්: නොමිලයේ නිල ඇඳුම්
### அரச பாடசாலை மாணவர்கள்: இலவச சீருடை
### STUDENTS IN GOVERNMENT SCHOOLS : FREE UNIFORMS

1340/'11

15. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2011 වර්ෂයේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් නොමිලේ පාසල් නිල ඇඳුම් ලබා දෙන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට 2011 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් ලබා දී තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) ලබා දී නොමැති නිල ඇඳුම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் ஆண்டில் அரச பாடசாலைகளில் கல்வி கற்கும் பாடசாலை மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவர்களில் இலவசமாக பாடசாலை சீருடை பெறும் மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) இன்றளவில் 2011ஆம் ஆண்டுக்கான பாடசாலை சீருடைகள் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறின்றேல், அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(v) வழங்கப்படாத சீருடைகள் வழங்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of students studying in government schools in year 2011;

(ii) the number of students who are provided with free school uniforms out of the aforesaid number of students;

(iii) whether school uniforms for year 2011 have been provided by now;

(iv) if not, the reasons for that;

(v) the date on which the uniforms that have not been provided, will be provided?

(b) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா )
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මම අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 3,932,722යි.

(ii) 3,932,722යි.

(iii) 2011.09.10 වන විට දිස්ත්‍රික්ක 02ක හැර අනෙක් සියලු දිස්ත්‍රික්ක සඳහා 2011 වර්ෂය සඳහා නිල ඇඳුම් ලබා දී ඇත.

(iv) රෙදි මිලදී ගනු ලබන දේශීය රෙදි සැපයුම්කරුවන් විසින් නියමිත රෙදි ප්‍රමාණය නොසැපයීම.

(v) 2011.09.30 දිනට පෙර.

(ආ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. නිල ඇඳුම් ලබා දීමට නොහැකි වූ ඒ දිස්ත්‍රික්ක දෙක මොනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒ දිස්ත්‍රික්ක දෙක, මෙම පිළිතුරේ සඳහන් වෙලා නැහැ. මා හිතන විධියට මාතලේ දිස්ත්‍රික්කය සහ තවත් දිස්ත්‍රික්කයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ 2011 වර්ෂයට?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔව්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, 2011 වර්ෂය ගත්තොත් ඇත්තටම කුරුණෑගල දිස්ත්‍රික්කයේ දරුවන් ලක්ෂයකට තවමත් නිල ඇඳුම් ලබා දෙන්න තිබෙනවා. මා හිතන හැටියට මාතලේ දිස්ත්‍රික්කයේත් නිල ඇඳුම් ලබා දිය යුතු දරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ප්‍රමාණය කොපමණද කියා මා දන්නේ නැහැ. දැන් මේ යන්නේ තුන්වන පාසල් වාරයයි. මා අහන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාට වෙනත් වැඩ පිළිවෙළක් නැද්ද

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කියා. ඉතිහාසයේ මේ තරම් ප්‍රමාදයක් දකින්න ලැබුණේ නැහැ. කෙසේ හෝ පළමුවන කාර්තුව වන විට නිල ඇඳුම් ලබා දුන්නා. මේ තුන්වන පාසල් වාරයයි. තුන්වන පාසල් වාරය අවසන් වන තුරුවත් මේ නිල ඇඳුම් ලබා දෙන්න බැරි තත්ත්වයක් අධ්‍යාපන අමාත්‍යාංශයට ඇති වෙලා තිබෙනවා. එම නිසා මා ඔබතුමාගෙන් අහනවා, පළමුවන පාසල් වාරයේදීම නිල ඇඳුම් ලබා දෙන්න අවශ්‍ය කරන කටයුතු සකස් කරන්න මොකක් හෝ වැඩ පිළිවෙළක් නැද්ද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, දේශීය නිෂ්පාදනයට අත හිත දීම සඳහා අපි දේශීය සැපයුම්කරුවන් සමඟ ගිවිසුමකට අත්සන් කරලා තිබෙනවා. නමුත් යම් කිසි ප්‍රමාදයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමාට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මෙය ලබා දීලා තිබෙන්නේ කර්මාන්ත අමාත්‍යාංශයටයි කියලා. කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තමයි මේ නිල ඇඳුම් සැපයුම සිද්ධ වන්නේ. අපි යම් කිසි කණ්ඩායමක් සමඟ ගිවිසුම්ගත වෙලා ඒ ගිවිසුම උල්ලංඝනය කළොත් අපට තව ගෙවීමක් කරන්න වනවා. ඉදිරි වර්ෂවලදී මේ රටේ දරුවන්ට කිසිම අඩු පාඩුවක් නැතුව නිල ඇඳුම් ලබා දීමේ වගකීම ඉෂ්ට කරනවාය කියලා අපට සපථ වන්න පුළුවන්, ගරු කථානායකතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. දැන් ඔබතුමා කිව්වා, මේ නිල ඇඳුම් මිලදී ගැනීමේ කටයුතු කර්මාන්ත අමාත්‍යාංශයට භාර දීලා, කර්මාන්ත අමාත්‍යාංශයෙන් තමයි සැපයුම්කරුවන් තෝරා ගැනීම කරන්නේ කියලා. නිල ඇඳුම් ලබා දීමේ ප්‍රමාදයට වග කියන්න ඕනෑ ආයතන සම්බන්ධයෙන් ඔබතුමන්ලා යම් කිසි නීතිමය ක්‍රියා මාර්ගයක් ගන්න බලාපොරොත්තු වනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

එවැනි ප්‍රමාදයන් සිදු කරන අය සමඟ අපි ඉදිරියට ගනුදෙනු කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ ගොල්ලන් අසාදු ලේඛනයට ඇතුළත් කරන්න කටයුතු කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රමාදයෙන් පසුව අලුතින් තීරණයක් අරගෙන වැඩි මිලකට රෙදි ගැනීම සඳහා යම් කිසි එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. මම ඒක අනාගතයේදී ඉදිරිපත් කරන්නම්. රුපියල් 80ක්ය කියා තමයි මට ආරංචිය තිබෙන්නේ. නමුත් ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය විධියට මේක එක එක්කෙනාට පවරන්නේ නැතුව යම් කිසි ස්ථාවර විධියකට, විනිවිද පෙනෙන ආකාරයට ටෙන්ඩර් කැඳවලා මේ වැඩ කටයුතු ටික කරනවා නම් මීට වැඩිය සාර්ථක විධියට කරන්න පුළුවන්ය කියා මා හිතනවා. මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ ඒ සම්බන්ධයෙන් යම් කිසි ක්‍රියා මාර්ගයක් ගන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වනවාද කියායි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, පාරදෘශ්‍ය විධියට තමයි මේ කටයුතු සිදු කෙරෙන්නේ. මේ කටයුතු සම්බන්ධයෙන් කිසිම චෝදනාවක් නැහැ. නමුත් ප්‍රමාදයක් තිබෙනවා. ප්‍රමාදයක් තිබෙන බව අපි පිළිගන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමන්ලා හැම දෙයක්ම චීනයෙන් ගෙන්වන නිසා මේකත් චීනයෙන් ගෙන්නුවා නම් හොඳයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

චීනයෙන් තමයි, ඇමෙරිකාව ගන්නේත්. ඇමෙරිකාවත් චීනයට ණය වෙලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රශ්නවලට ඉතා හොඳින් උත්තර දෙනවා. බොහොම ස්තුතියි.

## ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම: ණය සේවාකරණය
### ஸ்ரீ லங்கன் எயார்லைன்ஸ் நிறுவனம் : கடன் மீள்செலுத்துகை
### SRILANKAN AIRLINES : DEBT SERVICING

0763/’10

**2. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)

සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) "එයාර් ලංකා" ගුවන් සේවය පෞද්ගලීකරණය කරන ලද දිනය සහ එහි වටිනාකම කවරේද;

(ii) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමේ කොටස් යළි හිමි කර ගත් දිනය සහ ඒ සඳහා වැය වූ මුදල් ප්‍රමාණය කවරේද;

(iii) කළමනාකාරිත්වය පවරා ගත් දින සිට "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමට ප්‍රතිපාදිත මුදල් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගම විසින් ලබා ගෙන ඇති ණය මුදල්වල වටිනාකම කොපමණද;

(ii) එකී ණය මුදල් ලබා ගත් දිනයන් සහ එම ණය මුදල් ලබා ගත් ආයතනවල නම් කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2017 දක්වා ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ ණය සේවාකරණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) 2005 සිට 2011 වර්ෂය දක්වා "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගම ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

(v) පසු ගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී භූමියේදී සිදු කළ භාණ්ඩ මෙහෙයුම් තුළින් ලැබූ ලාභය කොපමණද;

(vi) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමට අදාළව රජය විසින් ලබා දී ඇති බැංකු ඇපකර පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சிவில் விமானச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எயார் லங்கா தனியார்மயப்படுத்தப்பட்ட திகதி மற்றும் அதன் பெறுமதி என்ன என்பதையும்;

(ii) ஸ்ரீ லங்கன் எயார்லைன்ஸ் பங்குகளை மீளப் பெற்றுக்கொண்ட திகதி மற்றும் அதற்காக ஏற்பட்ட செலவினம் எவ்வளவு என்பதையும்;

(iii) முகாமைத்துவம் கையேற்கப்பட்டதில் இருந்து, ஸ்ரீ லங்கன் எயார்லைன்சுக்காக ஒதுக்கப்பட்ட நிதி எவ்வளவு என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(ஆ) (i) ஸ்ரீ லங்கன் எயார் லைன்சால் பெறப்பட்ட கடன் தொகை எவ்வளவென்பதையும்;

(ii) கடன் பெறப்பட்ட திகதிகள் மற்றும் பணம் பெற்றுக்கொள்ளப்பட்ட நிறுவனங்களின் பெயர்கள் என்ன என்பதையும்;

(iii) 2010-2017 காலப்பகுதிக்கான ஸ்ரீ லங்கன் எயார் லைன்சின் கடன் மீள்செலுத்துகையை வருடாந்த அடிப்படையிரும்;

(iv) 2005-2011 காலப்பகுதிக்கான ஸ்ரீ லங்கா எயார் லைன்சின் இலாப, நட்டம் எவ்வளவு என்பதையும்;

(v) கடந்த ஐந்து வருட காலப்பகுதிக்குள் தரையில் செய்யப்பட்ட கையாளுதல்களின் மூலம் பெறப்பட்ட வருமானம் வருடாரீதியாக எவ்வளவு என்பதையும்;

(vi) ஸ்ரீ லங்கன் எயார்லைன்ஸ் தொடர்பாக அரசாங்கத்தால் வழங்கப்பட்ட வங்கி உத்தரவாதம் பற்றிய விபரங்களையும்

அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Civil Aviation :

(a) Will he state -

(i) the date on which the Air Lanka was privatized and the value of it;

(ii) the date on which the shares of the SriLankan Airlines was repossessed and the cost incurred for it; and

(iii) the extent of funds allocated to the SriLankan Airlines since the management is taken over?

(b) Will he also state -

(i) the amounts of debts or loans obtained by the SriLankan Airlines;

(ii) the dates on which those loans were obtained and the names of the institutions from which that money was borrowed;

(iii) the debt servicing for the SriLankan Airlines for the period from 2010 to 2017 on per year basis;

(iv) the profit and the loss for SriLankan Airlines from 2005 to 2011;

(v) the profit made from ground handling for the last 5 years on per year basis; and

(vi) the details on bank guarantees given by the Government pertaining to the SriLankan Airlines?

(c) If not, why?

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1998 මාර්තු 31

ඇමෙරිකන් ඩොලර් මිලියන 70යි. (මුළු කොටස් වලින් සියයට 40කි.)

(ii) 2010 ජූනි 28

ඇමෙරිකන් ඩොලර් මිලියන 53යි.

(iii) ප්‍රතිපාදන වෙන් කර නොමැත.

(ආ) (i) සහ (ii)

| **ආයතනය** | **ණය වර්ගය** | **ණය මුදලේ වටිනාකම (ඇමෙරිකන් ඩොලර්)** | **ලබා ගත් දිනය** |
|---|---|---|---|
| එන්ඩීබී බැංකුව | අයිරාවක් | 200,000 (ලක්ෂ දෙකයි) | 2008/09/18 |
| ලංකා බැංකුව | දිගු කාලීන ණය අයිරාවන් | 18,000,000 (මිලියන දහ අටයි) | 2010/03/22 |
| | | 10,000,000 (මිලියන දහයයි) | 2009/07/02 |
| | | 5,000,000 (මිලියන පහයි) | 2011/01/31 |
| | | 16,000,000 (මිලියන දහසයයි) | 2011/03/04 |
| ස්ටෑන්ඩඩ් චාර්ටඩ් සිටි බැංකුව | අයිරාවක් | 6,500,000 (මිලියන හයයි දශම පහයි) | 2008/03/25 |
| | කෙටි කාලීන ණය | 2,000,000 (මිලියන දෙකයි.) | 2008/06/30 |

(iii) ඉහත දැක්වූ සියලුම අයිරාවන් සහ කෙටි කාලීන ණය, ඉල්ලා සිටිය විට නැවත ආපසු ගෙවිය හැකි ලෙස ලබා ගෙන ඇත.

[ගරු පියංකර ජයරත්න මහතා]

ලංකා බැංකුවෙන් ලබා ගෙන ඇති දිගු කාලීන ණය පහත පරිදි ආපසු ගෙවනු ලැබේ.

| 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| 0.00 | ඇ.එ.ජ. ඩොලර් මිලියන 2.4 | ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.6 | ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.6 | ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.6 | ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.6 | ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.2 | ගෙවා අවසන් |

(ඇ.එ.ජ. ඩොලර් = ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්)

(iv) 2005 සිට 2011.03.31 න් අවසන් වසර දක්වා ලැබූ ලාභය/ (පාඩුව)

රුපියල් මිලියන:

| 2005/06 විගණනය කළ | 2006/07 විගණනය කළ | 2007/08 විගණනය කළ | 2008/09 විගණනය කළ | 2009/10 විගණනය කළ | 2010/11 විගණනය නොකළ |
|---|---|---|---|---|---|
| 1,719.78 | 862.18 | 4,899.66 | (9,996.85) | (6,034.27) | (1,836.79) |

(v) භූමි මෙහෙයුම් අංශය වෙනත් නෛතික අංශයක් ලෙස මෙහෙයුම් කටයුතුවල නිරත නොවූ අතර ඉහත (iv) හි දැක්වූ ලාභ (පාඩු) සටහනේ භූමි මෙහෙයුම් අංශයේ ලාභ (පාඩු) ද අන්තර්ගත කර ඇත.

(vi) මහ භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුව වෙත 2009/12/30 දාතමින් යුතුව ඇ. එ. ජ. ඩොලර් මිලියන 10ක් (දහයක්) සඳහා ණයවර ලබා ගැනීමට අස්වැසුම් ලිපියක් (Letter of Comfort) නිකුත් කොට ඇති අතර එහි වලංගුභාවය 2010/12/30 වැනි දායින් අවසන් විය. (මෙම බැංකු පහසුකම මෙදිනට ලංකා බැංකුවට සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇති අතර මේ වන විට ක්‍රියාත්මක බැංකු ඇපකර නොමැත.)

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5-1539/'11- (1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ගරු අජිත් කුමාර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## තම්මැන්නා ඇළ පළල් කිරීමේ ව්‍යාපෘතිය: විස්තර
### தம்மென்னா கால்வாய் விரிவாக்கல் கருத்திட்டம்: விபரம்
WIDENING PROJECT OF THAMMENNA ELA: DETAILS

1542/'11

**6. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු වසන්ත අලුවිහාරේ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு வசந்த அலுவிஹாரே சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon.Wasantha Aluwihare)
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, දඹුල්ල නගරය මැදින් ගලා බසින තම්මැන්නා ඇළ පළල් කිරීමේ කටයුතු සිදු කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ කටයුතු සිදු කරන ආයතනය කුමක්ද;

(iii) තම්මැන්නා ඇළ පළල් කිරීමේ කටයුතු පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කර තිබේද;

(iv) ඇළ පළල් කිරීම හේතුවෙන් ඇළ දෙපස පදිංචිකරුවන් විශාල පිරිසකගේ සින්නක්කර ඉඩම් කොටස් සහ එම ඉඩම්වල තිබූ වටිනා ගස් අහිමි වී ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, එම පදිංචිකරුවන්ට ඒ සඳහා වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) වන්දි ලබා දීමට කටයුතු කරන්නේ නම්, ඊට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

"

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தளை மாவட்டத்தில் தம்புல்ல பிரதேச செயலாளர் பிரிவுக்குச் சொந்தமான தம்புல்ல நகர மத்தியில் ஓடும் தம்மென்னா கால்வாயை விரிவாக்குவதற்கான நடவடிக் கைகள் நடைபெறுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இக்கருத்திட்டத்திற்கென மதிப்பீடு செய்யப்பட்ட பணத்தொகை யாதென்பதையும்;

(ii) இக்கருத்திட்ட நடவடிக்கைகளை மேற்கொள்ளும் நிறுவனம் யாதென்பதையும்;

(iii) தம்மென்னா கால்வாய் விரிவாக்கல் தொடர்பாக பிரதேச வாசிகள் அறிவூட்டப்பட்டனரா என்பதையும்;

(iv) கால்வாய் விரிவாக்கப்படுவதனால் கால்வாயின் இருபக்கத்திலுமுள்ள பெரும்பாலான குடியிருப் பாளர்களின் உரித்துரிமைக் காணித் துண்டுகளை யும் இக்காணிகளிலிருந்த பெறுமதிமிக்க மரங்களை யும் இழந்துள்ளனர் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(v) அவ்வாறாயின் இக்குடியிருப்பாளர்களுக்கு இதற்கான நட்டஈடொன்றை வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(vi) நட்டஈடு வழங்க நடவடிக்கை மேற்கொள்ளப்படுமாயின் அதற்குத் தேவைப்படும் காலம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management :

(a) Is he aware that the widening of Thammenna Ela which flows through the Dambulla town in the Dambulla Divisional Secretary's in the Matale District, is in progress?

(b) Will he state-

(i) the estimated cost of this project ;

(ii) the name of the institution that handles the project ;

(iii) whether the residents of the area have been educated about the widening of the Thammenna Ela ;

(iv) whether he admits that a large number of residents on either side of this stream have lost freehold lands and very valuable trees that grew on them owing to the widening of the stream ;

(v) if so, whether arrangements will be made to pay compensation to those residents ; and

(vi) if arrangements will be made to pay compensation, the time taken for that?

(c) If not, why ?

**ගරු ඩුලිප් විජේසේකර මහතා**
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) රුපියල් 63,000,000/-කි. (රු. මිලියන 63කි.)

(ii) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

(iii) ඔව්.

(iv) නැත. ඇළ මාර්ගය පුළුල් කර ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සලකුණු කරන ලද ඇළ රක්ෂිතය තුළය.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

## කැකිරාව, ගනේවල්පොල ප්‍රදේශ : පානීය ජල පහසුකම්

கெகிராவ-கனேவல்பொல பிரதேசம்: குடிநீர் வசதி
KEKIRAWA, GANEWALPOLA AREAS: DRINKING WATER FACILITIES

1616/'11

7. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු මොහමඩ් අස්ලම් මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு மொஹமட் அஸ்லம் சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Mohamed Aslam)

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, කැකිරාව, ගනේවල්පොල ප්‍රදේශයේ උග්‍ර පානීය ජල හිඟයක් පවතින බවත්;

(ii) එම ප්‍රදේශයේ උල්පත් ජලය හා ළිං ජලය පානය කිරීමට නුසුදුසු බවට සෞඛ්‍ය නිලධාරීන් උපදෙස් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කලාවැව ජල යෝජනා ක්‍රමය යටතේ ජල නළ එළීමේ කටයුතු ඉහත සඳහන් ප්‍රදේශයන්හි ගම්මානයන් ආවරණය වන පරිදි ව්‍යාප්ත නොකිරීම නිසා එම ප්‍රදේශවාසීන්ට පිරිසිදු පානීය ජල පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தின் கெக்கிராவ- கனேவல் பொல பிரதேசத்தில் கடுமையாக குடிநீர் பற்றாக்குறை நிலவுகின்றதென்பதையும்;

(ii) அப்பிரதேசத்தின் ஊற்று நீர் மற்றும் கிணற்று நீர் குடிப்பதற்கு உகந்ததல்ல என சுகாதார உத்தியோகத்தர்களால் அறிவுறுத்தப்பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) கலாவெவ நீர் விநியோகத்திட்டத்தின்கீழ், நீர் குழாயிடல் பணிகள் மேலே குறிப்பிட்டுள்ள பிரதேசத்தின் கிராமங்களை உள்ளடக்குகின்றவாறு விஸ்தரிக்கப்படாமையினால் அப்பிரதேச மக்கள் சுத்தமான குடிநீரைப் பெற்றுக் கொள்ளும் வாய்ப்பை இழந்துள்ளார்கள் என்பதை அவர் ஏற்றுக்கொள்கின்றாரா?

(இ) ஆமெனில், அம்மக்களின் குடிநீர் தேவையை பூர்த்தி செய்வதற்காக துரிதமான தீர்வொன்றைப் பெற்றுக் கொடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

asked the Minister of Water Supply and Drainage :

(a) Is he aware that-

(i) there is a severe shortage of drinking water in Ganewalpola, Kekirawa in the Anuradhapura District ; and

(ii) the health officials have warned that spring water and well water in that area is not suitable for drinking?

(b) Will he admit the fact that the people in that area have missed the opportunity of obtaining drinking water owing to the pipe laying activities under the Kalawewa Water Supply Scheme not expanding to cover the aforesaid area?

(c) If so, will he inform this House whether a speedy solution to fulfil the drinking water need of those people will be deviced?

(d) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ගනේවල්පොල ප්‍රදේශයේ භූගත ජලයේ ස්වභාවය අනුව උල්පත්වල හා ළිංවල ජලයේ ප්ලෝරයිඩ් හා කඨින සාන්ද්‍රණය අධික බැවින් බීමට නුසුදුසු තත්ත්වයේ පවතින බව වාර්තා වී ඇත.

(iii) ඔව්.

(ආ) ඔව්.

එසේ වුවද මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන කලාවැව ජල මූලාශ්‍රය උපයෝගී කර ගනිමින් ආරම්භ කරන ලද කැකිරාව ජල සම්පාදන ක්‍රම අදියර II යටතේ දැනටමත් ගනේවල්පොල නගරය ආවරණය වන පරිදි ජල නළ පද්ධතියක් සැලසුම් කර ඇති අතර ඉදි කිරීම් කටයුතු 2011 සැප්තැම්බර් මස අවසන් සතියේ සිදු කිරීමට නියමිතය. මෙම ඉදි කිරීම මාස 06කින් නිම කිරීමට බලාපොරොත්තු වේ.

(ඇ) ඔව්.

දැනට කැකිරාව ජල සම්පාදන ක්‍රමය අදියර II යටතේ ගනේවල්පොල නගරය ආවර්ණය වන පරිදි ආරම්භ කරනු ලබන ජල නළ පද්ධතියට අමතරව ගනේවල්පොල නගරය අවට ප්‍රදේශ සඳහා ජලය ලබා දීම පිණිස හුරුළු වැව ජල මූලාශ්‍රය උපයෝගී කර ගනිමින් විශාල පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතියක් සඳහා ශක්‍යතා වර්තාවක් සකස් කර ඇත. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 2,238ක් වේ. මෙම විශාල පරිමාණ ජල යෝජනා ක්‍රමයට මුදල් වෙන් කර ගැනීම සඳහා අදාළ කටයුතු මේ වන විට සිදු කර ගෙන යන අතර මුදල් වෙන් කළ පසු ඉදි කිරීම් ආරම්භ කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

## මත්පැන් බලපත්‍ර: විස්තර
## மதுபான அனுமதிப்பத்திரங்கள்: விபரம்
## LIQUOR LICENCES : DETAILS

0770/’10

8. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) 2009 හා 2010 යන වර්ෂවලදී,

(i) මත්පැන් බලපත්‍ර නිකුත් කර තිබේද;

(ii) එසේ නම්, විවිධ කාණ්ඩ යටතේ නිකුත් කොට ඇති බලපත්‍ර සංඛ්‍යාව කවරේද;

(iii) නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව දිස්ත්‍රික් පදනමින් කවරේද;

(iv) මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයා ගත් ආදායම කොපමණද;

(v) එම බලපත්‍රවලින් කිසිවක් අවලංගු කොට තිබේද;

(vi) එසේ නම්, එලෙස අවලංගු කරන ලද මත්පැන් බලපත්‍ර කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2009, 2010 ஆகிய ஆண்டுகளில்,

(i) மதுபான அனுமதிப்பத்திரங்கள் வழங்கப்பட்டனவா என்பதையும்;

(ii) அவ்வாறாயின், பல்வேறு வகைப் பிரிவுகளின் வழங்கப்பட்ட அனுமதிப்பத்திரங்களின் எண்ணிக் கையையும்;

(iii) வழங்கப்பட்ட புதிய அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கையை மாவட்ட அடிப்படையிலும்;

(iv) அனுமதிப்பத்திர விநியோகத்தின்மூலம் ஈட்டப்பட்ட வருமானத்தையும்;

(v) அனுமதிப்பத்திரங்கள் ஏதும் இரத்துச் செய்யப்பட்ட னவா என்பதையும்;

(vi) அவ்வாறாயின், அனுமதிப்பத்திரங்கள் இரத்துச் செய்யப்பட்ட வகைகளின் பெயர்கள் யாதென் பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning :

(a) Will he state separately, in year 2009 and 2010-

(i) whether the liquor licences were issued;

(ii) if so, the number of licences issued under different categories;

(iii) the number of new licences issued on district basis;

(iv) the revenue earned by issuing liquor licences;

(v) whether any licences have been cancelled; and

(vi) if so, the licences which were cancelled as per above ?

(b) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii)

| 2009 | 2010 |
|---|---|
| • ර. බි. 07/08 වර්ගයේ බලපත්‍ර 36කි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමැතිය ලද හෝටල් සඳහා නිකුත් කරන බලපත්‍රය | • ර. බි. 07/08 වර්ගයේ බලපත්‍ර 51කි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමැතිය ලද හෝටල් සඳහා නිකුත් කරන බලපත්‍රය |
| • ර. බී. 22 බී වර්ගයේ බලපත්‍ර 04කි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමැතිය ලද පරිභෝජනය සඳහා නිකුත් කරන බලපත්‍රය | - |

(iii)

| | 2009 | | 2010 | |
|---|---|---|---|---|
| **දිස්ත්‍රික්කය** | **නිකුත් කළ බලපත්‍ර වර්ගය** | **නිකුත් කළ බලපත්‍ර ගණන** | **නිකුත් කළ බලපත්‍ර වර්ගය** | **නිකුත් කළ බලපත්‍ර ගණන** |
| කොළඹ | ර.බි. 07/08 | 05 | ර.බි. 07/08 | 06 |
| ගම්පහ | ර.බි. 07/08 | 10 | ර.බි. 07/08 | 06 |
| ගාල්ල | ර.බි. 07/08 | 04 | ර.බි. 07/08 | 04 |
| | ර.බි. 22 බි | 01 | නැත | නැත |
| හම්බන්තොට | ර.බි. 07/08 | 01 | ර.බි. 07/08 | 01 |
| | ර.බි. 22 බි | 01 | නැත | නැත |
| මාතර | ර.බි. 07/08 | 03 | නැත | නැත |
| මහනුවර | ර.බි. 07/08 | 04 | ර.බි. 07/08 | 03 |
| මොණරාගල | ර.බි. 22 බි | 01 | ර.බි. 07/08 | 01 |
| නුවරඑළිය | ර.බි. 07/08 | 02 | ර.බි. 07/08 | 02 |
| මාතලේ | ර.බි. 07/08 | 02 | ර.බි. 07/08 | 02 |
| කුරුණෑගල | ර.බි. 07/08 | 02 | නැත | නැත |
| අම්පාර | ර.බි. 07/08 | 01 | ර.බි. 07/08 | 02 |
| මඩකලපුව | ර.බි. 22 බි | 01 | නැත | නැත |
| යාපනය | ර.බි. 07/08 | 02 | ර.බි. 07/08 | 06 |
| රත්නපුරය | නැත | නැත | ර.බි. 07/08 | 02 |
| කළුතර | නැත | නැත | ර.බි. 07/08 | 05 |
| පොලොන්නරුව | නැත | නැත | ර.බි. 07/08 | 01 |
| පුත්තලම | නැත | නැත | ර.බි. 07/08 | 03 |
| කෑගල්ල | නැත | නැත | ර.බි. 07/08 | 01 |
| අනුරාධපුරය | නැත | නැත | ර.බි. 07/08 | 03 |
| බදුල්ල | නැත | නැත | ර.බි. 07/08 | 01 |
| ත්‍රිකුණාමලය | නැත | නැත | ර.බි. 07/08 | 01 |
| කිලිනොච්චිය | නැත | නැත | ර.බි. 07/08 | 01 |
| එකතුව | | 40 | | 51 |

(iv) 2009 (රු. මි.) 2,340,446.00

2010 (රු. මි.) 4,246,276.00

(v) අවලංගු කොට නොමැත.

(vi) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමනි, මීට පෙර ජනවාරි 20 වන දිනත් මෙවැනි ප්‍රශ්නයකට සවිස්තරාත්මක උත්තරයක් දීලා තිබෙනවා. මා ඔබතුමාගේ අවධානයට මෙය ලක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අද දින ගැලරියේ පාසල් ළමයින් සිටින නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ,

මේ රටේ ඒක පුද්ගල මත්පැන් භාවිතය වැඩිම වර්ෂය හැටියට වාර්තාගත වී තිබෙන්නේ 1977 වර්ෂයයි. FAO (UN) වාර්තාවේ "World Drink Trends 2003" ප්‍රස්ථාර සටහනෙන් පෙන්වන ආකාරයට මත්පැන් භාවිතය වැඩි වී තිබෙන්නේ 1977-1981 කාලය තුළයි. එම ප්‍රස්ථාර සටහන මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ මතට තිත වැඩසටහන අනුව ළමයින්ගේ අනාගතය වෙනුවෙන් අප කැප වෙලා ක්‍රියා කරනවාය කියන ටික ඉතාම ඕනෑකමින් මතක් කරනවා.

****සභාමේසය මත තබන ලද ප්‍රස්ථාර සටහන:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட வரைபு:*
*Graph tabled:*



## කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: යටිතල පහසුකම්
## கொட்டபொல கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள்: உட்கட்டமைப்பு வசதிகள்
## SCHOOLS ADMINISTERED BY KOTAPOLA DIVISIONAL EDUCATION OFFFICE: INFRASTRUCTURE FACILITIES

0812/’10

9. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩු පාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩු පාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் தெனியாய வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் கொட்டபொல கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்ற தென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்,

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலைக ளின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்,

(ii) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறைபாடு களை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்,

(iii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கு மென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the Government schools administered by the Kotapola Divisional Education Office of the Deniyaya Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity; and

(v) the number of schools with furniture requirements ?

(c) Will he state-

(i) the names, addresses and telephone numbers of schools with aforesaid shortages;

(ii) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(iii) if so, the period of time taken for it?

(d) If not, why?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තරය සභාගත කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මට ඒ සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න කිහිපයක් අහන්නට තිබෙනවා. එම නිසා උත්තරය අහගන්න පොඩ්ඩක් අවසර දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් පිළිතුර ලබා දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඌනතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) 01යි.

(ii) පුස්තකාල සහ විද්‍යාගාර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ. සමහර පාසල්වල පන්ති කාමරය තුළ කුඩා පුස්තකාල ඇත.

(iii) 13යි.

(iv) විදුලිය නොමැති ගුරු නිවාස නැත.

(v) ලී භාණ්ඩ අවශ්‍යතා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(ඇ) (i) ඇමුණුමෙහි සඳහන් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි. දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(ii) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත පළාත් සභාව මඟින් කළමනාකරණය කරනු ලැබේ.

(iii) මූල්‍ය පහසුකම් ලැබෙන ආකාරය අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled*

ඇමුණුම 1

දෙනියාය අධ්‍යාපන කලාපයේ කොටපොල කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසලේ නම හා ලිපිනය | විදුලිබලය | පුස්තකාල | විද්‍යාගාර | ගුරු නිවාස | ලී බඩු අවශ්‍යතා |
|---|---|---|---|---|---|---|
| 01 | මාර/කීර්ති අබේවික්‍රම ම.ම.වි මොරවක | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 02 | මාර/දෙනියාය ම.ම.වි දෙනියාය | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 03 | මාර/කොටපොල ජාතික පාසල කොටපොල | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 04 | මාර/ජේරුපිටිය ක.වි. වරල්ල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 05 | මාර/පරගල ක.වි. පරගල, මොරවක | ඇත | නැත | නැත | නැත | ඇත |
| 06 | මාර/මුගුණුමුල්ල ක.වි කොටපොල | ඇත | නැත | නැත | ඇත | ඇත |
| 07 | මාර/ගොඩකුඹුර ක.වි. කොටපොල | ඇත | නැත | නැත | ඇත | ඇත |
| 08 | මාර/ඉළුක්පිටිය ක.වි. කොටපොල | ඇත | නැත | නැත | ඇත | ඇත |
| 09 | මාර/වරල්ල එම්.ඩී යාපා ම.වි. වරල්ල | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 10 | මාර/යටිහොරගල ක.වි. යටිහොරගල, වරල්ල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 11 | මාර/උඩහොරගල ක.වි. උඩහොරගල, වරල්ල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 12 | දෙනියාය රාජපක්ෂ ම.වි. දෙනියාය | ඇත | නැත | ඇත | ඇත | ඇත |
| 13 | මාර/ශාන්ත මැතිව්ස් ද්විභාෂා ම.වි දෙනියාය | ඇත | ඇත | නැත | නැත | ඇත |
| 14 | මාර/හැන්ෆර්ඩ් දෙ.ක.වි දෙනියාය | ඇත | නැත | නැත | නැත | ඇත |
| 15 | මාර/කිරිවැල්දොල ක.වි. දෙනියාය | ඇත | නැත | නැත | ඇත | ඇත |
| 16 | මාර/කීරිවලගම ක.වි. මෙදේරිපිටිය, දෙනියාය | ඇත | නැත | නැත | නැත | ඇත |
| 17 | මාර/කන්දිල්පාන ක.වි. බටේයාය, දෙනියාය | ඇත | නැත | නැත | නැත | ඇත |
| 18 | මාර/බෙවර්ලි දෙ.ක.වි. බෙවර්ලිගම, දෙනියාය | නැත | නැත | නැත | නැත | ඇත |
| 19 | මාර/මෙදේරිපිටිය ක.වි. මෙදේරිපිටිය,දෙනියාය | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 20 | මාර/පල්ලෙගම ම.වි. කොළවෙනිගම, දෙනියාය | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 21 | මාර/කොළවෙනිගම ම.වි. කොළවෙනිගම,දෙනියාය | ඇත | ඇත | නැත | නැත | ඇත |
| 22 | මාර/විහාරහේන ක.වි. විහාරහේන, දෙනියාය | ඇත | ඇත | නැත | ඇත | ඇත |
| 23 | මාර/එන්සල්වත්ත දෙ.ක.වි. දෙනියාය | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 24 | මාර/අනින්කන්ද දෙ.ක.වි. අනින්කන්ද දෙ.ක.වි අනින්කන්ද, දෙනියාය | ඇත | නැත | නැත | ඇත | ඇත |

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා, පළමුවන වටයේදී වෙච්ච වැරැද්ද නිවැරදි කිරීම ගැන. මේ අවස්ථාව දීම පිළිබඳව ඔබතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. දරුවා කැමතියි, අවුරුද්දේ පළමුවන වාරයේදී අලුත් ඇඳුමක් ඇඳ ගෙන යන්න. එම නිසා ලබන අවුරුද්දේ නිල ඇඳුම් මේ තුන්වන වාරය අවසානයේ ලබා දීමේ හැකියාවක් නැද්ද? එහෙම වුණොත් නිවාඩු කාලයේ ඇඳුම මසා ගෙන පළමුවන වාරයේදීම ඇඳ ගෙන යන්නට පුළුවන්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අපේ රජයත්, අතිගරු ජනාධිපතිතුමාත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් මේ රටේ දරුවන් වෙනුවෙන් විශාල වූ සුවිශේෂ වූ කාර්ය භාරයක් ඉටු කරමින් පවතින වකවානුවක් මේ. ඒ වකවානුව තුළ අප බලාපොරොත්තු වෙනවා, පාසල් දරුවන් ඉතාමත් සතුටින් පාසල් ගත කිරීමට. ඒක තමයි අපේ අරමුණ. වීදි දරුවන් වෙනුවෙනුත් අප වෙනම වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. මහා යුද්ධයක් කරලා ඒ යුද්ධයෙන් පස්සේ බොහොම අපහසුකම් මැද්දේ මේ සියලු කාරණා ඉෂ්ට කරන රජයක් මේ. අප ඉතාමත්ම වුවමනාවෙන් ඒ කටයුත්ත කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. 2011 වර්ෂයට නිල ඇඳුම් ලබා දීමේදී ඇඳුමේ ප්‍රමිතිය පිළිබඳව බරපතළ ප්‍රශ්න මතු වුණා. ඒ සඳහා විධිමත් පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඇත්ත වශයෙන්ම අප ඒ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සොයා බලමින් ඉදිරියේදී කටයුතු කරනවා. [බාධා කිරීම්] ඔයගොල්ලන්නේ කට්ටියට බාධා කරන්න එපා. ඔබතුමා මොන පිලේද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමාටත් මතක ඇති තෙලිජ්ජවිල රාජකීය විද්‍යාල භූමියේදී අවුරුදු 10ක දැරිවියක් අපහරණයට ලක් වීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය දැඩි මැදිහත් වීමක් කළා. දැන් දෙවන සිද්ධිය වාර්තා වෙලා තිබෙනවා.

අවුරුදු 15ක පාසල් දැරිවියක් මාතර පිහිටා තිබෙන රාජ්‍ය ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රාදේශීය ළමා වැඩසටහනකට ගියාම එම ආයතනයේ වැඩ කරන පුද්ගලයකු අතින් අපහරණයට ලක් වෙලා තිබෙනවා. ඒ ගැන මම මේ ගරු සභාවේ අවධානය යොමු කරලා අහනවා, කරුණාකරලා තෙලිජ්ජවිල රාජකීය විද්‍යාල භූමියේදී සිදු වුණු සිද්ධිය වාගේම මේ පිළිබඳවත් සොයා බලා මැදිහත්වීමක් කරනවාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේවා ඉතාම සංවේදී කාරණා. මෙම සංවේදී කාරණා වෙනුවෙන් ජනාධිපතිතුමාත්, රජයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් මැදිහත් වෙලා අදාළ අයට නිසි දඬුවම් ලබා දීමටත්, ඒ වාගේම අපහරණයට ලක් වූවන්ට සහන ලබා දීමටත් කටයුතු කරනවා. තෙලිජ්ජවිල සිද්ධියට ලක් වූ දැරිවියගේ පියා එම දැරිවියගේ ඉදිරි පාසල් අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය අධාර උපකාර ලබා ගැනීම සඳහා මා හමු වීමට අද අමාත්‍යාංශයට ආවා. මේ කාරණා ඉස්මතු වෙමින් තිබෙන වෙලාවේ සමස්ත සමාජයම යම් කිසි වෙනසකට භාජනය කළ යුතුයි කියන කාරණාව තමයි අපි කල්පනා කරන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ සඳහා ඔබතුමන්ලා මැදිහත් වෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අපි මැදිහත් වෙනවා. අනිවාර්යයෙන්ම අපි මැදිහත් වෙනවා.

## වියළි මිරිස් නිෂ්පාදනය සහ ආනයනය : බදු
## செத்தல் மிளகாய் உற்பத்தி மற்றும் இறக்குமதி : வரிகள்
## PRODUCTION AND IMPORT OF DRIED CHILLIES : TAXES

1193/'11

12. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)
සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) පසු ගිය වර්ෂ පහ තුළ, එක් එක් වර්ෂයේ දී,

(i) සමස්ත වියළි මිරිස් පරිභෝජනය සහ ඒක පුද්ගල වියළි මිරිස් පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කළ වියළි මිරිස් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාව තුළ වියළි මිරිස් කිලෝග්‍රෑමයක් සඳහා වන නිෂ්පාදන වියදම කොපමණද;

(iv) ආනයනය කළ වියළි මිරිස් ප්‍රමාණය කොපමණද;

(v) ආනයනය කරන ලද වියළි මිරිස් ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

(vi) රජය මඟින් වියළි මිරිස් සඳහා සත්‍ය වශයෙන්ම ලබා දෙන සහනාධාරය, එය සනාථ කිරීමට අවශ්‍ය කරුණුද සමඟ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආනයනය කරන ලද සහ දේශීයව නිෂ්පාදනය කරන ලද වියළි මිරිස් කිලෝග්‍රෑමයක් සඳහා පනවා ඇති සියලු බදු (සෘජු සහ වක්‍ර) වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 5 வருடங்களுக்கான செத்தல் மிளகாயின் மொத்த நுகர்வு மற்றும் தலைக்குரிய நுகர்வு எவ்வளவு என்பதையும்;

(ii) உள்நாட்டில் உற்பத்தி செய்யப்பட்ட செத்தல் மிளகாயின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) இலங்கையில் 1கி.கி. செத்தல் மிளகாய்க்கான உற்பத்திச் செலவு எவ்வளவு என்பதையும்;

(iv) இறக்குமதி செய்யப்பட்ட செத்தல் மிளகாயின் அளவு எவ்வளவு என்பதையும்;

(v) இறக்குமதி செய்யப்பட்ட செத்தல் மிளகாயின் பெறுமதி எவ்வளவு என்பதையும்;

(vi) அரசாங்கத்தினால் செத்தல் மிளகாய்க்கு உண்மையில் வழங்கப்பட்ட மானியம் எவ்வளவு என்பதை தகுந்த ஆதாரத்துடனும்

வருடாந்த அடிப்படையில் அவர் தெரிவிப்பாரா?

(ஆ) உள்நாட்டில் உற்பத்தி செய்யப்படுகின்ற மற்றும் இறக்குமதி செய்யப்படுகின்ற 1 கி.கி. செத்தல் மிளகாய்க்கு விதிக்கப்படுகின்ற சகல வரிகள் (நேரடி, மறைமுக) எவ்வளவு என்பதை தனித்தனியாக அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade :

(a) Will he state on per year basis for the last five years -

(i) the total consumption and the per capita consumption of dried chillies;

(ii) the amount of dried chillies produced locally;

(iii) the production cost per kilogram of dried chillies in Sri Lanka;

(iv) the content of dried chillies that was imported; and

(v) the value of the imported volume of dried chillies ; and

(vi) the real subsidy given to dried chillies by the Government with evidence ?

(b) Will he also state separately all taxes (direct and indirect) imposed on a kilogram of dried chillies imported and produced locally?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව;

- සමස්ත වියළි මිරිස් පරිභෝජනය (ගෘහස්ථ පරිභෝජනය)

| | වියළි මිරිස් කරල් | වියළි මිරිස් කුඩු |
|---|---|---|
| සමීක්ෂණ වර්ෂය 2006/2007 | ටොන් 11,669 (ටොන් එකොළොස්දහස් හසිය හැටනවයකි) | ටොන් 23,811 (ටොන් විසිතුන්දහස් අටසිය එකොළහකි) |
| සමීක්ෂණ වර්ෂය 2009/2010 | ටොන් 11,507 (ටොන් එකොළොස්දහස් පන්සියහතකි) | ටොන් 26,072 (ටොන් විසිහයදහස් හැත්තෑදෙකකි) |

- ඒක පුද්ගල වියළි මිරිස් පරිභෝජනය (ගෘහස්ථ පරිභෝජනය)

| | වියළි මිරිස් කරල් | වියළි මිරිස් කුඩු |
|---|---|---|
| සමීක්ෂණ වර්ෂය 2006/2007 | කි.ග්‍රෑ. 0.59 (කිලෝග්‍රෑම් බිංදුවයි දශම පහයි නවයයි) | කි. ග්‍රෑ. 1.19 (කිලෝග්‍රෑම් එකයි දශම එකයි නවයකි) |
| සමීක්ෂණ වර්ෂය 2009/2010 | කි.ග්‍රෑ. 0.56 (කිලෝග්‍රෑම් බින්දුවයි දශම පහයි හයයි) | කි.ග්‍රෑ. 1.27 (කිලෝග්‍රෑම් එකයි දශම දෙකයි හතකි) |

(ii) ඇමුණුම I බලන්න.

(iii) ඇමුණුම I බලන්න.

(iv) ඇමුණුම II බලන්න.

(v) ඇමුණුම II බලන්න.

(vi) වියළි මිරිස් සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පමණක් අය කිරීම නිසා අනෙකුත් බදු අදාළ නොවේ. එම හේතුවෙන් 2011 ජූලි මාසයේ ආනයනික මිරිස් කිලෝවක් සඳහා රු. 57ක (රුපියල් පනස් හතක) පමණ සහනයක් හිමි වී ඇත.

(ආ) ඇමුණුම III බලන්න.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම I
Annexure I
இணைப்பு I

<u>කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සපයා ඇති තොරතුරු අනුව පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී දේශීය වශයෙන් නිෂ්පාදනය කළ වියළි මිරිස් ප්‍රමාණය සහ වියළි මිරිස් කිලෝග්‍රෑමයක් සඳහා වන නිෂ්පාදන වියදම</u>

| වර්ෂය | (අ)(ii) ප්‍රමාණය (මෙ.ටො.) | (අ)(iii) නිෂ්පාදන වියදම (රු.) |
|---|---|---|
| **2006** | 14,031 | 56.00 |
| **2007** | 14,376 | 65.00 |
| **2008** | 14,380 | 81.00 |
| **2009** | 11,176 | 98.00 |
| **2010** | 12,105 | 110.00 |

ඇමුණුම II
Annexure II
இணைப்பு II

<u>ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති තොරතුරු අනුව පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ආනයනය කළ වියළි මිරිස් ප්‍රමාණය සහ වටිනාකම</u>

| වර්ෂය | (අ)(iv) ප්‍රමාණය (කි.ග්‍රෑ.) | (අ)(v) වටිනාකම (රු) |
|---|---|---|
| **2006** | 29,714,710 | 2,724,289,773.00 |
| **2007** | 32,391,533 | 4,228,735,894.00 |
| **2008** | 35,282,114 | 4,577,686,818.00 |
| **2009** | 36,842,960 | 4,875,594,754.00 |
| **2010** | 38,622,773 | 5,115,568,734.00 |

ඇමුණුම III
Annexure III
இணைப்பு III

<u>වෙළෙඳ තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති තොරතුරු අනුව ආනයනය කරනු ලබන වියළි මිරිස් කිලෝග්‍රෑම් 1ක් සඳහා පනවා ඇති සෘජු හා වක්‍ර බදු</u>

(ආ)

| | බදු වර්ගය | බදු අනුපාතය |
|---|---|---|
| කුඩු නොකළ හෝ නොඇඹරූ මිරිස් | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද | කි. ග්‍රෑමයට රු. 20.00 |
| කුඩු කළ හෝ ඇඹරූ මිරිස් | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද | කි. ග්‍රෑමයට රු. 25.00 |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මීළඟට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු ධර්මදාස බණ්ඩා මහතා පිළිබඳව 2011 අගෝස්තු මස 26වැනි දින කල් තබන ලද ශෝක ප්‍රකාශ යෝජනාව.

## ශෝක ප්‍රකාශය: ගරු ආර්.එම්. ධර්මදාස බණ්ඩා මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு ஆர்.எம். தர்மதாச பண்டா
## VOTE OF CONDOLENCE: HON. R.M. DHARMADASA BANDA

[අ. භා. 2.24]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ කැබිනට් අමාත්‍ය ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ අභාවය අපට දැන ගන්නට ලැබුණාම විශේෂයෙන් මම කනගාටුවට පත් වුණා. මොකද, මම එතුමා සමඟ 1977 පටන් බොහොම සමීපව කටයුතු කළ හිතෛෂී මිත්‍රයෙක් නිසා. ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ දේශපාලන වාර්තාව දිහා බලපුවාම ඇත්ත වශයෙන්ම ගැමි වාතාවරණය ඇති ප්‍රදේශයකින් දේශපාලනයට පිවිසිලා මේ රටේ වැදගත් සහ විශාල වග කීමක් දරපු ඇමතිවරයකු හැටියට තමයි ඔහුගේ ජීවිතය අවසන් කළේ.

ධර්මදාස බණ්ඩා මැතිතුමා 1964 දී තමයි දේශපාලන ජීවිතය ආරම්භ කරලා තිබෙන්නේ. ඒ අනුව ගණන් බැලුවාම වසර 46ක් අඛණ්ඩව දේශපාලනඥයෙක් හැටියට එතුමා කටයුතු කරලා තිබෙනවා. එතුමාගේ ඒ දේශපාලන වාර්තාව අනුව අපට පෙනෙනවා ඔහු මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක්, රාජ්‍ය ඇමතිවරයෙක් ඒ වාගේම අවසානයේ කැබිනට් ඇමතිවරයෙක් සහ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් හැටියටත් කටයුතු කරලා තිබෙන බව.

එතුමා තම වෘත්තීය ජීවිතය ආරම්භ කළේ ඉංග්‍රීසි ගුරුවරයෙක් හැටියටයි. ඊට පසුව එතුමා නීතිඥවරයෙක් හැටියටත් කටයුතු කළා. ඒ අනුව පෙනෙන්නේ ඔහු හොඳ අධ්‍යාපනයක් ලැබූ, උසස් අධ්‍යාපනයක් ලැබූ දක්ෂ පුද්ගලයෙක් බවයි. ඉංග්‍රීසි ගුරුවරයෙක් වීම ගැමි ප්‍රදේශයකින් පැමිණි මෙතුමාගේ විශේෂ දක්ෂකමක්. මොකද, බිබිල වාගේ ප්‍රදේශයකින් ඉංග්‍රීසි භාෂාව හදාරලා ඉංග්‍රීසි ගුරුවරයෙක් වෙන්න පුළුවන්කම තිබුණා නම් ඒක සුවිශේෂී දක්ෂකමක් හැටියටයි මම කල්පනා කරන්නේ. පසුව නීති විද්‍යාලයට බැඳී නීතිය හදාරා නීතිඥවරයෙක් හැටියටත් කටයුතු කළා. ඒ වාගේ දක්ෂකමක් තමයි ඔහු තබා තිබෙන දේශපාලන වාර්තාව.

අපි මෙතුමාගේ ක්‍රියා කලාපය දිහා බැලුවාම අපට පෙනෙනවා නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මී ළඟට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, you may continue.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොහු මුලින්ම නියෝජ්‍ය පේෂකර්ම ඇමතිවරයා හැටියට කටයුතු කළා. එවකට එක්සත් ජාතික පක්ෂ රජයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ ඇති වුණ ආර්ථික පෙරළියේ එක් අවශ්‍යතාවක් වූයේ මෙරට ජනතාවට අවශ්‍ය උසස් මට්ටමේ රෙදිපිළි ලබා දීමයි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ 1977 රජයේ තිබුණ අපේ කර්මාන්තශාලාවල තාක්ෂණය වැඩි කරලා, ඒ තාක්ෂණය තුළින් උසස් මට්ටමක රෙදිපිළි නිපදවන්න එතුමාගේ අමාත්‍යාංශය තුළින් එතුමා නායකත්වය දුන්නා.

එතුමා තුල්හිරිය, වේයන්ගොඩ, පූගොඩ, මත්තේගොඩ වැනි අලුත් කර්මාන්තශාලා පිහිටුවීමට හා ඒ කර්මාන්තශාලාවල උසස් තත්ත්වයේ රෙදි පිළි නිපදවීමේ කටයුත්තට දායකත්වයක් දක්වපු ඇමතිවරයෙක්. ඒ වාගේම උඩ රට ගැමි පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමේ දී පරිහානියට පත් වෙලා තිබුණු ඒ ගම්මාන දියුණු කිරීමට එතුමාට අවස්ථාව ලැබුණා. එතුමා කැබිනට් ඇමතිවරයකු හැටියට, විශේෂයෙන්ම කෘෂිකර්මාන්තය දියුණු කරන්න සුවිශේෂ දායකත්වයක් දැක්වූවා. මේ රට කෘෂිකාර්මික රටක්. කෘෂිකර්මයෙන් තමයි අපේ ආර්ථිකය ගොඩ නැඟුණේ. මේ රටේ ගොවි නිෂ්පාදන වැඩි කරන්නට, විදේශ ආධාර ලබා ගන්නට, ඒ ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් කටයුතුවලදී එතුමා තමන්ගේ දස්කම් පෑවා. එතුමා පැමිණියේ ගැමි ප්‍රදේශයකින් නිසා කෘෂිකර්මාන්තයේ යෙදී සිටින ගොවීන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව එතුමාට මනා දැනීමක් තිබුණා. එවැනි ඇමති ධුරයක් ලබන කොළඹ නැත්නම් කොළඹ අවට මන්ත්‍රීවරයකුට වඩා එතුමාට ගොවීන්ගේ අවශ්‍යතාව කුමක්ද කියන එක ගැන ප්‍රායෝගික දැනීමක් තිබුණා.

එතුමා කෘෂි රක්ෂණ මණ්ඩලය ඇති කිරීමට කටයුතු කළා. ඒ වාගේම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාවට නංවන්න එතුමා විශාල සේවයක් කළා. ඒවා කරන අතර, මොණරාගල ප්‍රදේශයේ අලුතින් ආරම්භ වුණු සීනි කර්මාන්තශාලාවට සහ උක් වගාවට එතුමාගෙන් සුවිශේෂ දායකත්වයක් ලැබුණා. කපු වගාව ආරම්භ කරන්නටත් එතුමා විශාල වැඩ කොටසක් කරලා තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ක්‍රමය ආරම්භ වුණාට පස්සේ හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් එතුමා මොණරාගල දිස්ත්‍රික් සංවිධායක හැටියට පත් කළා. මොණරාගල දිස්ත්‍රික්කයේ නායකයා හැටියට එතුමා බිබිල ආසනයට පමණක් නොව, මුළු මොණරාගල දිස්ත්‍රික්කයම දියුණු කරන්නට විශාල වැඩ කොටසක් කර තිබෙන බව අපට මේ වාර්තාවලින් බොහොම පැහැදිලිව දකින්නට ලැබෙනවා.

විශේෂයෙන්ම අධ්‍යාපනය, සෞඛ්‍යය, මං මාවත්, විදුලි සංදේශ, ජල යෝජනා ක්‍රම, නිවාස යෝජනා ක්‍රම කියන ඔය හැම දේ ගැනම එතුමා තුළ දැනීමක් තිබුණා. මන්ත්‍රීවරයකු හැටියට එතුමා එම ප්‍රදේශයේ එක කොට්ඨාසයකට කටයුතු කළා. නමුත් දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවන් පිළිබඳවත් එතුමාට සුවිශේෂී දැනීමක් තිබුණ නිසා හැම දෙයක් පිළිබඳවම එම දිස්ත්‍රික්කයේ සිටි අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් අනුශාසනා උපදෙස් දෙමින් ඒ දිස්ත්‍රික්කයම දියුණු කරන්නට කටයුතු කළාය කියන එක පිළිබඳව රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා එතුමාට පසුව පාර්ලිමේන්තුවට පැමිණියත් සාක්ෂි දරයි.

පැල්වත්ත හා සෙවණගල සීනි කර්මාන්තශාලා ඉදි කිරීමට ප්‍රධානත්වය ගෙන මඟ පෙන්වීමට එතුමාට හැකියාවක් ඇති වුණා. සීනි කර්මාන්තය උදෙසා, පුරන් වෙලා තිබුණු ඉඩම් අක්කර දහස් ගණනක උක් වගාව ඇති කරලා විශාල සංවර්ධනයක් ඇති කරන්න, ඒ ප්‍රදේශයම වැඩි දියුණු කරන්න එතුමාට හැකියාවක් ඇති වුණා.

මට මතකයි, එතුමා දිස්ත්‍රික් නායකයා හැටියට ගම් උදාව වැඩ පිළිවෙළ බුත්තල ප්‍රදේශයට අරගෙන මුළු දිස්ත්‍රික්කයම දියුණු කරන්නට ඒ ගම් උදාව උපයෝගී කර ගත්ත අන්දම. ඒ කාලයේ තිබුණු දර්ශනයක් තමයි මොනරාගල දිස්ත්‍රික්කය ලංකාවේ නොදියුණුම දිස්ත්‍රික්කයක් කියන එක. ඒ විධියට තමයි එදා අපි දැක්කේ. මොන හේතුවක් නිසා හෝ වේවා, හරිහමන් අධ්‍යාපන පහසුකම්, සෞඛ්‍ය පහසුකම් ආදී ජනතාවට අවශ්‍ය සේවා ඉතාම දුර්වල තත්ත්වයක තිබුණු වේලාවක ධර්මදාස බණ්ඩා මැතිතුමා දිස්ත්‍රික් නායකයා හැටියට ඒ දිස්ත්‍රික්කයට ඒවා ලබා දෙන්නට සුවිශේෂී කාර්යයක් කළාය කියන එකට මොනරාගල ජනතාව අනිවාර්යයෙන්ම සාක්ෂි දරයි.

අපි දන්නා තවත් කාරණයක් තමයි එතුමා දොඩම් වගාව නැවත නඟා සිටුවන්න උත්සාහ දැරුව බව. ඒ වාගේම සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳවත් දැඩි උනන්දුවක් දැක්වූවා. පිටිසර පළාත්වල ජනතාවට අවශ්‍යව තිබුණේ සමුපකාර ව්‍යාපාරය තුළින් ඔවුන්ගේ අවශ්‍යතාවන් ලබා ගන්නයි. ඒ නිසා ඒ කාර්ය භාරයට එතුමා අත දෙන්න යෙදුණා.

මේ සෑම දෙයක්ම කරන අතර, ආගමික වශයෙන්, 1996 වසරේ රුහුණු කතරගම මහා දේවාලයේ බස්නායක නිලමේ ධුරයෙන් පිදුම් ලැබුවා. එය විශාල වගකීමක් ඇති කාර්යයක්. මොකද, දහස් ගණන් බැතිමතුන් කතරගම මහා දේවාලයට වාර්ෂිකව පමණක් නොවෙයි දිනපතාම වාගේත් පැමිණෙනවා. ඒ අවස්ථාවලදී ඒ බැතිමතුන්ගේ අවශ්‍යතාවන් හා ආගමික වතාවත් මෙතුමාගෙන් මැනවින් ඉටු වුණාය කියන එකත් අපට දැන ගන්න ලැබුණා. මේ ආදී වශයෙන් මේ රටේ නොදියුණු පළාත්, ගම්බද පළාත් දියුණු කරන්න මන්ත්‍රීවරයකු හැටියටත්, ඇමතිවරයකු හැටියටත් එතුමා ගත්තු උත්සාහය ගැන අපි ඇත්ත වශයෙන්ම ආඩම්බර වෙනවා.

අද ගරු ධර්මදාස බණ්ඩා මහතාගේ අභාවය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කළ දෙවැනි දවස. පළමුවැනි දවසේ අපිට එතුමා ගැන කථා කරලා ඉවර කර ගන්න බැරිව ගියා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීන් විශාල සංඛ්‍යාවක් එදාත් කථා කළා ධර්මදාස බණ්ඩා මැතිතුමාගෙන් ඉටු වෙච්ච කාර්ය භාරය පිළිබඳව. අදත් එහෙමයි. අදත් එතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ කරන්න දෙපාර්ශ්වයෙන්ම ඉන්නවා මන්ත්‍රීන් විශාල සංඛ්‍යාවක්. ඒකෙන් පෙන්නුම් කරන්නේ මේ හිටපු ඇමතිවරයා ජනප්‍රිය ඇමතිවරයෙක් බවයි. පක්ෂ භේදයෙන් තොරව සියලු දෙනා එක්කම බොහොම සහයෝගයෙන් කටයුතු කළා වාගේම ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු හැටියට සෑම මන්ත්‍රීවරයෙකුගේම අවශ්‍යතාවන් වෙනුවෙන් කටයුතු කරපු නිසායි එහෙම වුණේ.

මේ වෙලාවේ එතුමාගේ භාර්යාව හා දූ පුතුන් මේ ගරු සභාවේ ගැලරියේ සිටිනවා. එතුමා අපේ පක්ෂය යටතේ තමයි දීර්ඝ කාලයක් දේශපාලනය කළේ. ඒ නිසා විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ කනගාටුව අපි ඒ අයට ප්‍රකාශ කර සිටිනවා.

එතුමාගේ අභාවයෙන් පසුව ඒ නායකත්වය ගෙන යන්න අපේ ඉදිරි පෙළේ ඉන්නවා බොහොම දක්ෂ මන්ත්‍රීවරයෙක්. ඒ අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා. එතුමා ගරු ධර්මදාස බණ්ඩා මහතාගේ සහෝදරයාගේ පුත්‍ර රත්නය. අපි දකිනවා එතුමාත් තමන්ගේ බාප්පාගේ කාර්ය භාරය හරියට ඉටු කරන්න උත්සාහ කරන බව. ඒ නියම තැන, නියම වෙලාවට ලැබෙයි. අපට ඒකේ කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ පුත්‍ර රත්නයත් පළාත් සභාවෙන් දේශපාලනය ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම ගැමි ජනතාව නඟා සිටු වන්න, පිටිසර ප්‍රදේශ නඟා සිටු වන්න ධර්මදාස බණ්ඩා මැතිතුමා ගත්ත උත්සාහය, ගෙන ගිය ඒ වැඩ පිළිවෙළ දිගින් දිගටම මේ දෙපළ අතින් කෙරෙනවාය කියන කාරණය මතක් කරන අතර, ධර්මදාස බණ්ඩා හිටපු ඇමතිතුමාට නිවන් සැප ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 2.37]

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)

(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දවසේත් අප ශෝකය ප්‍රකාශ කරනු ලබන්නේ මොනරාගල දිස්ත්‍රික්කයට, ඌව-වෙල්ලස්සට අපරිමිත සේවාවක් ඉටු කරපු, ඒ දිස්ත්‍රික්කයට සුවිශේෂී දේශපාලන නායකත්වයක් ලබා දීපු, මොනරාගල දිස්ත්‍රික්කයෙන් බිහි වූ විද්වතකු මෙන්ම, එම දිස්ත්‍රික්කයෙන් බිහි වූ පළමු නීතිඥවරයා වූ ගරු ආර්.එම්. ධර්මදාස බණ්ඩා හිටපු අමාත්‍යතුමාගේ අභාවය පිළිබඳවයි. මීට පෙර මෙම යෝජනාව ගෙන එන අවස්ථාවේ මම විදේශගත වෙලා හිටිය නිසා, මම එදින අපේ ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමාගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කළා නැවත එතුමා ගැන කථා කරන්න අවස්ථාවක් නොවුණොත් මාගේ ශෝකයත් දන්වන්න කියලා. මම එතුමාට ඒ ගැන ස්තුතිය පළ කරන ගමන්ම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා අද දිනයේ මෙවැනි සුවිශේෂී අවස්ථාවක් අපට ලබා දීම සම්බන්ධයෙන්.

තම ආදරණීය සහෝදරයාගේ අකල් වියෝවින් අනතුරුව ඒ දිස්ත්‍රික්කයේ සමාජ මෙහෙවර ඉටු කරන්නට අභාවප්‍රාප්ත අපේ ධර්මදාස බණ්ඩා හිටපු අමාත්‍යතුමා සුවිශාල මෙහෙවරක් කළා. එතුමා බිබිල, මොනරාගල ප්‍රදේශවලට පමණක් නොවෙයි, වැල්ලවාය මැතිවරණ කොට්ඨාසයටත් විවිධ අභියෝග මධ්‍යයේ අඛණ්ඩව විශාල සේවාවක් ඉටු කළා. දේශපාලන ක්ෂේත්‍රයට පමණක් නොවෙයි, රුහුණු කතරගම මහා දේවාලයේ බස්නායක නිලමේතුමා හැටියට ආගමික සහ සාමාජයීය වශයෙනුත් සේවාවන් රැසක් ඉටු කරන්නත් එතුමා කටයුතු කළ ආකාරය මට මතකයි. එක්තරා අවස්ථාවක මේ රටේ පැවැති සිවිල් අරගලයකදී එතුමා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න කටයුතු කරන අතරතුර, ඒවා නොඉවසූ පිරිසක් දේවාලයේ පෙරහැරේ යන විට එතුමාට ප්‍රහාරයක් එල්ල කරන්නට පවා කටයුතු කරපු අවස්ථාවක් තිබුණා. ඒත් එතුමා ඒ එකකින්වත් සැලෙන්නේ නැතිව තමන් කරපු ඒ සේවාව ඉටු කරන්නට අවශ්‍ය පියවර ගත්තා. එතුමාගේ සහෝදරයාගේ පුත්‍ර රත්නය -අප හිතවත් රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා- සංවර්ධන සභාවේ සභාපතිවරයා හැටියට පත් කරලා, පළාත් සභාවේ අමාත්‍යවරයකු හැටියට පත් කරලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට පත් කරන්න, ඒ මඟ පෙන්වන්න ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා විශාල කර්තව්‍යයක් කළ බව මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕනෑ.

ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට හරීන්ද්‍ර ධර්මදාස මැතිතුමාත් තමන්ගේ ආදරණීය පියාණන් පෙන්වූ මඟ ඔස්සේ, ලිලානි ධර්මදාස මැතිනියගේ -තමන්ගේ ආදරණීය මෑණියන්ගේ-

[ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා]

ගුරුහරුකම් මැද්දේ ධර්මදාස බණ්ඩා මැතිතුමා කළ සේවාව අඛණ්ඩව, එලෙසම ඉටු කරන්න කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම විමලසුරේන්ද්‍ර සහෝදරයාත්, චමිලා සහ නාලිකා කියන සහෝදරියනුත් තම ආදරණීය පියාණන් විසින් යහමඟට ගෙන ආපු දරුවන් හැටියට, පියාගේ අඩි පාරේ යමින් එතුමාට ගෞරවයක් හැටියට එතුමාගේ ඒ සමාජ මෙහෙවර ඉටු කරන්න කටයුතු කරන ආකාරය විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

1977 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂ රජය බලයට පත්වීමත් එක්ක එතුමා පේශකර්ම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට පත් වෙලා, ඉන් අනතුරුව උඩ රට ගැමි පුනරුත්ථාපන අමාත්‍යවරයා හැටියට කටයුතු කළා. අවුරුදු ගණනාවක් ගියා, මම හිතන හැටියට අවුරුදු 13ක් ගියා, වෙල්ලස්සට කැබිනට් අමාත්‍ය ධුරයක් ලබා දෙන්න. එතුමා මොනරාගල දිස්ත්‍රික්කයෙන් පත් වෙච්ච පළමුවැනි කැබිනට් ඇමතිවරයා හැටියට 1989 දක්වා කටයුතු කළා. මම හිතන හැටියට ඊට පෙර එවැනි තනතුරක් මොනරාගල දිස්ත්‍රික්කයට ලැබුණේ නැහැ. මොනරාගල දිස්ත්‍රික්කයට ලැබුණු පළමුවැනි කැබිනට් අමාත්‍ය තනතුර එතුමාට ලබා ගන්නට හැකියාව ලැබුණා. මොනරාගල දිස්ත්‍රික්කයේ පළමුවැනි කැබිනට් ඇමතිවරයා වශයෙනුත්, පළමුවැනි නීතිඥවරයා වශයෙනුත් පත්වීමේ ගෞරවය ලබා ගන්න අපේ අභාවප්‍රාප්ත ධර්මදාස බණ්ඩා මැතිතුමාට හැකියාව ලැබුණු බව විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

අපි එතුමාගේ සේවාව ගැන පුළුල් වශයෙන් කථා නොකළත්, විශේෂයෙන්ම වෙල්ලස්සේ මුළු මහත් ජනතාවම බොහොම ගෞරවයෙන් එතුමාගේ සේවය සිහිපත් කරනවා. ඒ නිසා මම ඒ ගැන දීර්ඝව කථා කරන්න මෙය අවස්ථාවක් කර ගන්නේ නැහැ.

අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට පත් වෙන කොටත් මේ රටේ අවුරුදු තිහක් තිස්සේ පැවති යුද්ධය නිසා අපට නිදහසේ ජීවත් වන්න වාතාවරණයක් තිබුණේ නැහැ. බිබිල මැතිවරණ කොට්ඨාසයේ ගල්ගමුව ප්‍රදේශය ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරවලට ලක් වුණා. මොනරාගල දිස්ත්‍රික්කයේ ඇතිමලේ, කොටියාගල ප්‍රදේශ තර්ජන, ගර්ජනවලට ලක් වුණා.

ගම්වලට ඇවිල්ලා කපලා, කොටලා, මරලා දැම්මා. ඒ වාගේම ඔක්කම්පිටිය, මාලිගාවිල, නියදැල්ල ප්‍රදේශ එවැනි තත්ත්වයන්ට පත් වුණා. අවුරුදු 30ක් අපට නිදහසේ ජීවත් වීමේ වාතාවරණයක් තිබුණේ නැහැ. මාවිල් ආරු සොරොව්ව වහලා අපේ ජනතාවට අවශ්‍ය ජලය ටික ලබා ගන්න බැරි වන කොට, ඒ සඳහා මානුෂික මෙහෙයුමක් දියත් කරන කොට, අවුරුදු එකහමාරක් දෙකක් තුළ ඒ මානුෂික මෙහෙයුම ජයග්‍රාහී තත්ත්වයට පත්වෙලා නැඟෙනහිර පළාතම ජයග්‍රහණය කරලා සිලාවතුරෙන් ආරම්භ කරලා උතුරුකරයේ ජයග්‍රහණය කරා යන කොට සමහර පක්ෂ එකතුවෙලා ආණ්ඩුව පෙරළන්න, අතිගරු ජනාධිපතිතුමාව අධෛර්යයට පත් කරන්න, ඒ කර ගෙන ගිය යුද්ධය නතර කරවන්න කැස කවපු අවස්ථා තිබුණා. එක් අවස්ථාවක අය වැයෙන් ආණ්ඩුව පරද්දන්න කටයුතු කළා මට මතකයි. දැන් මොන මතයේ සිටියත් එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක ගරු කරු ජයසූරිය මැතිතුමා, ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා, ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා, ගරු පී. දයාරත්න මැතිතුමා, ගරු එස්.බී. දිසානායක මැතිතුමා, ගරු ජී.එල්. පීරිස් මැතිතුමා, ගරු රාජිත සේනාරත්න මැතිතුමා, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා, ගරු සූරියආරච්චි මැතිතුමා ඇතුළු කණ්ඩායම ඒ අවස්ථාවේ දේශ හිතෛෂීයයන් හැටියට කටයුතු කිරීම ගැන අප ස්තුතිවන්ත වනවා. මම ඒ සියලු දෙනාගේම නම් සඳහන් කළේ නැහැ. කුමන දේශපාලන මතයක සිටියත්, අපේ රටට අවශ්‍යම වන අවස්ථාවක මේ රට එක්සේසත් කරන්න නායකත්වය දුන්නු පිරිසෙන් ඒ නිර්භීත නායකත්වය ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා ලබා දුන්නාය කියන එක මේ අවස්ථාවේ එතුමාට කරන ගෞරවයක් හැටියට මා සිහිපත් කරන්න කැමැතියි. මම එලෙස සඳහන් කළේ ඇයි? ඒ අවස්ථාවේ අතිගරු ජනාධිපතිතුමා ශක්තිමත් ලෙස යුද්ධය පවත්වාගෙන ගිහිල්ලා එහි ජයග්‍රහණය පෙනී පෙනී තිබෙන අවස්ථාවේ ඒ කණ්ඩායම අපට සහාය වුණේ නැත්නම්, රජය වෙනස් වීමක් වුණා නම්, එහෙම නැත්නම් රජය දෙකඩ වීමක් වුණා නම් බොහෝ වෙලාවට අපට මීට වඩා කනගාටුදායක තත්ත්වයකට මුහුණපාන්නට ඉඩ තිබුණා.

ඒ නිසා විශේෂයෙන්ම ඒ යුද්ධය ජයග්‍රහණය කළ අතිගරු ජනාධිපතිතුමන්, ඒ යුද්ධය ජයග්‍රහණය කළ ත්‍රිවිධ හමුදාව, මේ රජය රැක ගන්න එදා ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම වාගේම ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා ඇතුළු ඒ කණ්ඩායම අපට ලබා දුන්නු ඒ ශක්තිය මේ යුද ජයග්‍රහණයේ සිහිවටනයක් හැටියට අපි සඳහන් කරන්න කැමැතියි. එය ඉතිහාස ගත වන අවස්ථාවක් බව එතුමාට කරන ගෞරවයක් වශයෙන් අපි සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමාගෙන් පස්සේ අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට ඒ ශක්තිය ලබා දුන්නා. ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ අපි එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලා සිටිනවා, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාට නිසි තැන දෙන්න, එතුමාට අසාධාරණයක් කරන්න එපා කියලා. එක්සත් ජාතික පක්ෂය ඒ අසාධාරණය කරන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවටයි කියන එක මා මේ අවස්ථාවේ සිහිපත් කරන්න කැමැතියි. [බාධා කිරීමක්] ශෝක ප්‍රකාශ යෝජනාවේදී තමයි මේක කියන්න ඕනෑ. [බාධා කිරීමක්] මේක කියන්න ඕනෑ, මේ අවස්ථාවේදීයි. මේක ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ- [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පක්ෂය ගැන condolence දාන්න එපා.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
එතුමා වෙනුවෙන්, එතුමාට ගෞරවයක් දක්වනවා නම් ඒ සැබෑ ගෞරවය ලබා දෙන්න මෙය අවස්ථාවක් කර ගන්නය කියන එකයි මා මේ ප්‍රකාශය කරන්නේ. මා දන්නවා, ගරු ජෝන් අමරතුංග මැතිතුමා ඒකට කැමැති බව. මම දන්නවා, ගරු දයාසිරි ජයසේකර මැතිතුමා අත් දෙකම ඔසවලා ඒකට කැමැති වන බව. ගරු සුජීව සේනසිංහ මැතිතුමා ඒ සඳහා කැමැතියි. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා නම් ටිකක් දෙපැත්තට අදිනවා. ඒක වෙනම කථාවක්. මම ඒ ගැන කථා කරන්නේ නැහැ. විශේෂයෙන් - [බාධා කිරීමක්] ඔබතුමාත් කැමැතියි. අර මා කිව්වේ. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් කැමැතියි.

ඒ නිසා මේ ශෝක ප්‍රකාශ යෝජනාව ගෙනෙන අවස්ථාවේ- [බාධා කිරීමක්] මම කියන්නේ ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා ගෙන ගිය ඒ නායකත්වය, ඒ මහ පෙන්වීම ගෙන යන්න එතුමාට ඉඩ දෙන්නය කියන එකයි. ඒ මහ කඩන්න දෙන්න එපාය කියන එකයි මා කිව්වේ. මාතෘකාවෙන් පිට යන්න හොඳ නැහැ. තමන්ගේ බාප්පා ආපු ගමන් මහ යන්න එතුමාට අවස්ථාව දෙන්නය කියන එකයි මා කිව්වේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ අවස්ථාවේ ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ආදරණීය බිරිඳ වූ ලීලානි ධර්මදාස මැතිනියටත් ඒ

වාගේම පුතණුවන් දෙදෙනා වන හරීන්ද්‍ර ධර්මදාස සහ විමලසුරේන්ද්‍ර ධර්මදාස යන මැතිතුමන්ලාටත්, දියණියන් දෙදෙනා වන චමිලා ධර්මදාස සහ නාලිකා ධර්මදාස යන මැතිනියන් ඇතුළු පවුලේ සියලුම දෙනාටමත්, අපේ හිතවත් ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා ඇතුළු ඒ පවුලේ ඥාති, හිතවත් සියලු දෙනාටමත් මගේ පෞද්ගලික ශෝකයත්, පවුලේ හිතවතුන් හැටියට මගේ සහෝදරයා එක්ක බොහොම ළඟින් කටයුතු කරපු අය හැටියට ඒ පවුලේ පෞද්ගලික ශෝකයත්, වෙල්ලස්සේ ආදරණීය ජනතාවගේ ශෝකයත්, ඒ වාගේම සමස්ත අපේ පක්ෂයේ ශෝකයත් පළ කරමින් අප අතරින් වෙන් වූ ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමාට අමා මහ නිවන් සුව අත්වේවායි පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 2.49]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මූලාසනය හොබවන ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා සමඟ ඇසුරු කළ, එකම අමාත්‍ය මණ්ඩලයේ සිටි ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ වියෝව පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ මටත් එතුමා ගැන වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්න වෙනවා. මේ තොරතුරු ටික දිහා බලා ගෙන යන කොටත් මේ කරපු කථාවල විස්තර දිහා බලන කොටත් මට වෙනස් අදහසක් මතු වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා මැදගම ගම්මුලාදෑනි රත්නායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා මහතාගේ පුත්‍ර රත්නයක්. එතුමා ඌව වෙල්ලස්සෙන් බිහි වූ අධිනීතිඥවරයකු හැටියටත්, දක්ෂ ක්‍රීඩකයකු හැටියටත් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම ගුරු වෘත්තියේත්, නීතිඥ වෘත්තියේත් කටයුතු කර තිබෙනවා. එතුමා දේශපාලනයට ඇවිත් තිබෙන්නේ 1964දී. වසර 46ක් දේශපාලන ජීවිතයේ ඉඳලා තිබෙනවා. එතුමා පළමුවෙන්ම 1964 මැදගම්පත්තුව ගම් සභාවේ සභාපති හැටියට පත් වෙලා එම ධුරයේ වැඩ කර තිබෙනවා. මා මේ කිව්වේ එතුමාගේ දේශපාලන ගමන් මඟත්, ගමේ නායකත්වයත්, කර ගෙන ආපු වැඩ පිළිවෙළත් පිළිබඳවයි.

මට හිතෙන විධියට, එතුමා 1965 දී බිබිලේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියට පත් වුණාට පස්සේ 1977 ඉඳලා 1989 වෙන කල් පේශකර්ම නියෝජ්‍ය අමාත්‍ය ධුරයත්, 1989 ඉඳලා 1990 වන කල් උඩරට ගැමි පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය ධුරයත්, 1990 ඉඳලා 1994 වන කල් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍ය ධුරයත් දරා තිබෙනවා. 1990 ඉඳලා 1994 කාල පරිච්ඡේදයේ තමයි එතුමා කැබිනට් ඇමතිවරයකු හැටියට කටයුතු කර තිබෙන්නේ. ඊට පස්සේ එතුමා විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක ධුරයත්, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයත්, නැවත අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍ය ධුරයත් දරා තිබෙනවා. වෙල්ලස්සෙන් බිහි වුණු බුද්ධිමත් නායකයකු වූ එතුමාගේ දීර්ඝ දේශපාලන ඉතිහාසය තුළ මේ රටට වැඩ කරන්නට පුළුවන් සුවිශේෂ අමාත්‍යාංශයක් එතුමාට ලැබුණේ නැහැ කියන එකයි මගේ පුද්ගලික හැඟීම.

එතුමාගේ ජීවිත කාලය තුළ අපට දකින්න ලැබුණු ඉතාම වැදගත් කාරණා කීපයක් තිබෙනවා. මම දැක තිබෙනවා, රජයේ අමාත්‍යවරයකු හැටියට එතුමා සිටි කොළඹ ගෙදරට එතුමා හම්බ වෙන්න බිබිල පැත්තෙන් සෙනඟ ආපු හැටි. එම ගෙදරට අතිවිශාල සෙනඟක් ආවා. එතුමා ඒ සෑම කෙනකුටම කෑම බීම දීලා තමයි පිටත් කළේ. මේක සුවිශේෂී කාර්යයක් හැටියට අපි දකිනවා. ඒ පිළිබඳව මා හොඳට දන්නා නිසා තමයි ඒ තත්ත්වය පැහැදිලිව අවබෝධ කර ගෙන තිබුණු නිසා තමයි මා මේ කාරණය කියන්නේ.

ඒ බිබිලේ ඉඳලා එන ජනතාවට එතුමාගේ මැතිනිය කොයි තරම් ආදරයෙන් සැලකුවාද කියන එකත් මේ අවස්ථාවේ දී සඳහන් කිරීම මගේ විශේෂ යුතුකමක් බවට පත් වෙනවා. ඒ වාගේම තමන්ගේ දේශපාලන ජීවිතයේ දී තමන්ගේ එක් පුතනුවකු පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට පත් කරන්නටත්, තමන්ගේම සහෝදරයාගේ පුත්‍ර රත්නය වන රංජිත් මද්දුමබණ්ඩාර මේ අපේ ආදරණීය නායකයාව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හැටියට පත් කරන්නටත් එතුමා දේශපාලන පසුබිම සකස් කරලා තිබුණා. මා හිතන්නේ මේ ඉතාම වැදගත් කරුණු කිහිපයක් කියලායි.

එතුමාගේ අමාත්‍යාංශය තුළින් මේ රටට කෙරුණු වැඩ පිළිබඳව මා නැවත නැවතත් කියන්නට යන්නේ නැහැ. ඊට පිටස්තර යමක් සඳහන් කිරීම මගේ යුතුමක් කියලා මා හිතනවා. සෑම ශෝක ප්‍රකාශ යෝජනා අවස්ථාවකදීම මා එය මතක් කර තිබෙනවා. ධර්මදාස බණ්ඩා මැතිතුමා මේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ අද සිටින මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් ගන්නට පුළුවන් අපූරු චරිතයක් බව සඳහන් කරන්නට පුළුවන්. ගාමිණී ලොකුගේ මැතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. පී. දයාරත්න මැතිතුමා ඇතුළු හුඟාක් දෙනෙක් ඉන්නවා. එතුමා මේ පාර්ලිමේන්තුව තුළ වැඩ කරපු ආකාරය, එතුමා ඇමතිවරයෙක් හැටියට වැඩ කරපු ආකාරය අපි දැක තිබෙනවා. ඒ සෑම වෙලාවකදීම අපි දැක්කේ එතුමා ඉතාමත්ම ශ්‍රේෂ්ඨ, නීතිගරුක, යහපත් දේශපාලනඥයකු ලෙස කටයුතු කළ ආකාරයයි. එවැනි දේශපාලනඥ ස්වරූප දැන් දකින්නට අඩුයි. තව අය ඉන්නවා. මැරුණාට පසුව තමයි ඒ අය ගැන කියන්නේ. දැන් කියන්න හොඳ නැහැ. එහෙම කියන්න ගියාම මේ ශෝක ප්‍රකාශ යෝජනා අවස්ථාව, වෙන එකක් වෙනවා නේ. එවැනි චරිත තුළින් මේ දේශපාලනය ඔපවත් වුණා.

අද මේ පාර්ලිමේන්තුවේ සමහර අවස්ථාවලදී අපි හැසිරෙන ආකාරය දිහා බලනකොට - මා ඒ ගැන කාටවත් ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. ඒකයි, මා "අපි" කියලා කිව්වේ.- එදා ඒ අපේ ශ්‍රේෂ්ඨ නායකයන් මේ පාර්ලිමේන්තුවේ තබා ගිය ඒ ශ්‍රේෂ්ඨ ගරුත්වය අද නැතිවීම අපට කනගාටුවක්. ඒ නිසයි එදා මේ පාර්ලිමේන්තුව තුළ නායකත්වය අරගෙන කථා කරපු, ඒ ශ්‍රේෂ්ඨ නායකයින් අතරට හිමිකම් කියපු ධර්මදාස බණ්ඩා මැතිතුමා ගැන අද ගෞරවයෙන් සිහිපත් කරන්නේ. මේ පාර්ලිමේන්තු ඉතිහාසය ගැන අපි නැවතත් කියවන දවසක, අපේ අනාගත පරපුර නැවතත් කියවන දවසක ඉතා ආඩම්බරයෙන්, ගරුත්වයෙන්, ශ්‍රේෂ්ඨත්වයෙන් සිහිපත් කරයි, මේ පාර්ලිමේන්තුව තුළ ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ ඒ ජීවන චරිතය.

අපි අද එතුමාගේ ගුණ සිහිපත් කරන වෙලාවේ, මට විශේෂයෙන්ම නැවත වරක් එතුමාගේ මැතිනිය ගැන කියන්නට සිදු වනවා. ඒ මැතිනියක්, දරුවනුත් එතුමා මේ රටට දායාද කරලා ගිය ඉතාම ශ්‍රේෂ්ඨ වස්තූන් බව කියන්නට ඕනෑ. ඒ අය ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ එම ජීවන චරිතය තුළම, පැවැත්ම තුළම මේ සමාජයේ ජීවත් වන ඉතා ශ්‍රේෂ්ඨ භාර්යාවක්, දරුවන් පිරිසක් බව කියන එක මගේ යුතුකමක් හැටියට මා සලකනවා.

කෙසේ වුවත් එතුමා අපේ පක්ෂය අත්හැර ගිහිල්ලා ආණ්ඩුවට බැඳුණත් තමන්ගේ යුතුකම් ඉටු කිරීම, තමන්ගේ ප්‍රදේශයට සේවය කිරීම, මේ රට වෙනුවෙන් කටයුතු කිරීම ඉතාම ශ්‍රේෂ්ඨ ගුණයක් ලෙස සලකා තමයි කෙරුවේ. ඒ නිසා අද අපිට එතුමා ගැන සන්තෝෂ වන්නට පුළුවන්. මනුෂ්‍යයෙක් ඉපදුණොත් මැරෙන බව සත්‍යයි. අපේ කතෝලික ආගමේ හැටියට දෙවියන් වහන්සේ අපට ලබා දුන් යම් කාර්යක් ඉෂ්ට කිරීමේ දී දෙවියන් සතුටු වන පිළිවෙළට එය ඉෂ්ට කිරීම තමයි වැදගත් වන්නේ. ඒ වාගේම බෞද්ධ ධර්මය අනුව ශ්‍රේෂ්ඨ බෞද්ධයකු වූ ධර්මදාස බණ්ඩා මැතිතුමාත් ඒ ලැබුණු වරම අනුව ඒ ආකාරයෙන්ම ශ්‍රේෂ්ඨත්වයෙන් කටයුතු ඉෂ්ට කරලා ඉතාම හොඳ

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

දේශපාලනඥයකු, ඉතාම හොඳ ස්වාමි පුරුෂයකු, ඒ වාගේම ඉතාම හොඳ බෞද්ධයකු විධියට තමන්ගේ ජීවිත කාලයේ දී කරන්නට තිබුණු ඒ උසස්ම සේවය කරලා අවසානයේ එතුමා අපව අත්හැරලා ගියා. එතුමාගේ ගුණ සිහිපත් කරනකොට මේ ආදර්ශය මා විශේෂයෙන් මතක් කරන්නේ අපි සියලුම දෙනාට වැදගත් නිසයි.

දේශපාලන ජීවිතයේදී එතුමාට ලැබෙන්නට තිබුණු තනතුරු හරි හැටියට ලැබුණේ නැහැ කියන එකයි මගේ පෞද්ගලික හැඟීම වන්නේ. නමුත් එතුමා ඉවසීමෙන් කටයුතු කරලා මේ රටට විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයට අතිවිශාල සේවයක් ඉෂ්ට කළා. ඒ ඉවසීම, ඒ ශ්‍රේෂ්ඨත්වය තුළ අද අපි එතුමා සිහිපත් කරන්නේ මේ රටට ආදර්ශවත් නායකයෙක් විධියටයි; ඒ වාගේම මේ උත්තරීතර පාර්ලිමේන්තුවට -අපට- ආදර්ශයට ගන්න පුළුවන් උත්තරීතර නායකයෙක් විධියටයි.

මා මීට වඩා කථා කරන්නේ නැහැ. පෞද්ගලිකව මගේත් මගේ පවුලේත්, මගේ දරුවන්ගේත් ශෝකය එතුමාගේ ආදරණීය භාර්යාවට, දරුවන්ට ඒ වාගේම අපේ ගරු රංජිත් මද්දුමබණ්ඩාර මන්ත්‍රීතුමාට සහ ඌව වෙල්ලස්සේ ජනතාවට ප්‍රකාශ කරමින් එතුමා බලාපොරොත්තු වුණු නිවන් සම්පත්තිය එතුමාට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 3.00]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු ගරු ධර්මදාස බණ්ඩා අමාත්‍යතුමාගේ අභාවය ගැන අද පාර්ලිමේන්තුවේ ශෝකය පළ කරන අවස්ථාවේදී ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන් අපටද වචනයකින් එයට එකතු වීමට අවස්ථාව ලැබීම සතුටක්. ඌව වෙල්ලස්ස, පහළ ඌව ඇතුළත්ව අයත් වන්නේ ඒ ඓතිහාසික සටන් භූමියටයි. එදා නොවහල් නිදහස්කාමී ජනතාවක් හැටියට අධිරාජ්‍යවාදයට විරුද්ධව නැඟී හිටපු වෙල්ලස්සේ ජනතාවගේ උරුමයේ ප්‍රතාපවත්බව ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ මුහුණේ හරස්කඩ තුළ මා දුටුවාය කියන එක මම අවංකව කියන්න ඕනෑ. එවැනි පෙනුමක් ඔහුගේ රූපයේ තිබුණා.

ඇත්තටම මා පෞද්ගලිකව ඇසුරු කළ කෙනෙක්, මිතුරුකම් පැවැත්වූ කෙනෙක් නොවෙයි එතුමා. නමුත් යම් යම් අවස්ථාවල විශේෂයෙන්ම කෘෂිකර්මය ගැන, ගොවිතැන් ගැන අපි එතුමා සමඟ කථාබස් කළා. එතුමා ජීවත් වුණේ කෘෂිකර්මය හා ගොවි ජනතාව වට කරගෙන. වෙනත් වචනවලින් කියනවා නම්, එතුමාගේ ජීවිතය ගොවි ජනතාව හා ගොවිතැන ඇසුරු කර ගත් කේන්ද්‍රයක් වුණා. මට මතකයි, වරක් එතුමා සමඟ විවාදයක පටලැවී ඉඳිද්දි මම කිව්වා, ඔබතුමාගේ රජය ගොවිතැනට හා ගොවි ජනතාවට හිත ඇතිව රාජ්‍ය ප්‍රතිපත්ති තීන්දු කරන්නේ නැත්නම් -ඒ නිදහස් ආර්ථිකය යටතේ; විවෘත ආර්ථිකය යටතේ- ඔබතුමා වැනි බණ්ඩා කෙනෙක් කෘෂිකර්ම ඇමති වුණත් ගොවි ජනතාවට කරන්න පුළුවන් දෙයක් නැහැ කියා. මොකද, "බණ්ඩා" කියන නාමය ඌව වෙල්ලස්ස පොදු ජනතාවගේ නාමයක් හැටියට -ගොවිතැනේ නාමයක් හැටියට; ගොවි ජනතාවගේ පොදු නාමය හැටියට- අපට සලකන්න පුළුවන්. ඒ නිසයි මම කිව්වේ, රාජ්‍ය ප්‍රතිපත්තිවල වරදක් තිබෙනවා නම් බණ්ඩා කෙනෙක් කෘෂිකර්ම ඇමති වුණත් කරන්න දෙයක් නැහැ කියා. එතුමාට සීමිත කර්තව්‍යයක් ඉටු කරන්න පුළුවන්. මට මතක හැටියට ඌව වෙල්ලස්ස ජනතාවගේ හද පතුලින්, ජනතා පතුලින් එතුමා තමයි මතු වුණේ.

මට මතකයි, ඒ කාලයේ මොනරාගල ආසනයේ බිබිල ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් හිටියේ -ඔය පැත්තෙන් හෝ මේ පැත්තෙන්- මේ මහා ව්‍යාපාරික ධනවතුන් බව; මහා වතු අයිතිකාර ව්‍යාපාරිකයින් බව. ඒ අය සියලු දෙනාම ඒ පළාතේ වතු වවන්න ගිය අය, වෙනත් ව්‍යාපාර ආරම්භ කරන්න ගිය අය. ඒ අය ඒ පළාතේ මහ ජනයාගේ බලයේ නියෝජිතයෝ බවට පත් වුණා. පළමු වතාවට ඒ පළාතේ ජනතාවගේ හදවතින් ආ, ජනතාවගේ පතුලින්ම මතු වී ආ නායකයෙක් හැටියට ධර්මදාස බණ්ඩා මැතිතුමා මට මතක් වෙනවා.

එතුමා ඌව වෙල්ලස්සේ උරුමය, ඒ ගොවි ජනතාවගේ උරුමය ගම් කාර්ය සභාව මඟින්, පාර්ලිමේන්තුව මඟින් හා අමාත්‍ය මණ්ඩලය මඟින් නැවතත් ඒ පළාතේ ජනතාව අතට දිනා දුන්නාය කියා කිව්වොත් එය නිවැරැදියි, සත්‍යයි කියා මා විශ්වාස කරනවා. ඇමතිවරයකු හැටියට එතුමා කෘෂිකර්මය ගැන, ගොවි ජනතාව ගැන බොහොම භක්තියකින්, කැප වීමකින් ක්‍රියා කළා. ඇත්තටම ගොවි විශ්‍රාම වැටුප ගැන එතුමා ඉදිරිපත් කළ යෝජනාව ඒ ආකාරයට ක්‍රියාත්මක වුණා නම් අද මුහුණ දෙන අර්බුදය, ගැටලුව ඇති වන්නේ නැහැ. විශ්‍රාම වැටුප් පිළිබඳව එතුමාගේ යෝජනා, අදහස් ක්‍රියාත්මක වුණේ නැති බවටයි මට තොරතුරු ලැබී තිබෙන්නේ.

අපි එතුමා සමඟ කථා කරපු හැම වෙලාවකම කථා කළේ ගොවි ජනතාවගේ නිෂ්පාදනවලට ලැබෙන මිල පිළිබඳ ප්‍රශ්නයයි. තවත් අතකින්, ඒ පළාත්වල ගොවි ජන ජීවිතයට අත්‍යවශ්‍ය වූ ජල ප්‍රශ්නය පිළිබඳවත් අපි කථා කළා. ඒ ජනතාවගේ ගොවිතැන් කටයුතුවලට වුවමනා කරන මූලධන වියදම් දැරීමේදී ගිනි පොලීකාරයින්ගෙන් ඔවුන්ව බේරා ගෙන, ජල සැපයුමක් ලබා දීලා, ඒ මිනිසුන්ගේ නිෂ්පාදනවලට නියම මිලක් ලබා දීමට එතුමාගේ හිත තුළ තිබුණු අභිප්‍රාය ගැන නම් මට කිසිම සැකයක් නැහැ. එතුමා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ සිටි කාලයේදී එසේ සිතුවත් එය ක්‍රියාවට නැඟීම සම්බන්ධයෙන් වෙනත් ප්‍රශ්නයක් තිබුණා.

එතුමාගේ ජීවිතය මෙසේ විකාශනය වී ඇවිත්, අවසානයේ එතුමා ප්‍රගතිශීලී පාර්ශ්වයට නැඹුරු වීමට හේතු වූ කාරණය එක සිද්ධියක් නොවෙයි. මා විශ්වාස කරන හැටියට සිද්ධි දාමයක් එයට හේතු වුණා. ඒ සිද්ධි දාමයේ අවසාන අවස්ථාව තමයි එතුමා ප්‍රගතිශීලී කඳවුරට එකතු වීම.

ඇත්තටම දෛවයේ හමු වීමක් වාගේ එක් දිනක් මා යම් පරීක්ෂණයක් සඳහා සෙන්ට්‍රල් රෝහලට ගිහින්, එහි lift එකෙන් ඇතුළු වුණාට පස්සේ රෝද පුටුවක අසුන් ගෙන දියණියත් සමඟ උඩට යමින් සිටි අපේ ධර්මදාස බණ්ඩා මැතිතුමා මට හමු වුණා. එතකොටයි මා දැන ගත්තේ, එතුමා එතරම් බරපතළ අසනීපයකින් සිටින බව. මා අතට අත දීලා, එතුමාට සුවය ලැබේවායි කියා ප්‍රාර්ථනා කළා. ඉන් කිහිප දිනකට පසුව එතුමාගේ අභාවය ගැන මට දැන ගන්නට ලැබුණා. මේ විධියට එතුමාටත්, මටත් සම්බන්ධ වීමට හැකි වූ තැන් ගණනාවකුත්, අපූරු විධියකට අපව සම්බන්ධ කරපු අවස්ථා කිහිපයකුත් තිබුණා. වරක් එතුමාගේ වාහනය ඇහැලියගොඩ අපේ ආසනය තුළ එක් තැනකදී පාරෙන් පිටට පැනලා අනතුරක් සිදු වුණා. එම අවස්ථාවේදීත් මා එතැන සිටියා, එතුමාගේ වුවමනාවන් ගැන බලන්න. මේ විධියට අහඹු ලෙස හෝ හමු වීම, එක් වීම හා කථා බස් කිරීම තුළ එතුමා ගැන විශේෂ ප්‍රසාදයක් මා ඇති කර ගත්තා.

එතුමා වෙනුවෙන් කරන ශෝක ප්‍රකාශයේදී එතුමා විසින් ඌව වෙල්ලස්සේ ජනතාවටත්, පොදුවේ මේ රටේ ජනතාවටත් ඉටු කරන ලද මෙහෙවර සිහිපත් කරමින්, එතුමාට හරසර දක්වමින්,

එතුමාට ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ ආචාරය පුද කරමින්, විශේෂයෙන් අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාටත්, ඒ වාගේම ධර්මදාස බණ්ඩා මැතිනිය ඇතුළු පවුලේ සියලු දෙනාටත් මගේ හද පත්ලෙන් නැඟෙන සංවේගය පළ කරමින් මා නිහඬ වනවා.

[අ. භා. 3.07]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු අමාත්‍ය ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ශෝක යෝජනාවේදී එතුමා ගැන වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගෞරවයක් කොට මා සලකනවා. විශේෂයෙන් අවුරුදු 46ක දේශපාලන ඉතිහාසයේ අත් දැකීම් සමුදායක් එක්ක වැඩ කරපු නායකයකු වූ එතුමාගෙන්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට අපට ඉගෙන ගන්න දේවල් රාශියක් තිබෙනවා. 2004 දී මා පාර්ලිමේන්තුවට ආවාට පස්සේ පසු ගිය අවුරුදු ගණනාව තුළ එතුමාත් එක්ක ගත කරපු කාල වකවානුවේ එතුමාගෙන් අපට ඉගෙන ගන්න දේවල් රාශියක් තිබුණා.

විශේෂයෙන් මා මෙතැනදී යම් කාරණයක් කියන්න කැමැතියි. මොකක් හෝ කාරණයක් ගත්තාම ඒ කාරණය පිළිබඳව පුළුල් දැනුමක් තිබෙන කිහිප පොළක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මා හිතන්නේ ඒ ජ්‍යෙෂ්ඨ නායකයෝ අවුරුදු ගණනක් තිස්සේ ලබපු පන්නරය, ඔවුන් ලබපු දේශපාලන දැනුමත් එක්ක තමයි ඔවුන්ට ඒ හැකියාව ලැබී තිබෙන්නේ කියලායි. ඒ වාගේම එක එක විෂයයන් සම්බන්ධ කරුණු කාරණා ගැන ඉතාම පෘථුල අත් දැකීම් ඔවුන්ට තිබෙනවා. අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ධර්මදාස බණ්ඩා මැතිතුමාත් එවැනි විශාල දැනුම් සම්භාරයක් තිබුණු නායකයෙක් විධියට මම මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වාගේම දැනටත් අප අතර එවැනි නායකයෝ කිහිප දෙනෙක් ඉන්නවා. එතුමන්ලා තවමත් පාර්ලිමේන්තුවේ ඉන්නවා. ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා, ගාමිණී ලොකුගේ මැතිතුමා, ඒ වාගේම විශේෂයෙන් අපේ පී. දයාරත්න මැතිතුමා වැනි පෘථුල අත් දැකීම් තිබෙන අය යම් යම් කාර්යයන්වලට හොඳින් මුහුණ දෙන හැටි අපට කියා දෙනවා.

අභාවප්‍රාප්ත ධර්මදාස බණ්ඩා මැතිතුමාත් එවැනි නායකයෙක්. එතුමා ගුරුවරයෙක් විධියට ඉඳලා, නීතිඥවරයෙක් විධියට පත් වුණාට පස්සේ, අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ පියා වන ආර්.එම්. ගුණසේකර මැතිතුමාගේ අභාවයෙන් පසුව පැවැති මැතිවරණයෙන තමයි 1965 දී මේ පාර්ලිමේන්තුවට පත් වෙලා එන්නේ. ඇත්තටම එතුමාගේ දේශපාලන ජීවිතය ආරම්භ වන්නේ එතැනිනුයි. ඇත්ත වශයෙන්ම එතකොට මොනරාගල දිස්ත්‍රික්කය දුප්පත්කමේ පතුලට කිඳා බැහැපු ප්‍රදේශයක් බවට පත් වෙලා තිබුණා. ඊට කලින් එතුමා 1964 මැදගම්පත්තු ගම් කාර්ය සභාවේ සභාපතිවරයා විධියට පත් වුණා. 1977 සිට 1989 දක්වා නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විධියට තුල්හිරිය, වේයන්ගොඩ, පූගොඩ හා මත්තේගොඩ යන පේෂකර්ම කර්මාන්තශාලා වැඩිදියුණු කරන්න විශාල දායකත්වයක් දැක්වූවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම උඩරට ගැමි පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයා විධියට විශේෂයෙන් විදේශිකයන්ගෙන් පරිහානියට පත් වෙලා තිබුණු උඩරට ප්‍රදේශය නැවත සංවර්ධනය කිරීම සඳහා දැවැන්ත පියවර ගණනාවක් විදේශ ආධාර ලබා ගෙන ක්‍රියාත්මක කළා. ඉන්පසුව එතුමාගේ ජීවිතයේ වැදගත්ම කාල වකවානුව එන්නේ 1990 කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යවරයා විධියට දිවුරුම් දුන්නාට පසුවයි. විශේෂයෙන් පේරාදෙනිය පැළෑටි ජාන මධ්‍යස්ථානය, ඒ වාගේම කටුනායක ශාක නිරෝධන මධ්‍යස්ථානය, ඒ වාගේම බහු වාර්ගික භෝග ව්‍යාපෘතිය, දෙවන කෘෂිකර්ම ව්‍යාපෘතිය වැනි මහා දැවැන්ත ව්‍යාපාර එතුමා විදේශ රටවල ආධාර අරගෙන ක්‍රියාත්මක කළා. ඒ වාගේම හදබිම අධිකාරිය, ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය, කෘෂි සංවර්ධන අධිකාරිය කියන ඒ ආයතනවලට අදාළව විශාල වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ විතරක් නොවෙයි. ගොවි අරමුදල, චක්‍රීය අරමුදල වැනි අරමුදල් පිහිටුවා කෘෂි කර්මාන්තය නංවාලන්න පුළුවන් අන්දමේ සශ්‍රීක කෘෂි කර්මාන්තයක් හදන්න පුළුවන් වටපිටාව ගොවීන්ට ලබා දෙන්න ඉතා විශාල වැඩ කොටසක් ඉටු කළා. හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා යටතේ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ කළා.

මම හිතන හැටියට මේ අවුරුදු ගණනාව තුළම තවමත් ගොවි උපහාර උළෙලක් තිබුණේ නැහැ. මට මතකයි ඒ කාලයේ ගොවි උපහාර උළෙලවල් පවත්වා, ගොවීන් තෝරලා ඔවුන්ට ශක්තියක් දෙන්න වැඩ කරපු නායකයෙක් විධියට අභාවප්‍රාප්ත ධර්මදාස බණ්ඩා මැතිතුමා දැවැන්ත වැඩ කොටසක් ඉටු කළා. ඒ වාගේම 2007 දී එතුමා අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍ය ධුරයට පත් වුණා. විශේෂයෙන් කන්තලේ, හිඟුරාන සීනි කර්මාන්තශාලා වාගේම බිබිලේ, සියඹලාණ්ඩුව සීනි කර්මාන්තශාලා ඉදි කරන්නත්; ලංකාවේ ලක්ෂ 10ක් විතර තිබුණු තල් ගස් ප්‍රමාණය ලක්ෂ 20ක් දක්වා වැඩි කරන්නත්; උතුරේ විතරක් තිබුණු තල් ව්‍යාපෘති දකුණට ගෙනෙන්නත්, විශේෂයෙන් කජු වගාව දියුණු කරන්නත් ඉටු කළ ක්‍රියාදාමයත් එතුමා කළ කැපී පෙනෙන කාර්ය භාරයන් විධියට අපට දක්වන්න පුළුවන්.

මම මෙම ගරු සභාවේදී කැමැතියි, අපි 1977 ආණ්ඩුවේ මහපොළ සංකල්පය පටන් ගන්න කොට ඇත්තටම ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා එම සංකල්පයට නායකත්වය දුන්නාට ධර්මදාස බණ්ඩා මැතිතුමා තමයි එම සංකල්පය ඔළුවේ තියා ගෙන එය මුලින්ම රටට, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාට හෙළදරව් කළේ කියන එක. එතුමාගේ හදවතේ මහපොළ සංකල්පය කියන යෝජනාව තිබිලා ඒක ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාට මතක් කරලා ඔහුට ඒ සඳහා ශක්තිය දුන්නා. මහපොළ සංකල්පයේ නිර්මාතෘවරයා, නැත්නම් ඒකේ අදහස ගෙනාපු නායකයා විධියට ධර්මදාස බණ්ඩා මැතිතුමා ඉතිහාසගත වෙන්න ඕනෑ කියලා මම මේ අවස්ථාවේ විශේෂයෙන් සිහිපත් කරන්න කැමැතියි.

එතුමා මේ දැවැන්ත සේවය කරන ගමන්, මොණරාගල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් නායකයා විධියටත්, දැවැන්ත සේවයක් කළා. විශේෂයෙන් එතුමා පැල්වත්ත, සෙවණගල සීනි කර්මාන්තශාලා එක්ක බුත්තල, වැල්ලවාය, සෙවණගල වැනි නගර දියුණු කරන්න අවශ්‍ය කරන වාතාවරණය සකස් කළා විතරක් නොවෙයි, ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා යටතේ දිස්ත්‍රික් නායකයා විධියට කතරගමට සහ බුත්තලට ගම් උදා ව්‍යාපෘති ගෙනැල්ලා ඒවා මඟින් ඒ ප්‍රදේශවලට දැවැන්ත සේවයක් කළා. ඒ වාගේම නටබුන් වෙලා තිබුණු ඓතිහාසික මාලිගාවිල බුද්ධ ප්‍රතිමා වහන්සේ නැවත සකස් කරලා -එම බුද්ධ ප්‍රතිමාව නැවත නඟා සිටුවලා- ඒ වාගේ කඩා වැටුණු සංස්කෘතික උරුමයන් නැවත ගොඩ ගන්න කටයුතු කළ නායකයකු විධියටත්, විශේෂයෙන් එම දිස්ත්‍රික්කයට දැවැන්ත සේවයක් කළ නායකයෙක් විධියටත් මම එතුමාව හඳුන්වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තම සහෝදරයාගේ මිය යාමෙන් පස්සේ අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා වාගේ නායකයෙක් දේශපාලන ක්ෂේත්‍රයට ගෙනැල්ලා, ඒ පවුලට ශක්තිය දීලා, ඒ පවුල හදලා, දේශපාලන වශයෙන් ඒ පවුලේ තවත් නායකයෙක් බිහි කිරීම ගැන මම එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා අද එක්සත් ජාතික පක්ෂයේ දැවැන්ත නායකයෙක් විධියට එම පක්ෂය ගොඩනඟන්න කටයුතු කරනවා. ඒ නිසා ධර්මදාස බණ්ඩා මැතිතුමා එතුමාව අරගෙන ආපු අඩි පාර ඉතාම වටිනවාය කියලා මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න කැමැතියි.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ පුත්‍ර රත්නය පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියත් එතුමාගේ උරුමය තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයෙයි. අනාගතයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ නම ගෙනි යන්න, එතුමා වෙනුවෙන් සේවය කරන්න එතුමාගේ පුත්‍ර රත්නයටත් අවස්ථාව, ශක්තිය, ධෛර්ය ලැබෙයි කියලා මම විශ්වාස කරනවා. ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ පවුලේ සියලු දෙනාට මගේ සහ අප පක්ෂයේ හෘදයාංගම ශෝකය ප්‍රකාශ කරන අතර ධර්මදාස බණ්ඩා මැතිතුමා වැනි උතුම් නායකයකු වෙනුවෙන් මට මේ අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන් මම එය ගෞරවයක් විධියට සලකනවා. ඒ වාගේම එතුමාට නිවන් සුව අත් වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.17]

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)

(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨම මන්ත්‍රීවරයෙක් වෙනුවෙන් අපේ අවසන් ගෞරවය දක්වන මොහොතේදී වචන කිහිපයක් කථා කරන්න ලැබීම මා ඉතාම අගය කොට සලකනවා. මා ධර්මදාස බණ්ඩා මැතිතුමා දැන හඳුනා ගත්තේ පාසල් යන කාලයේදීයි. එතුමාත් මමත් අධ්‍යාපනය ලැබුවේ එකම පාසලේ. කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ ශිෂ්‍ය නිවාසයේ තමයි අපි දෙදෙනාම සිටියේ. එතුමා මට වඩා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙක් හැටියට ආනන්ද ශාස්ත්‍රාලයේ ඉගෙනීම් කටයුතු කළා. ඒ කාලයේ ඉඳලාම මම එතුමාත් සමඟ ඉතාම කිට්ටුවෙන් ඇසුරු කළා. එතුමා පාසල් වියේදී ඉතාම දක්ෂ, ජාත්‍යන්තර මට්ටමේ වොලිබෝල් ක්‍රීඩකයකු හැටියට එදා අපේ පාසලටත් විශාල කීර්තියක් ලබා දුන්නා. එතුමා ජාතික මට්ටමේ ක්‍රීඩකයෙක් හැටියට කටයුතු කළා. ඒ වාගේම හැම ක්‍රීඩාවක් පිළිබඳවම ඉතා උනන්දුවෙන් කටයුතු කරපු හිතවතෙක් හැටියට තමයි මම එතුමාව දැක්කේ.

එතුමා පාසල් අධ්‍යාපනයෙන් පස්සේ ඉංග්‍රීසි පුහුණු ගුරුවරයකු හැටියට ක්‍රියා කරලා, නීතිඥයෙක් බවට පත් වුණා. එතුමාගේ සහෝදරයා වන ආර්.එම්. ගුණසේකර මැතිතුමා තමයි එදා බිබිලේ හඬ ගෙන ගිය දේශපාලනඥයා වුණේ. ගුණසේකර මැතිතුමා හදිසියේ අභාවප්‍රාප්ත වුණාම එතුමා ගිය ගමන් මඟ ධර්මදාස බණ්ඩා මැතිතුමා භාර ගත්තා. ධර්මදාස බණ්ඩා මැතිතුමා ගම් සභාපතිවරයෙක් හැටියට පත් වෙනවා මට අද වාගේ මතකයි. 1965දී විශාල වැඩි ඡන්ද සංඛ්‍යාවකින් බිබිලේ මන්ත්‍රීවරයා හැටියට එතුමා පත් වුණා. ඒ වාගේම 1977දී එතුමා නැවත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙලා ඇමතිවරයෙක් බවට පත් වුණා. 1983 දී මේ පාර්ලිමේන්තුවට එතුමාත් සමඟම පත් වෙලා එන්න මටත් අවස්ථාව ලැබුණා. අපි මිත්‍රයින් හැටියට, හිතවතුන් හැටියට ඉතා මිත්‍රශීලීව කටයුතු කළා. ඒ වාගේම එතුමා ළඟ හොඳ කල්‍යාණ මිත්‍ර ධර්මයන් තිබුණා.

අපි මුල් කාලයේ පාර්ලිමේන්තුවට ආවාම මේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු පිළිබඳව හැම විෂයක් පිළිබඳවම එතුමාත් එක්ක සාකච්ඡා කළා. එතුමාගෙන් අපි දැනුම ලබා ගත්තා. මා හිතන හැටියට මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන්ගෙන් මේ පාර්ලිමේන්තුවේ තිබෙන අණපනත් ගැන, නීතිරීති ගැන ගැඹුරු දැනුමක් තිබුණ, කට පාඩමක් තිබුණ ඇමතිවරයෙක් තමයි ධර්මදාස බණ්ඩා මැතිතුමා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමන් නියෝජනය කළ වෙල්ලස්ස, බිබිලේ, මැදගම, නන්නපුරාව වාගේ ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් එතුමාගේ ඉතාම ළෙන්ගතුකමක් තිබුණා; ඒ අය පිළිබඳව හිතවත්කමක් තිබුණා; ඒ අයගේ වුවමනාවන් පිළිබඳව ගැඹුරෙන් කල්පනා කළා. ඒ පළාත දියුණු කරන්න, ඒ පළාතේ අයගේ ජන ජීවිතය ශක්තිමත් කරන්න, ඒ පළාතේ තරුණ තරුණියන්ට අනාගතයක් ඇති කරන්න එතුමාගේ මුළු කාලය තුළම කල්පනා කළා; ක්‍රියා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාට ඉතාම හොඳ ගති ගුණ තිබුණා. ඒ වාගේම එතුමාට යම් විෂයයක් භාර දුන්නොත් ඒ විෂය පිළිබඳව ගැඹුරෙන් කල්පනා කරලා, ඒ විෂය තුළින් රටට යමක් කරන්න දක්ෂකමක්, හැකියාවක් එතුමාට තිබුණා. එතුමා දැරූ හැම ඇමතිකමකටම එතුමා ආලෝකයක් ලබා දුන්නා. ඒ ඇමතිකම තුළින් රටටත්, තමන්ගේ පළාත වෙනුවෙනුත් යමක් කරන්න එතුමා කවදාවත් පසු බට වුණේ නැහැ. ඒ නිසා අද අපි එතුමාව සමරන්නේ බොහෝම ගැඹුරු දැනුමක් තිබුණ, තමන් නියෝජනය කළ පළාත වෙනුවෙන් කැප වුණ, ඉතාම ශ්‍රේෂ්ඨ ඇමතිවරයෙක් හැටියටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා තමන්ගේ සහෝදරයා වන ආර්.එම්. ගුණසේකර මැතිතුමාගේ පුත්‍ර රත්නය - අපේ මිත්‍ර ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා- සංවර්ධන සභාවට, පළාත් සභාවට සහ පාර්ලිමේන්තුවට ගෙන ඒමට මඟ පෙන්වූවා. ඒ වාගේම එතුමාව ශක්තිමත් කරන්නට එතුමා ක්‍රියා කළා.

මට අද වාගේ මතකයි, අපි මේ රටේ ජාතික ප්‍රශ්නය වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයත් එක්ක සාකච්ඡා කළ අන්දම. ඒ ජාතික ප්‍රශ්නය වන ත්‍රස්තවාදය අවසන් කරන්න අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ගෙන යන ව්‍යාපාරයට පාර්ලිමේන්තුව තුළ ශක්තිය දෙන්න; පක්ෂයක් හැටියට ඒකට උදවු කරන්න අපි උත්සාහ කළා. එදා එක්සත් ජාතික පක්ෂය ඒකට එකඟ නොවීම නිසා පක්ෂයට වැඩිය මේ රට පිළිබඳව කල්පනා කරලා ඒ ආණ්ඩුව ආරක්ෂා කරන්න අය වැය ලේඛනයට ඡන්දය දෙන්න අපිට සිද්ධ වුණා. මම දැක්කා එදා රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා දිහා බලලා ධර්මදාස බණ්ඩා මැතිතුමා කිව්වා "තමුන්නාන්සේ ඕනෑ තීන්දුවක් ගන්න. මගේ අමනාපයක් නැහැ" කියලා. එතුමා කල්පනා කළා අපි ආරක්ෂා කළ පක්ෂයට වැඩිය මේ අවස්ථාවේදී මේ රටේ කුරිරු යුද්ධය නවත්වන එක වැදගත් කියලා. එතුමන්ලා අපි බොහොම හිතේ අමාරුවෙන් තමයි එදා ඒ තීන්දුව ගත්තේ. පක්ෂය එදා ඒ තීන්දුව ගත්තා නම් අපි සියලුම දෙනා අදත් එක්සත් ජාතික පක්ෂයත් එක්ක මේ ආණ්ඩුවේ වැඩ කර ගෙන යනවා. නමුත් පක්ෂයේ නායකයින්ගේ තිබෙන දුර්වලකම් නිසා, ඒ අයට රට ගැන කැක්කුමක් නැති නිසා එදා අපට ඒ විධියේ තීරණයක් ගන්න සිදු වුණා.

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක එකතු වෙලා එදා අය වැය ලේඛනය සම්මත කරලා, මේ යුද්ධය අවසන් කරලා නිදහස් රටක ජීවත් වෙන්න ලැබීම ගැන අද අපි ඉතාම සතුටට පත් වෙනවා. ධර්මදාස බණ්ඩා මැතිතුමාත් ඒකෙන් ඉතාම සතුටට පත් වෙලා එතුමාගේ ජීවිතයේ අවසාන කාලය ගත කළ බව මම දන්නවා. අපි මුණ ගැහුණ හැම අවස්ථාවකම එතුමා කිව්වේ "ගාමිණී, අපි මොනවා කළත් අද අපිට හෘදය සාක්ෂියට අනුව සතුටින් ජීවත් වෙන්න පුළුවන්" කියලායි.

අපේ රටේ යුද්ධය අවසන් කරලා අද අප නිවහල් ජීවිතයක් ගත කරනවා, මේ රටේ ජනාවට සාමයෙන් ජීවත් වන්නට පුළුවන් අවස්ථාව අප ලබා දුන්නා කියන සතුට ඇති කර ගෙන ජීවත් වෙන්න පුළුවන් කියන මතය එතුමා ළඟ තිබුණා. තමන්ගේ ජාතිය ගැන, රට ගැන හිතලා රටට වැඩක් කරන්න ගැඹුරු අවංක වුවමනාවක් එතුමා තුළ තිබුණා. අද එතුමා නැති වුණත් එතුමා

සමඟ ඉතා කිට්ටුවෙන් ඇසුරු කළ නිසා එතුමාගේ දර්ශනය, එතුමාගේ ප්‍රාර්ථනාව මතක් කරන්න, ඒ අනුව ක්‍රියා කරන්න අපට යුතුකමක් තිබෙනවා.

එතුමා හොඳ දරු පවුලක් හැදුවා. දූ පුතුන්ට හොඳ අධ්‍යාපනයක් දුන්නා. ඒ අයට සමාජය හඳුන්වා දුන්නා. සමාජයත් එක්ක ක්‍රියා කරන හැටි කියා දුන්නා. ඒ නිසා අද ඒ අය ඉතාම හොඳ තත්ත්වයක ඉන්නවා. එතුමාගේ එක පුත්‍ර රත්නයක් අද පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට පත් වෙලා ඉන්නවා.

අප මේ අවස්ථාවේදී ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ ආදරණීය නෝනා මහත්මියට, පළාත් සභාවේ ඉන්න පුත්‍ර රත්නයට, අනෙකුත් දූ දරුවන්ට වාගේම, අපේ මිත්‍ර ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඇතුළු ඒ පවුලේ සියලු දෙනාටම අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින් ධර්මදාස බණ්ඩා මැතිතුමාට නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 3.25]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කිරීමට ලැබීම මට ලැබුණු ගෞරවයක් කොට සලකනවා.

විශේෂයෙන් තරුණ සහ ආධුනික මන්ත්‍රීවරුන් වන අපට මේ ගරු සභාවේ ඉදිරිපත් වන ශෝක ප්‍රකාශ යෝජනා සම්බන්ධයෙන් කථා කිරීමට ලැබෙන අවස්ථා දුලභයි. මොකද, බොහෝ වෙලාවට මෙවැනි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු තරුණ මන්ත්‍රීවරුන් වන අපට හඳුනා ගන්නට අවස්ථාව ලැබෙන්නේ ඉතා සුළු වශයෙන්. නමුත් පාර්ලිමේන්තුවේ සිටි මේ සුළු කාලය තුළ ශෝක යෝජනා වෙනුවෙන් කථා කරන්නට දෙවැනි වතාවටත් අවස්ථාවක් ලැබීම සම්බන්ධයෙන් මා බොහොම සන්තෝෂ වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන්ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු දහයක පමණ කාලයකදී ධර්මදාස බණ්ඩා මැතිතුමාව සුළු වශයෙන් හඳුනා ගන්නට මට අවස්ථාව ලැබුණා. හැබැයි, මගේ වාසනාවට අපේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු ඒ වාගේම නායකයකු වන ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් එක්ක ළඟින් ආශ්‍රය කරන්නට පටන් ගත්තාට පස්සේ, මට ධර්මදාස බණ්ඩා මැතිතුමාවත් ටිකක් ළඟින් ආශ්‍රය කරන්න අවස්ථාව ලැබුණා. ධර්මදාස බණ්ඩා මැතිතුමා මිය යැමට දින කිහිපයකට පෙර එතුමාව මුණ ගැසී කථා කිරීමේ අවස්ථාවක් මට ලැබුණා. එක්සත් ජාතික පක්ෂයට ආදරය කරන තරුණ මන්ත්‍රීවරයකු වශයෙන් මම ආඩම්බර වෙනවා, අවුරුදු හතළිස් ගණනක දේශපාලන ඉතිහාසය තුළ විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළ ධර්මදාස බණ්ඩා මැතිතුමා අපට මේ වටිනා පක්ෂය ඉතිරි කර ගිය එක ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයට ආදරය කරන තරුණ මන්ත්‍රීවරු වන අපි, අපේ නායකයන් ගැන කථා කරන්නේ ඉතා ආඩම්බරයෙන්. විශේෂයෙන්ම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ඩී.එස්. සේනානායක මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා වැනි අපේ ජ්‍යෙෂ්ඨ සහ ශ්‍රේෂ්ඨ නායකයන් ගැන මතක් කරද්දී, එවැනිම ගාම්භීර බවක්, හොඳ දැනුමක්, සංවර බවක්, නායකත්වයට අවශ්‍ය සියලු සලකුණු තිබුණ තවත් පුද්ගලයෙක් තමයි අපේ ධර්මදාස බණ්ඩා මැතිතුමා. දැනට ආණ්ඩු පක්ෂයේ සිටින එක්සත් ජාතික පක්ෂයේ හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් වන ගාමිණී ලොකුගේ මැතිතුමා, පී. දයාරත්න මැතිතුමා වැනි අය කථා කරද්දී මේ අවස්ථාවේ අපට පොඩි ශෝකයක් ඇති වනවා. අපි ගරු කරපු එක්සත් ජාතික පක්ෂයේ ඒ මන්ත්‍රීවරු යම් හේතුවක් නිසා යම් අවස්ථාවක ආණ්ඩුවට සහයෝගයක් ලබා දුන්නා. ගාමිණී ලොකුගේ මැතිතුමා කිව්ව ආකාරයට ඒ අවස්ථාවේ එතුමන්ලා ගත් තීන්දුවෙන් යුද්ධය අවසන් කිරීමට යම්කිසි උපකාරයක් සිදු වුණා නම් -මගේ දැනුම තුළ එහෙම නොතිබුණත්- එවැනි තීන්දුවක් ගැනීමට එතුමන්ලාට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් අපි සන්තෝෂ වනවා.

ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ ජීවිතය දෙස බැලුවාම, තරුණ මන්ත්‍රීවරයකු වශයෙන් මට ආඩම්බර වන්න පුළුවන්. අපේ වාසුදේව නානායක්කාර මැතිතුමා කිව්ව ආකාරයට විශේෂ දේශපාලන උරුමයක් නොතිබුණත් එතුමාගේ සහෝදරයාගේ - අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ පියාගේ- අභාවයෙන් පසු දේශපාලනයට පැමිණි එතුමා මොනරාගල දිස්ත්‍රික්කයට විශාල ආඩම්බරයක් වුණා. මම හිතන විදියට මොනරාගල දිස්ත්‍රික්කයට මාණික්‍යයක් වෙමින් එතුමා ඒ පළාතේ ආර්ථික සංවර්ධනයේ නියමුවා ලෙස කටයුතු කළාය කිව්වොත් නිවැරදියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මොනරාගල දිස්ත්‍රික්කයට විශාල ආඩම්බරයක් අත් කරලා දුන්නා. මොනරාගල දිස්ත්‍රික්කයෙන් පහළ වුණු පළමුවැනි නීතිඥ මහත්මයා වශයෙන් දිවුරුම් දුන්නේ ධර්මදාස බණ්ඩා මැතිතුමායි. මම වැරදි නම් ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා මාව නිවැරදි කරන්න ඕනෑ. ඒ වාගේම කතරගම දේවාලයේ බස්නායක නිලමේ වශයෙන්ද මොනරාගල දිස්ත්‍රික්කයෙන් ප්‍රථමයෙන් පත් වුණේ මෙතුමායි.

ඒ විතරක් නොවෙයි, මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රථම කැබිනට් අමාත්‍යවරයා වශයෙන් පත් වන්නටත් එතුමා වාසනාව උදා කර ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නියම දේශපාලනඥයකු වශයෙන් ඒ සියලු පදක්කම් එතුමා ලබා ගත්තා. එතුමා එක්සත් ජාතික පක්ෂයට විශාල සේවයක් කරන ගමන්ම සමාජ සේවය, කෘෂිකර්මය වැනි ක්ෂේත්‍ර තුළින් ජනතාවගේ අභිවෘද්ධිය සඳහා කරපු කාර්ය භාරය මට පෙර කථා කරපු මන්ත්‍රීවරු විස්තර කළා. ඒ නිසා නැවතත් මම ඒ කාර්ය භාරය සඳහන් කිරීම අවශ්‍ය නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන්, රාජ්‍ය අමාත්‍යවරයකු වශයෙන්, නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන්, ඒ වාගේම කැබිනට් අමාත්‍යවරයකු වශයෙන් එතුමා කටයුතු කළා. මම හිතන විදියට එතුමාට ලබා ගන්න බැරි වුණේ ජනාධිපති පදවියත්, අග්‍රාමාත්‍ය පදවියත්, කථානායක පදවියත් පමණයි. ඒ හැර දේශපාලනයෙන් ලබා ගන්න පුළුවන් සියලුම ගෞරව නම්බු නාම ලබා ගෙන එතුමා ඌව - වෙල්ලස්ස ප්‍රදේශයට, මොනරාගල දිස්ත්‍රික්කයට විශාල සේවයක් කළා. ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ තරුණ මන්ත්‍රීවරු වශයෙන් අපට ආඩම්බර වන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු සුජීව සේනසිංහ මහතා]

ඒ විතරක් නොවෙයි, මට ලැබුණු තොරතුරු අනුව, එතුමා කතරගම දේවාලයේ බස්නායක නිලමේ වශයෙන් කටයුතු කරද්දී, කතරගම දේවාලයේ මහ පෙරහැරේදී බෝම්බ ප්‍රහාරයකට ලක් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අවස්ථාවේදී එතුමා වටේ හිටපු දහතුන් දෙනෙක් මරණයට පත් වුණා කියලාත් මට ආරංචි වුණා. හැබැයි එතුමාට වාසනාව තිබුණා, ඒ අවස්ථාවේදී ජීවිතය බේරා ගන්න. එතුමාගේ සහෝදරයාත් රුදුරු වෙඩි පහරකින් අප අතරින් වෙන් වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මහ පොළ සම්බන්ධයෙන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරද්දී, එතුමා සඳහන් කර තිබුණා, ඒ මහ පොළ පිළිබඳ අදහස ලබලා දුන්නේ ධර්මදාස බණ්ඩා මැතිතුමාය කියලා. ඒ වාගේ සිද්ධීන් නිසා ධර්මදාස බණ්ඩා මැතිතුමා ගැන එක්සත් ජාතික පක්ෂයට ආඩම්බර වන්න පුළුවන්. එතුමාගේ ජීවිතය අපි පසු විපරම් කරලා බැලුවොත් එක්සත් ජාතික පක්ෂයට ආදරය කරන තරුණ මන්ත්‍රීවරයකු වශයෙන් මට එතුමා ගත් සියලුම තීන්දු ගැන ඒ වාගේම එතුමා කළ කාර්ය භාරය ගැන ආඩම්බර වන්න පුළුවන්. හැබැයි මට කනස්සල්ලකට තිබෙන්නේ, මොන යම් හේතුවක් නිසා හෝ එතුමා එක්සත් ජාතික පක්ෂය අත හැරලා ආණ්ඩුවට එකතු වීම ගැන පමණයි.

කෙසේ වෙතත් මිය යාමට දින කීපයකට පෙර මම ගිහින් එතුමාව හම්බ වුණ අවස්ථාවේදී පවා, එතුමා ඇහැව්වේ, එක්සත් ජාතික පක්ෂයේ ඉදිරි අනාගතය ගැනයි. ඒ අවස්ථාවේදී එතුමාගේ තිබුණු දේශපාලන දැනුම සම්බන්ධයෙන් මම ඇත්තෙන්ම ආඩම්බර වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා දේශපාලනඥයෙක් වශයෙන් පමණක් නොවෙයි, සමාජ සේවකයෙක් වශයෙන් පමණක් නොවෙයි, ඒ දිස්ත්‍රික්කයේ නියමුවා වශයෙන් පමණක් නොවෙයි, ගෞරවණීය පියෙක්, ඒ වාගේම ස්වාමි පුරුෂයෙක් වශයෙනුත් තම යුතුකම් ඉටු කළා. එතුමාගේ පවුලේ සැමටත්, විශේෂයෙන්ම එතුමාගේ භාර්යාව වන ලිලානි පින්නවල මහත්මියටත් මේ අවස්ථාවේදී මාගේ ගෞරවය පිරිනමන්න කැමැතියි. එතුමා සමාජයට වැඩදායී දරුවන් හතර දෙනෙක් බිහි කරලා, සංවරයෙන් යුතුව, රටේ හරියට ජීවත් විය හැකි පුරවැසියන් ලෙසට ඔවුන්ව හැඩ ගැස්සුවා. විශේෂයෙන්ම හරීන්ද්‍ර මාගේ මිත්‍රයා, ආණ්ඩු පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් මේ අවස්ථාවේදී සේවය කරනවා. ඔහු ඉදිරි අනාගතයේදී රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ අඩි පාරේ යමින්, එක්සත් ජාතික පක්ෂයත් සමඟ එකතු වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම සුරේන්ද්‍ර මැතිතුමාත් විවාහ වෙලා ඉන්නේ දේශපාලන පවුලකින්. ඒ වාගේම චමිලා සහ නාලිකා යන දියණියන් දෙදෙනාත් රටේ වැදගත් ව්‍යාපාරික පවුල් දෙකකට සම්බන්ධ වෙලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ සහ අපේ පක්ෂයේ ඉදිරි අනාගතය භාර ගන්න සුදුසුකම් තිබෙන ඒ වාගේම විශාල කාර්ය භාරයක් කරන රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ තිබූ ඒ සම්බන්ධය මට අද වාගේ මතකයි. ඇත්තටම මට පුදුම හිතුණා, තමන්ගේ පියා නොවුණත්, තමන්ගේ බාප්පාගේ වියෝව ගැන කථා කරද්දී රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට ඇති වුණු වේදනාව ගැන. ඒ වේදනාව මම එතුමාගේ මුහුණෙන් හා ඇස් දෙකෙන් දැක්කා. ඒ වාගේම ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ වැඩ කටයුතු ගැන කියද්දී ඇති වුණු සන්තෝෂය හා ගෞරවයත් මම දැක්කා. සමහර පවුල්වල තමන්ගේ පියාටවත් ඒ වාගේ ගරුත්වයක් ආදරයක් දක්වනවා මම දැකලා නැහැ. හැබැයි රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට වරදින්නේ නැහැ. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ පියාගේ අභාවයෙන් පසුව එතුමා පියා ලෙස සැලකුවේ මේ ධර්මදාස බණ්ඩා මැතිතුමාවයි. විශේෂයෙන්ම මම මේ ශෝක ප්‍රකාශය ඉදිරිපත් කිරීමට හේතුව වුණේත් මෙතුමන්ලා දෙදෙනා සමඟ තිබුණු මේ සම්බන්ධතාවයි. ධර්මදාස බණ්ඩා මැතිතුමා රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට තිබුණු ආදරය, ගෞරවය හා සෙනෙහස වාගේම රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා ධර්මදාස බණ්ඩා මැතිතුමාට තිබුණු ආදරය, ගෞරවය හා සෙනෙහස අපි අගය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලය වන කොට එතුමාගේ පුතාත් දේශපාලනයට සම්බන්ධ වෙලායි හිටියේ. ධර්මදාස බණ්ඩා මැතිතුමා ආණ්ඩු පක්ෂයට එක් වන විට නඩුවක් පවරද්දි ඒ නඩුවට මටත් සම්බන්ධ වෙන්න සිද්ධ වුණා, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන්. හැබැයි එතුමා ඒ අවස්ථාවේදී මා පිළිගත්තු ආකාරයත්, මට දැක් වූ ආදරයත් මම හිතන්නේ තරුණ මන්ත්‍රීවරයෙක් වශයෙන් මට ලොකු ගෞරවයක් කියලායි. අපේ එක්සත් ජාතික පක්ෂයේ එවැනි ජ්‍යෙෂ්ඨ ප්‍රබලයින් විශාල පිරිසක් සිටීම අපිට විශාල ආඩම්බරයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තරුණ මන්ත්‍රීවරයෙකු වශයෙන් මටත් අද කථා කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම එතුමාගේ පවුලේ සියලු දෙනාටම මගේ ශෝකය ප්‍රකාශ කරන අතරම එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[3.38 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Mr. Deputy Speaker, I would like to quote from a Rome drama, which states :

> "Come, leave your tears: a brief fare-well:-..."

He came, shed a tear on his nephew, the Hon. Ranjith Madduma Bandara and said goodbye. In another place in this drama, there is a dialogue like this. I quote :

> "What would you have, friend? whence are you? Here's no place for you: pray, go to the door."

After about 40 years of public and political service to his Wellassa *boomiya* and to the whole nation, he was asked to go to the door. Sometimes, I wonder whether he passed away as a disillusioned man. I knew both the Hon. Dharmadasa Banda and his worthy nephew, the Hon. Ranjith Madduma Bandara, both sat together in this Parliament, the uncle-nephew added a new dimension and gave colour to this august Assembly. The Hon. Dharmadasa Banda was a very amiable person, very friendly, soft spoken but he can be hard where one should hit hard, and he hit hard. He was determined to see that his nation is free of foreign colonialism. He was essentially a man from Wellassa deeply rooted in this soil and had the traditional courage of the Sinhala man and I should say, a Sri Lankan man. He brooded no nonsense when it came to play his part for his country. He was national minded to the root. He was a great patriot. That is why after the present leadership, in the

lawn of the green party, he came to understand the futility of continuing further and joined hands with His Excellency Mahinda Rajapaksa and became a Minister.

Sir, the Hon. Dharmadasa Banda had a vision, a clear view of many a matter. We came to know him as a young boy at Zahira College, wearing a pair of trousers, dapper, short but he flew high in the volleyball court, specially. Zahira College is proud of having nurtured and educated Dharmadasa because he brought honour to his *alma mater.* He was a national volleyball player and he assumed international fame through it. I still remember, across the road at Zahira College in Maradana, there was the police station. There was a volleyball court. He used to play with giants, particularly from the Gampaha area. Today, Sir, I learnt that Gampaha which is one of the foremost areas in the volleyball game is not doing well and they wanted the Government patronage to improve the game in Gampaha and I say it must be given.

Then, Sir, as a student of Zahira College, he imbibed the qualities of great men and great religions.

It was the great nationalist leader and patriot Dr. T.B. Jayah who called Zahira College as "the Radiating Centre of Islamic Thought and Culture." The Hon. Dharmadasa Banda who came under the tutelage of Dr. A.M.A. Azeez, knew this underlying thoughts of Zahira College. He so well integrated himself into the multi-ethnic, multi-culture and multi-religious society - a society called the Sri Lankan nation. He played with Sinhalese, Tamils, Muslims, Burghers and Malays. He was brought up as a true national figure at Zahira. He knew and appreciated the religious background and the culture of all the other religions. I would recall here, Sir, - the name of Captain O.M. Muhlar of Zahira College, a famous Cadet Master. Then, the famous brothers B.J.H. Bahar, junior and senior - the first Indoor Cricket School was started in Zahira College and the Hon. Dharmadasa Banda, as a student, looked at these evolutions on a wider perspective. Then, in Cricket, in Rugger, as a volleyball player, he used to appreciate Samad, S.M.A. Razaak, Meerasahibu Abdul Majeed, SSP who was a former Colleague of ours in this Parliament. He had the distinction of leading the first Sri Lankan National Rugger team abroad. There was then the famous 'Tanker' Hameed. Even in cricket, Sir, we had produced Ben Navaratne, who was one of the best wicket-keepers in the whole of Asia. In fact, it was the legendary Don Bradman who called Ben as "the best wicket-keeper" in the world at that time. Then, there was the fast fiery bowler, Sylvester Dias, who did proud to his *alma mater.* The man who won the first cricket single-wicket tournament is Gulam Razik. Hard-hitting Navendra was another great cricketer we loved to see in the middle The mercurial M. Shaharwadi, M. Anwer, Rauff Azam, Tuan Chuncheer and Farook Saleem made big names. Even in cadetting and rifle shooting, Sir, the Hon. Dharmadasa Banda had great respect for M. Mahsoom Haniffa, Mahendra and Haris Deen, Wrestlers like Shariff brothers and Ameen, in Soccer - Coomarasamy, in Athletic - Thangarajah and Boxing - Albert Perera, one of the best known boxers in the country at that time. Sabir Ismail was a renowned Table Tennis player. T.S. Cassim was the best-loved Boarding Master and Cricket Coach.These were the people with whom the Hon. Dharmadasa Banda grew up in the nursery of Zahira College. Therefore, he had a clear view on men and matters when he entered the political arena. Presently, Mr. Fouzul Hameed as Chairman of Board of governors, and Principal Jiffrey, going great guns at Zahira.

I used to visit at that time - the Hon. Ranjith Madduma Bandara knows it very well - his hometown Bibile, Medagama, Kotabowa and Godigamuwa. The great Kariappers hail from this village. He showed us for the first time - that was when the late Hon. M.A. Bakeer Markar was the Speaker of this Parliament, under his leadership we went there - that in Kotabowa, in his area which is now very well looked after by my very good Friend on my left, the Hon. Gamini Wijith Wijayamuni De Zoysa. Where the Hon. Dharmadasa Banda left, now the Hon. Gamini Wijith Wijayamuni De Zoysa,has taken over and is giving light to that area. There was a Mosque built out of honey and eggs. බිත්තරවලින් සහ මී පැණිවලින් හැදූ, අදත් ශක්තිමත් එම මුස්ලිම් පල්ලිය! එවැනි ශක්තිමත් දේශයක් තමයි ධර්මදාස බණ්ඩා මහතා ගොඩ නඟන්නට වැර වෑයම් ගත්තේ. මට හොඳට මතකයි, එම ප්‍රදේශයේ අල්හාජ් සල්සබීල් මවුලවිතුමාව. එතුමා අපිට හුඟක් ආධාර කළ කෙනෙක්. එම නිසා තමයි අපි ඉතාමත් කනගාටු වෙන්නේ සමහර ආගම් විරෝධීන්ගේ ක්‍රියා කලාපය ගැන. මේ ටික කියන්නම ඕනෑ, - The Hon. Lakshman Yapa Abeywardena bears witness as we were talking so many times about the Anuradhapura desecration**.** Now, Sir, the Hon. Dharmadasa Banda had he lived, he would not have allowed these things to happen because he was an embodiment of friendship and religious harmony. What a wonderful man he was! Now, see what is in "The Sunday Times" of 11$^{th}$ September 2011. Latheef Farook says, I quote:

> "While 18 websites - eight in Sinhala and 10 in English - have been identified as part of this campaign against Muslims......"

That is,

> "Why this sinister 'hate-Muslim' campaign now?"

Sir, There are so many unsavoury stories circulating. I am very happy the Government stepped in - Mr. Gotabhaya Rajapaksa, the Secretary to the Ministry of Defence also discussed with Jamiyyathul Ulama, Sri Lanka Muslim Council and other Muslim organizations and promised to take action to settle the issue. But, see this news what they have published in the - These things must be told. Therefore, the Government and the police can take care of itself. "The Sunday Leader" of 18th September, 2011 states, I quote:

> "Muslim Shrine in Anuradhapura Destroyed"

The police is just looking at it. These are the types of things that bring down the image of this Government. Today, our President is in the United nations. He is

[ගරු අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා]

meeting with 54 - [*Interruption.*] -Yes, this is about the Hon. R.M. Dharmadasa Banda - අපි ශෝකයෙන් තමයි මෙම ඛේදවාචකය ගැන කියවන්නේ.

Today 54 Muslim countries are behind our President and he is meeting them and also other leaders of the world. Now, at a time when tremendous progress is made in the talks in UK by our President, these anti-religious activities are happening; these are rabble-rousers, anti-nationalists at work at home. That is why we are reiterating in this House openly that the IGP must hold an inquiry and bring those culprits to book. I also have the pictures that appeared in the "Navamani Weekly" newspaper, here. These things must be said openly so that action could be taken on anti-nationalists and people who conspire to destroy the image of our country and its leader.

There is an election in Colombo, Galle and Matale where there are a large majority of Muslim voters and this is what they do. මොකක්ද මේ අය කරන්න හදන්නේ? සිංහලයේ කියමනක් තිබෙනවා, "විද්දේ හාවාට, වැදුණේ පඳුරට" කියලා. නමුත් කවදාවත් ඒ වාගේ වැඩ හරි යන්නේ නැහැ. ඒ වාගේ වැඩ කරලා ඡන්දය ලබා ගන්න බැරි බව ජීවතුන් අතර ඉන්න කොට ගරු ධර්මදාස මැතිතුමා හොඳින්ම දැන ගෙන සිටියා. එතුමා ඒවා අධ්‍යයනය කළා. ඒ නිසා අපි ඉතාම කනගාටු වෙනවා මේ අවස්ථාවේදී.

I should say these few things in English. The Hon. Dharmadasa Banda, the former Minister of Supplementary Crops Development passed away on 23rd October, 2010. He died in a private hospital in Colombo at the age of 72. He was a teacher by profession. He took to politics when his brother, the Hon. R.M. Gunasekera, Member of Parliament was shot dead in 1964 and was elected as an MP in 1965. He was appointed Deputy Minister of Textile Industries in 1977. In 1989, he was the Minister of State for Upcountry Peasantry Rehabilitation. From 1990 to 1994, he was the Minister of Agricultural Development and Research. He was appointed a Senior Adviser to the Ministry of Public Administration from 2002 - 2004 and was again elected to Parliament in 2004. He joined the dissident UNP Group led by the Hon. Karu Jayasuriya to pledge support to His Excellency President Mahinda Rajapaksa and served as Minister of Supplementary Crops Development from 2005 to 2009. Although the Hon. Karu Jayasuriya left, the Hon. Dharmadasa Banda served as the Minister. His son Mr. R.M. Harindra Dharmadasa Bandara is a Provincial Council Member of the Uva Province. The UNP Member of Parliament of Monaragala District, the Hon. Ranjith Madduma Bandara is his worthy nephew, as I told you.

Therefore I would like to say that the Hon. Dharmadasa Banda was an exemplary leader. He set an example to the past, the present and the future generations. I see the sorry plight of our very good Friend, his nephew. Where is he leading to? I am very sorry, the Hon. Dharmadasa Banda, his worthy uncle realized the truth - that going with a party or a leader with no vision, no national feeling to serve the country is of no use, he is lagging behind. But, he is a young man. I must appreciate one thing about the Hon. Ranjith Madduma Bandara, Imthiaz Bakeer Markar and Rukman Senanayake. These are the people who should have left the party that shabbily treats them. But, they all have sterling political qualities, I believe. They are still remaining to see that they could build up a strong Opposition in this country as visualized by the late Hon. Dharmadasa Banda, and if you think that that will not come to pass, I appeal to the Hon. Ranjith Madduma Bandara, my young brother, please come over to this side; we will give you the correct position to serve the country well in the future.

The Hon. Dharmadasa Banda was one of the most senior Members who had served a long period in this House. It is the Hon. Maithripala Senanayake who has a record of serving over 40 years followed by, I think, the Hon. Alick Aluvihare, and then the Hon. A.C.S. Hameed and the Hon. Dharmadasa Banda.

In concluding, in our own way - he knew the Islamic rights - he was a devout Buddhist and he served the Buddhists and others in the "Vellassa" well.

We have travelled with him all over the country. We saw the vast development that had been taking place in Bibile and other areas. His contribution to Buttala Gam Udawa cannot be just forgotten.

Hon. Ranjith Madduma Bandara, you are very silently and patiently listening to me in this House. Please think of the future. Please think not of yourself but, as your late uncle did, of the country and take the correct decision at the correct time before too long.

May the Hon. Dharmadasa Banda attain *Nirvana*!

Thank you.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Will an Hon. Member propose Hon. Alhaj A.H.M. Azwer to take the Chair.

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன் - காணி, காணி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Janaka Bandara Tennakoon - Minister of Lands and Land Development)
I propose that Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 3.54]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මීට ටිකකට කලින් ප්‍රකාශ කළ පරිදිම ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා මේ උත්තරීතර සභාවේ හිටපු ඉතාම නිරහංකාර ඒ වාගේම බොහොම ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක්. ඓතිහාසික ඌව වෙල්ලස්සේ උපත ලබපු එතුමා කොළඹ සහිරා විද්‍යාලයේත්, කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේත් අධ්‍යාපනය ලබද්දී ඉතාම දක්ෂ ක්‍රීඩකයෙක් වුණා. ඒ වාගේම දීප්තිමත් ශිෂ්‍යයකු හැටියට එතුමා කටයුතු කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි ගුරුවරයකු ලෙසත් කලක් කටයුතු කරන්න එතුමාට අවස්ථාව ලැබුණා. ඒ වාගේම මොනරාගල දිස්ත්‍රික්කයෙන් බිහි වෙච්ච ප්‍රථම අධිනීතිඥවරයා හැටියටත් ගෞරවයක් ඇතිව කටයුතු කරන්න එතුමාට අවස්ථාව ලැබුණා.

ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා අවුරුදු 72ක් ආයු වින්දනය කළ අතර එයින් වසර 46ක්ම දේශපාලනඥයකු හැටියට ඉතාම කැපී පෙනෙන සේවයක් අපේ රටට ඉටු කළා. තමාගේ සුවිශේෂ සේවය ඌව වෙල්ලස්සටත්, මොනරාගල දිස්ත්‍රික්කයටත්, පොදුවේ මුළු රටටත් ලබා දෙන්නට එතුමාට පුළුවන්කම ලැබුණා. ඉතාම දුෂ්කර පළාතකින් බිහි වෙලා දේශපාලනඥයකු හැටියට තමන්ගේ ජීවිත කාලයේදී විවිධ අභියෝගවලටත්, විවිධ බාධක කම්කටොලුවලටත් ඉතාම සාර්ථකව මුහුණ දීලා සාර්ථක පුද්ගලයකු බවට එතුමා පරිවර්තනය වුණා. එතුමාගේ වැඩිමල් සහෝදරයා, එනම් අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාගේ පියා 1964 වසරේදී ඝාතනයට ලක් වෙච්ච වෙලාවේ තමන්ගේ සහෝදරයාගේ අඩුව පිරිමහමින් දේශපාලනයට අවතීර්ණ වීමට එතුමාට සිද්ධ වුණා. සහෝදරයාගේ අඩුව පිරිමහමින් දේශපාලනයට ආවා විතරක් නොවෙයි. තමන්ගේ සහෝදරයාගේ අභාවයෙන් පියා අහිමි වූ දරුවන්ට පියකු වන්නටත් එතැන් පටන් එතුමාට සිද්ධ වුණා. සහෝදරයාගේ අඩුව පිරිමහමින් බිබිල මන්ත්‍රීවරයා ලෙස 1965දී මේ පාර්ලිමේන්තුවට පත් වන කොට එතුමා අවුරුදු 27ක වාගේ වයසේයි පසු වුණේ. එවැනි ළා බාල මන්ත්‍රීවරයකු හැටියටයි එතුමා ඒ කොට්ඨාසය නියෝජනය කරලා පාර්ලිමේන්තුවට ආවේ. ජය පරාජය දෙකේදීම එක විධියට කටයුතු කරන්න ඒ සියල්ලට එක විධියට මුහුණ දෙන්න පුදුම ආත්ම ශක්තියක් එතුමා සතුව තිබුණා. මොන තරම් ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු වුණත් මේ සභාවේ සිටියදී නවක, තරුණ මන්ත්‍රීවරුන් සමඟත් ඉතාම ළෙන්ගතුව ඇසුරු කිරීමට ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා හැම විටම කටයුතු කළා. වයස් භේදයක්, ඒ වාගේම පක්ෂ භේදයක් නැතිව හැම මන්ත්‍රීවරයකු සමඟම විහිළුවක් තහළුවක් හුවමාරු කර ගන්නත් ඒ වාගේම තරුණ මන්ත්‍රීවරුන්ට අවශ්‍ය කරන විවිධ උපදෙස් බොහොම නිහතමානීව ලබා දෙන්නත් ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා හැම විටම ක්‍රියා කළා.

ගරු මන්ත්‍රීවරයකු, ගරු ඇමතිවරයකු ලෙස මොනරාගල දිස්ත්‍රික්කයට, බිබිලට විදුලිය දෙන්න, සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න, පාසල් වැඩි දියුණු කරන්න එතුමා විශාල සේවාවක් කළා. විශේෂයෙන්ම 1977ට පෙර එවැනි පළාත්වලට විදුලිය කියන එක සිහිනයක් වෙලායි තිබුණේ. ගම්බද පළාත්වලට ට්‍රාන්ස්ෆෝමර් සවි කරලා, විදුලි රැහැන් ඇදලා දුප්පත් පැල්පතේත් බල්බ් එක පත්තු වෙන පරිවර්තනය එතුමාගේ නායකත්වයෙන් සිදු වෙනවා අපි එදා දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හිටපු ජනාධිපති ගරු ප්‍රේමදාස මැතිතුමාත් සමඟ එකතු වෙලා බුත්තල කතරගම වාගේ ගම් උදාවල් ලබා ගෙන ඒ පළාත්වල දියුණුවට -මහා මාර්ග දියුණු කරන්න, අනෙකුත් ඒවා දියුණු කරන්න- කටයුතු කරන්න එතුමාට පුළුවන්කම ලැබුණා. අදටත් ඒ පළාත්වලට ගියාම ඒ ගම් උදාවල් ලබා ගැනීමෙන් සිදු වෙච්ච සේවය ගැන ඒ ප්‍රදේශවල ජනතාව කථා කරනවා.

කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමතිවරයා හැටියට කටයුතු කරපු එතුමාට, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය හඳුන්වා දීලා ගොවි ජනතාවගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කරන්නටත් පුළුවන්කමක් ලැබුණා. ගොවි උපහාර උත්සව පවත්වලා ගොවි ජනතාව දිරිමත් කිරීමේ කටයුත්ත ආරම්භ කළේත් එතුමා ඇමතිවරයා හැටියට හිටපු කාලයේය කියන එක අපට මතකයි.

එතුමා අතිරේක වැවිලි භෝග සංවර්ධන ඇමතිවරයා හැටියට ක්‍රියා කරද්දී සීනි කර්මාන්තයේ අභිවෘද්ධියටත් කටයුතු කළා. සීනි කම්හල් වැඩි දියුණු කරන්න පමණක් නොවෙයි අලුතින් සීනි කර්මාන්තශාලා ආරම්භ කරන්නත් එතුමාට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම කජු වගාව ව්‍යාප්ත කරන්න, තල් වගාව ව්‍යාප්ත කරන්න ගරු ධර්මදාස බණ්ඩා ඇමතිතුමා එදා අතිරේක වැවිලි භෝග සංවර්ධන ඇමතිවරයා හැටියට ක්‍රියා කළා.

ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ මහපොළ සංකල්පය මේ රටේ ජනතාව ඒ කාලයේ බොහොම ගෞරවයෙන් කථා කරපු සංකල්පයක්.

මහපොළ ගැන කථා කරන කොට මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයටත් එය සුවිශේෂ සම්බන්ධතාවක් තිබෙනවා. මහපොළ පළමුවෙන්ම පටන් ගත්තේ ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම ආසනයේ, අපේ ගම වන නියාගම. එහි සියවැනි සංවත්සරය පැවැත්වූයේ මා නියෝජනය කරන බෙන්තර-ඇල්පිටිය ආසනයේ ඇල්පිටියේදී. අපිට මතකයි ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ ඉල්ලීම පරිදි ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා පස්වැනි මහපොළ බිබිල ආසනයේ පවත්වන්න තීරණය කළ බව. බිබිල ආසනයේ මහපොළ පවත්වන කොට මහපොළ සංකල්පය වැඩිය ව්‍යාප්ත වෙලා තිබුණේත් නැහැ. පස්වැනි මහපොළ හැටියටයි එය පැවැත්වූයේ. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ඒ උත්සවයේදී ධර්මදාස බණ්ඩා ඇමතිතුමාගෙන් ඇහුවා, "දැන් මේ මහපොළෙන් ලැබෙන ආදායමෙන් ඔබතුමා මොකක්ද කරන්න බලාපොරොත්තු වන්නේ?" කියලා. බොහොම පරිණත, ඒ වාගේම දුෂ්කර පළාතකින් බිහි වෙලා උගත්කමේ අගය වටහා ගත්තු පුද්ගලයකු හැටියට එතුමා එක පාරටම ඇතුලත්මුදලි මහත්තයාට කිව්වා, "මම මේ ලැබෙන ආදායම අපේ දිස්ත්‍රික්කයේ දුප්පත් දරුවන්ට ශිෂ්‍යත්ව දෙන්නට පාවිච්චි කරනවා" කියලා. ඒ වෙලාවේ තමයි -බිබිල ආසනයේ පැවැති මහපොළේදී ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ සංකල්පය ඇසුවාට පස්සේ තමයි- අධ්‍යාපනයේ වටිනාකම, ශිෂ්‍යත්වයේ තිබෙන වටිනාකම හොඳින් දැන ගත් උගතෙක් හැටියට ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාටත් අදහසක් ආවේ, මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමයක් විශ්වවිද්‍යාල දරුවන් වෙනුවෙන් ඇති කළ යුතුයි කියලා.

කතරගම දේවාලයේ බස්නායක නිලමේ ලෙසත් එතුමා ක්‍රියා කළා. කතරගම මහ දේවාලයේ රන් වියනත්, ඒ වාගේම කතරගම අෂ්ට ඵල බෝධියේ රන් වැටත් ඉදි කළේ ධර්මදාස බණ්ඩා මැතිතුමා බස්නායක නිලමේ හැටියට හිටපු කාලයේ කියලා අපි හොඳින් දන්නවා. කතරගම පෙරහැරේ දියුණුවට විශාල වැඩ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කොටසක් එතුමාගෙන් ඉෂ්ට වුණා. එතුමා බස්නායක නිලමේ කාලයේම තමයි පෙරහැරේ ගමන් කරද්දි බෝම්බ ගහලා 13 දෙනෙක් මරණයට පත් වන හැටිත් එතුමාට දකින්න ලැබුණේ. කිසිම අවස්ථාවක ඒ එකකින්වත් පස්සට නොගිය, අධෛර්යට පත් නොවෙච්ච, කලබල නොවෙච්ච, බොහොම ඉවසීමෙන්, කල්පනාවෙන්, හැම තිස්සේම සිනා මුසුව ඒ සියලුම අභියෝගවලට මුහුණ දුන්නු පුද්ගලයකු හැටියට ධර්මදාස බණ්ඩා මැතිතුමාව අපට හඳුන්වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කාලයේ බොහෝ අවස්ථාවල තරුණ, නවක මන්ත්‍රීවරයෙක් හැටියට මටත් ආරාධනා කළා එතුමාගේ ආසනයේ බල මණ්ඩලවලට, විවිධ රැස්වීම්වලට සහභාගි වෙන්නය කියා. එවැනි විවිධ දේශපාලන කටයුතුවලට අපි එතුමාගේ පළාතට ගියාම එතුමා අපි ගිය වෙලාවේ ඉඳලා ආපසු එන තුරුම අපේ ඉඳුම් හිටුම් ගැන, කෑම බීම ගැන, සැප පහසුව ගැන නිරන්තරයෙන්ම හොයලා බැලුවා. එතුමා බොහොම ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක් වුණත් කනිෂ්ඨ මන්ත්‍රීවරුන් කියලා කිසිම බෙදීමක් නැතුව අපිත් එක්ක ඉතාමත්ම ලෙන්ගතුව, සුහදශීලීව ඒ හැම අවස්ථාවකදීම ක්‍රියා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු කාලයේ එතුමා ආණ්ඩුවට එකතු වුණා. අපි විරුද්ධ පක්ෂයේ ඉතුරු වුණා. හැබැයි ආණ්ඩුවට එකතු වුණාය කියලා, කැබිනට් ඇමතිවරයෙක් වුණාය කියලා අපිව දැක්කාම එතුමාට කිසිම දවසක කිසිම කලබලයක් තිබුණේ නැහැ. එතුමා ඕනෑම හදිසි අවස්ථාවක නැවතිලා, අපිත් එක්ක කථා කරලා බොහොම සුහදශීලීව ආශ්‍රය කළා.

එතුමා ආණ්ඩුව පැත්තට ගියාය කියලා එහෙම භේදයක් නැතිව, කැන්ටින් එකට ගියාම එහා කෙළවරේ වාඩි වෙන වෙලාවට වඩා මෙහා පැත්තේ ඉඳගෙන ගස්ලබු කෑල්ලක් කකා අපිත් එක්ක පරණ විධියටම කථා කරමින්, තමන්ගේ ශරීර සෞඛ්‍යය ගැන කියකියා, පරණ කථා කියකියා, නවක මන්ත්‍රීවරු ඉන්න ඕනෑ විධිය කියකියා, එක්සත් ජාතික පක්ෂයට වෙන්න ඕනෑ දේවල් ගැන කියකියා එතුමා අපිව බොහොම දිරිමත් කරපු අවස්ථාවල් මට හැම තිස්සේම මතක් වෙනවා. තම සහෝදරයාගේ ඝාතනයෙන් පස්සේ දේශපාලනයට ආපු පුද්ගලයෙක් හැටියට පසු කාලයේදී තමන්ගේ ඥාති පුත්‍රයාත් සමඟ -ඝාතනයට ලක් වුණු තමන්ගේ සහෝදරයාගේ පුතා වන රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා එක්ක- එකට මේ පාර්ලිමේන්තුවේ සිටීමේ භාග්‍යය එතුමාට ලැබුණා. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ අද ඉන්න ජ්‍යෙෂ්ඨම මන්ත්‍රීවරයෙක්. එතුමා අවුරුදු 20ක් එක දිගට පාර්ලිමේන්තුව නියෝජනය කරන වැදගත් මන්ත්‍රීවරයෙක්. මේ දෙදෙනා පාර්ලිමේන්තුවේ එකට ඉන්න කොටත් අපි දැකපු දෙයක් තමයි ඉතාම ලෙන්ගතුකමින්, පිය පුතු සම්බන්ධයක් හා සමානව මේ බාප්පාත් ඥාති පුත්‍රයාත් ඇසුරු කරපු හැටි. ධර්මදාස බණ්ඩා මැතිතුමා රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ ජයග්‍රහණ ගැන, එතුමාගේ දේශපාලන කටයුතු ගැන හැම තිස්සේම බොහොම ආඩම්බරයෙන් කථා කළා. එතුමා ආණ්ඩු පක්ෂයට ගිහින් ඇමතිවරයෙක් වෙලාත්, රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා විපක්ෂයේ ඉන්දෙද්දිත් එතුමාගේ දේශපාලන අනාගතය ගැන, එතුමා ගත්ත තීන්දු පිළිබඳව අපිත් එක්ක කථා කළේ බොහොම සන්තෝෂයෙන්.

එතුමාගේ අභාවය ඇත්ත වශයෙන්ම මේ ගරු සභාවට බලවත් පාඩුවක් හැටියට මා දකිනවා. එවැනි පරිණත දේශපාලනඥයෝ හදන්න කලක් යනවා. එතුමා දුෂ්කර පළාතකින් ඇවිල්ලා උගත් මන්ත්‍රීවරයෙක් හැටියට, අධිනීතිඥවරයෙක් හැටියට, ඒ වාගේම විවිධ අමාත්‍යාංශවල ඇමතිකම් දරපු පරිණත පුද්ගලයෙක් හැටියට බොහෝම නිරහංකාර -නිහතමානී- පුද්ගලයෙක් හැටියට ඉතාමත්ම ගෞරවණීය විධියට මේ ගරු සභාවේ කටයුතු කළාය කියන එක අප මේ අවස්ථාවේ සිහිපත් කරනවා. මම මීට වඩා දීර්ඝ කථාවක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමාගේ අභාවය නිසා සංවේගයට පත් වී සිටින එතුමාගේ ආදරණීය මැතිනියටත්, දරුවන්ටත්, විශේෂයෙන්ම අපේ හිත මිත්‍ර රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාටත් මා මේ වෙලාවේ අපේ සංවේගය පළ කරනවා. මොකද රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා තුළ තමන්ගේ බාප්පා කෙරෙහි විශාල ගෞරවයක් තිබුණා. ඒ වාගේම බාප්පා තමන්ගේ ඥාති පුත්‍රයාට අසීමිතව ආදරයක් දැක්වුවා. එවැනි ආදර්ශවත් දෙපළක් හැටියට මේ දෙදෙනා දේශපාලන පොර පිටියේත් කටයුතු කරපු හැටි අප ඉතාමත්ම අගය කරමින් හැම දාම කථා කළා. ඒ නිසා මේ ශ්‍රේෂ්ඨ දේශපාලනඥයාගේ, විශිෂ්ට මනුෂ්‍යයාගේ අභාවය ගැන අපේ සාතිශය සංවේගය එතුමාගේ ආදරණීය මැතිනියටත්, දරුවන්ටත් රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා ඇතුළු පවුලේ සියලු දෙනාටත් නැවතත් පුද කරමින් අප ප්‍රිය කරපු, අප ආදරය කරපු, අප ගරු කරපු අපේ ධර්මදාස බණ්ඩා මැතිතුමන්ට අමා මහ නිවන් සුව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 4.05]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභාවප්‍රාප්ත ගරු ආර්.එම්. ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කර තිබෙන වෙලාවේ මම ටික වෙලාවක් රැඳී සිටියේ එතුමාගේ අභාවය ගැන ශෝක ප්‍රකාශයක් කිරීමේ ඇති වැදගත්කම මැනවින් වටහාගෙනයි. එතුමා අභාවප්‍රාප්ත වූ බව දැන ගන්න ලැබුණු මොහොතේ ඉඳලාම මම අපේ පක්ෂයේ ක්‍රියාකාරීන්ට, ඒ වාගේම අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට දැනුම් දුන්නා, අපේ හිතවත් රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා සමඟ එකතු වෙලා ඒ අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කරලා දිය හැකි සෑම සහයෝගයක්ම ලබා දෙන්න කියලා. ඒ වාගේම මම ඒ නිවසට ගිහිල්ලා ඒ දයාබර භාර්යාවට, දූ දරුවන්ට, ඒ වාගේම අපේ හිතවත් මන්ත්‍රීතුමාට, පළාත් සභා මන්ත්‍රීතුමාට අපේ ශෝකය ප්‍රකාශ කළා. එතුමාගේ අවසන් කටයුතු වෙන අවස්ථාවේත් මම ඒ ස්ථානයේ රැඳී සිටියා. නමුත් මට ඒ අවස්ථාවේ ශෝක ප්‍රකාශයක් කිරීමට නොහැකි වුණා. කෙසේ නමුත් අපේ ඌව වෙල්ලස්සේ ශ්‍රේෂ්ඨ දේශපාලන පවුලක, ශ්‍රේෂ්ඨ දේශපාලන නායකයකුගේ ජීවිතය ගැන යමක් කියන්නට මම දැන් සූදානම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආර්.එම්. ගුණසේකර මන්ත්‍රීතුමාගේ අභාවයෙන් පස්සේ තමයි ආර්.එම්. ධර්මදාස බණ්ඩා මැතිතුමා දේශපාලනයට ප්‍රවිෂ්ට වුණේ. එතුමා 1961 වර්ෂයේ ඉංග්‍රීසි ගුරුවරයකු වශයෙන් රජයේ සේවයේ කටයුතු කරපු කෙනෙක්. ඒ වාගේම 1964 සිට 2010 දක්වා වසර 46ක දීර්ඝ දේශපාලන ඉතිහාසයක් එතුමාට තිබුණා. එතුමා 1964 මැදගම්පත්තු ගම්කාර්ය සභාවේ සභාපති වශයෙනුත්, 1965-76 පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙනුත්, 1977-89 පේෂ කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙනුත්, 1989-90 උඩරට ගැමි පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයා වශයෙනුත්, 1990-94 කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යවරයා වශයෙනුත්, 1994-2000 පාර්ලිමේන්තු මන්ත්‍රී සහ විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක වශයෙනුත්, 2004-2007 පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙනුත්, 2007-2010 අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යවරයා වශයෙනුත් කටයුතු කළා.

මෙතුමා දක්ෂ දේශපාලනඥයෙක්; තමන්ගේ පක්ෂය ජයග්‍රහණය කරවීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරපු ප්‍රබල දේශපාලන නායකයෙක්. මම එතුමා ගැන මීට පෙර දින කරන ලද කථා හැන්සාඩ් වාර්තාව කියවීමෙන් දැන ගත්තා. අද දින කරන ලද කථා මගේ දෙසවන් යොමු කරමින් අසා ගෙන සිටියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා දකින්නේ ලෝකයේ සෑම දේශපාලන චරිතකයම සුදු, කළු කියලා පැති දෙකක් තිබෙනවාය කියායි. මේ හැම කෙනෙක්ම එයට අයත් වනවා. නමුත් දේශපාලනඥයෙකුගේ වැදගත්කම තීරණය වන්නේ ඔහු ගන්නා වූ දේශපාලන තීන්දුවලිනුයි. ධර්මදාස බණ්ඩා මැතිතුමා දීර්ඝ පළපුරුද්දක්, ඉතිහාසයක් ඇතුව දේශපාලන පක්ෂයක නායකත්වයක් දරමින් කටයුතු කරපු කෙනෙක්. එතුමාටත් අපි හැමෝටම වාගේම පක්ෂය තුළ හොඳ නරක, සැලකිලි, නොසැලකිලි කියන අටලෝ දහමට ගෝචර වන්න සිදු වුණා. අටලෝ දහමට එතුමාත් නතු වුණා. එහෙම නැතුව විශේෂයෙන් එතුමාට විතරක් වුණු දෙයක් නොවෙයි.

අපි කාටත් මේ දේශපාලන ජීවිතයේදී පක්ෂවලින් සැලකිලි, නොසැලකිලි, ජනතාවගෙන් සැලකිලි, නොසැලකිලි යනාදී දේවල් ලැබෙනවා. නමුත් අපි වැදගත් විධියට සලකන්නේ එතුමා ගත්ත දේශපාලන තීන්දු සහ එතුමාගේ දේශපාලන ක්‍රියාකාරිත්වයයි. එතුමාගේ දේශපාලන ක්‍රියාකාරිත්වය ඉතා හොඳින් පෙන්නුම් කරන දෙයක් තමයි අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා සංවර්ධන සභාවේ සභාපති වුණු වෙලාව. මම හිතන හැටියට එදා ජනතා විමුක්ති පෙරමුණ පමණයි -මොකද ඒ මැතිවරණය අපි -ශ්‍රී ලංකා නිදහස් පක්ෂය- වර්ජනය කළා.- ඒ මැතිවරණයට නාම යෝජනා දෙන්න ඉදිරිපත් වෙලා හිටියේ. නමුත් අපේ ධර්මදාස බණ්ඩා ඇමතිතුමා කච්චේරියට ගිහිල්ලා ටික වේලාවක් යන කොට ජනතා විමුක්ති පෙරමුණත් තමන්ගේ මැතිවරණ නාම යෝජනා පත්‍රිකාව භකුළා ගෙන ගියා. බයට එහෙම නොවෙයි. එතුමාගේ තිබෙන දේශපාලන උපක්‍රමශීලීභාවය නිසායි. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා නිතරගයෙන් සංවර්ධන සභාවේ සභාපති හැටියට පත් වුණා. එතුමාගේ තිබෙන දේශපාලන උපක්‍රමශීලීභාවය පිළිබඳව මම දැකපු ඉතාම කැපී පෙනෙන අවස්ථාවක් තමයි ඒ. ඒ වාගේ අවස්ථා රාශියක් එතුමාගේ දේශපාලන ජීවිතයේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ, එතුමා ගත්ත වැදගත්ම දේශපාලන තීන්දුව ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට කලින් මතක් කරන්න ඕනෑ, මමත්, එතුමාත් අතර සුහද, සහජීවන, මිත්‍රශීලී දේශපාලන ගමනක් තිබුණේ නැති බව. එය බොරුවක් නොවෙයි. ඒ දේශපාලන ගමන හැල හැප්පිලි, කලකෝලාහල, උසාවි නඩු හබවලින් පිරිලා තිබුණා. මට මතකයි, එක අවස්ථාවක මගේ නඩුවට අපේ වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මගේ පැත්තට කථා කරන්න ආපු අවස්ථාව. හැබැයි අපේ ධර්මදාස බණ්ඩා ඇමතිතුමා, එතුමාට විරුද්ධව මගේ නඩුවට කථා කරන්න ආපු අපේ වර්තමාන ජනාධිපතිතුමාට දිවා භෝජන සංග්‍රහයක් පවත්වන්නත් නොමසුරු වුණා. දේශපාලන වශයෙන් මා සමඟ අරගල කළත් එතුමාගේ තිබෙන දේශපාලන මිත්‍රශීලීභාවය ඒකෙන් අපට පෙනෙනවා. අතිගරු ජනාධිපතිතුමා එදා මට කිව්වා, මල්ලි මම අද කැමට යන්නේ අහවල් තැනට කියලා. ඒක මගේ ජීවිතයේ මට ලැබුණු අපූරු අත්දැකීමක්, අපූරු අවස්ථාවක් හැටියට මම කල්පනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ආණ්ඩුවට එක් වුණු අවස්ථාව තමයි එතුමාගේ දේශපාලන ජීවිතයේ ගත්ත ඉතාම ශ්‍රේෂ්ඨ සහ විශිෂ්ටම දේශපාලන තීන්දුව කියලා මා විශ්වාස කරනවා. නමුත් අවාසනාවකට වාගේ අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඒ තීන්දුවත් එක්ක එකට හිටියේ නැහැ. එතුමාගේ අදහස වෙන එකක් වන්න පුළුවන්. කෙසේ නමුත් ධර්මදාස බණ්ඩා මැතිතුමා ඒ දේශපාලන තීන්දුව ගත්ත වෙලාවේ එතුමා සංවර්ධන සම සභාපති හැටියට පත් කරන්න අතිගරු ජනාධිපතිතුමා මගෙන් ඇහුවා.

ඒ සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට මගේ එකඟතාව මා පළ කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අවස්ථාවේ මා පළාතේ මහ ඇමතිවරයා හැටියටයි කටයුතු කළේ.

එක්සත් ජාතික පක්ෂයේ මේ කණ්ඩායම ආණ්ඩු පක්ෂය පැත්තට පැමිණීම ගැන විරුද්ධත්වය පළ කරමින් ජනතා විමුක්ති පෙරමුණ මුළු රටේම පළාත් සභාවල යෝජනා ගෙනාවා, මේ අය ආණ්ඩු පක්ෂයට ගත්ත එක වැරැදියි කියමින්. ඒ යෝජනාව ගෙනාපු අවස්ථාවේදී අපේ බලය තිබෙන ලංකාවේ සෑම පළාත් සභාවකම අපේ මන්ත්‍රීවරු ජනතා විමුක්ති පෙරමුණ සමඟ එකතු වෙලා ඒ යෝජනාව ජයග්‍රහණය කෙරෙව්වා. ඌව පළාතෙන් විපක්ෂයේ සිට ආණ්ඩු පක්ෂයට ආපු එකම මන්ත්‍රීවරයා වුණේ අපේ ධර්මදාස බණ්ඩා මැතිතුමායි. මම මහ ඇමතිවරයා හැටියට හිටපු ඌව පළාත් සභාවටත් ජනතා විමුක්ති පෙරමුණ මේ යෝජනාව ගෙනාවා. ඒ ගෙනාපු අවස්ථාවේ මම ඉතාම තදින් අපේ මන්ත්‍රීවරුන් සමඟ කථා කරලා, ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාව -විපක්ෂයේ මන්ත්‍රීවරු ආණ්ඩුවට බඳවා ගැනීමට විරුද්ධව ගෙනාපු යෝජනාව- අපි පරාජය කළා කියන කාරණාව මා සිහිපත් කරනවා. අතිගරු ජනාධිපතිතුමා මේ කාරණාව දන්නවා.

විශේෂයෙන්ම අපි දෙපිරිස අතර, ධර්මදාස බණ්ඩා මැතිතුමා, ඒ මැතිනිය, ඒ දරුවන්, අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඇතුළු කිසිවකු සමඟ අපේ පෞද්ගලික අමනාපයක් කවදාවත් තිබුණේ නැහැ. දේශපාලන වශයෙන් දෙපිලකට බෙදිලා බොහොම දරුණු විධියට අපි දේශපාලන අරගලයක යෙදුණා. එවැනි කාරණාවක් මිස වෙනත් පෞද්ගලික විරෝධතාවක් තිබුණේ නැහැ. කෙසේ නමුත් ධර්මදාස බණ්ඩා මැතිතුමා වාගේ දක්ෂ, ශ්‍රේෂ්ඨ දේශපාලන නායකයකු අපේ ප්‍රදේශයට අහිමි වීම ගැන මා පෞද්ගලිකවම කනගාටු වනවා. එතුමාගේ පවුලේ පුරුක් අද දේශපාලනයට දායක කර තිබෙනවා. ඒ අය අතර රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා, හරීන්ද්‍ර බණ්ඩාර පළාත් සභා මන්ත්‍රීතුමා සඳහන් කරන්නට පුළුවන්. හරීන්ද්‍ර බණ්ඩාර පළාත් සභා මන්ත්‍රීතුමා පියාගේ අඩි පාරේ ඇවිල්ලා, අපේ පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට ඌව පළාත් සභාවේ කටයුතු කරනවා. ඉතින් අපි ඒ ගැන සතුටු වනවා. ඒ වාගේම විපක්ෂයේ දේශපාලනය කළත්, රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා පෙරළිකාර චරිතයක් හැටියට ඒ ගෙන යන දේශපාලන අරගලය පිළිබඳවත් අපි සතුටු වනවා.

කෙසේ නමුත් ධර්මදාස බණ්ඩා වැනි ශ්‍රේෂ්ඨ නායකයකු නැතිවීම අපට දැරිය නොහැකි පාඩුවක්. එම පාඩුව මකා ගැනීමට අපට කිසි සේත් පුළුවන්කමක් නැහැ. එතුමාගේ දේශපාලන චරිතයෙන් මා උගත් දෑ බොහෝයි. ඒ උගත් දේවල් රටට, ඌව වෙල්ලස්ස ජනතාවට ප්‍රයෝජනයක් වේ යැයි මා විශ්වාස කරනවා. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් එතුමාගේ සෙවනේ හැදිලා, ඒ මහ ගමන් කරමින් අද දේශපාලන නායකත්වයක් දරනවා.

මා විශේෂයෙන්ම අපේ අතිගරු ජනාධිපතිතුමාගේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, ඌව වෙල්ලස්ස ජනතාවගේත් ශෝකය, ඒ දයාබර මැතිනියට, දූ දරුවන්ට, ඒ වාගේම රංජිත් මද්දුම බණ්ඩාර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. අවසාන වශයෙන් මගේත්, මගේ පවුලේ සියලු දෙනාගේත් ශෝකය ධර්මදාස බණ්ඩා මැතිතුමා වෙනුවෙන් ප්‍රකාශ කරන එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

[4.16 p.m.]

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர் )

(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)

Mr. Presiding Member, it is with deep sorrow that I rise to speak a few words of my Friend, the late Hon. Dharmadasa Banda, who was a friend of all and enemy of none. He was basically an ideal Sri Lankan and a dynamic personality.

Although he was elected largely by the Sinhala voters, he stood tall enough to cut a place for him among the Muslims and the Tamils and he rendered his service to all of them alike. His familiarity with the Muslims began with his being a student at Zahira College, Colombo, where he studied and played with the Muslim students.

His prime concern was the welfare of the common masses. He played a dynamic role as a Parliamentarian, as a Deputy Minister and as a Cabinet Minister in different governments under the leadership of Presidents J.R. Jayewardene, R. Premadasa as well as under our President, His Excellency Mahinda Rajapaksa.

He was one of those 17 Parliamentarians who staged the grand crossover from the UNP to the Government to support the President's effort to liberate the country from LTTE terrorism and to unite all the peoples of Sri Lanka as one nation.

The Hon. Dharmadasa Banda was a great son of Sri Lanka and was a silent worker in the political arena. He bravely stood up to the test of time. As a good sportsman, he took part in several sports activities, particularly volleyball. He also captained school volleyball team. As a devout Buddhist, he engaged himself in religious activities and served as the "Basnayaka Nilame" of *Kataragama Devalaya*. Besides, he was also involved in many charitable activities.

He played a key role in improving the quality of life of the people of his electorate and was keen to see a united Sri Lanka.

He passed out as a lawyer and was a gentleman in politics. He was also an ardent advocate of human rights and democratic values. He proved himself as a people's leader and was a good listener who was always ready to extend assistance to those who came seeking his assistance.

His demise at this critical hour of the development of the country is an irreparable loss to the whole country.

I join the Hon. Members of this House in conveying my deepest condolence to the members of his family.

Thank you.

[අ. භා. 4.20]

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன் - காணி, காணி அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Janaka Bandara Tennakoon - Minister of Lands and Land Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා පිළිබඳව ඉතාම කෙටියෙන් වචන ස්වල්පයක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා. ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා මම ඉතාම ආදරය කරපු, ගෞරව කරපු දේශපාලන චරිතයක්. එතුමා නොයෙක් අවස්ථාවලදී මාත් සමඟ පෞද්ගලිකව කථා බහ කරපු වැදගත්, උතුම් මනුෂ්‍යයෙක්. එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට සිටියදී අසනීපයෙන් හිටපු අවස්ථාවක එතුමාව බලන්න එතුමාගේ නිවසට ගියා මට මතකයි. එතුමා මගේ දෑත් අල්ලාගෙන, සිපගෙන මාත් සමඟ හැඬූ කඳුළෙනුයි කථා කළේ. මම මේක කීම ගැන කවුරුත් අමනාප වෙයි කියලා මා හිතන්නේ නැහැ. මම පුදුම වුණා. එතුමා තමන්ගේ දරුවකුට වැඩිය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාට ආදරය කළා. මම ඇහුවා, "ඔබතුමාගේ පුතෙක් දේශපාලනයට එවන්නේ නැතිව, ඇයි ඔබතුමා සහෝදරයාගේ පුතාව එව්වේ?" කියලා. එතුමා කිව්වා, "මාව එව්වේ මගේ සහෝදරයා. මට යුතුකමක් තිබෙනවා, මගේ සහෝදරයා වෙනුවෙන් ඒ යුතුකම් ඉෂ්ට කරන්න" කියලා. මා හිතන විධියට ඒ අනුව තමයි අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර සහෝදර මන්ත්‍රීතුමාට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ. තමුන්ගේ දරුවාට තිබෙන අයිතිය නොදී, ඒක තමුන්ගේ සහෝදරයකුගේ දරුවකුට ලබා දීම වාගේ උතුම් මනුෂ්‍ය ගුණාංග ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා ළඟ තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාගෙන් යම් කිසි මහජන සේවයක් දේශපාලනික වශයෙන් ලබා ගන්න සිතුවා නම් ඒ සියලු දේවල් ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා හරියාකාරව ඉටු කරලා තිබෙනවා. ධර්මදාස බණ්ඩා මැතිතුමා අපේ පැත්තට ආවත්, එතුමා ඒ ගැන රංජිත් බණ්ඩාර මැතිතුමාට නියෝගයක් කළේවත්, ඉල්ලීමක් කළේවත් කළේ නැහැ. ඒ වාගේ ගුණවත්, අන් අයගේ අදහස්වලට ඉඩ දෙන උතුම් ගුණාංගවලින් පිරිච්ච මනුෂ්‍යයෙක් තමයි ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා කියන්නේ.

මම අද දවසේ කථා කරන්න පැමිණියේත් එතුමාට කරන විශාල ගෞරවයක් වශයෙන්. මම හිතනවා, එතුමාගේ අඩි පාරේ යමින් එතුමාගේ පුතෙකුටත් වැඩිය දුර ගමනක් යන්න ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට හැකි වෙයි කියලා. මා එහෙම ප්‍රාර්ථනා කරනවා. අවසාන වශයෙන් ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමාට නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නවතිනවා.

[අ. භා. 4.23]

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතාවය අමාත්‍යතුමා)**

(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)

(The Hon. P. Dayaratna - Minister of Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප හිතවත් ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේදී, දීර්ඝ කාලයක් එතුමාව දැන හඳුනාගෙන සිටි අයකු වශයෙන්, ඒ වාගේම ඥාතියකු වශයෙන් එතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. එතුමා මට මුලින්ම මුණ ගැහුණේ 1965 වර්ෂයේයි; මම මුලින්ම අම්පාර ප්‍රදේශයට ගිය කාලයේයි. එතුමා

මන්ත්‍රීවරයකු බවට පත්වෙලා, ඉඟිනියාගල තානායමේදී මුලින්ම මුණ ගැසුණු අවස්ථාව මට මතකයි. ඒ වාගේම යම් කිසිවෙකු මාව එතුමාට හඳුන්වා දුන් අවස්ථාව මට මතකයි.

ඊට පසු කාලයක එතුමා යම් කිසි යෝජනාවක් කළා, සේනානායක සමුද්‍රයේ වේල්ල අසල තිබෙන කඳු බෑවුම උඩ ඩී.එස්. සේනානායක මැතිතුමාගේ පිළිරුවක් ඉදි කිරීමට. ඒ යෝජනාව අනුව ඒ පිළිරුව සකස් කළා. එදා ඒ පිළිරුව විවෘත කරන අවස්ථාවට මමත් සහභාගි වුණා, ඒ ප්‍රදේශයේ රජයේ සේවකයකු හැටියට.

ධර්මදාස බණ්ඩා මැතිතුමා මුලින්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට පත් වුණේ වයස අවුරුදු 27ක පමණ ඉතාමත් ළා බාල වයසකදීයි. එතුමාගේ සහෝදරයා -අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ පියාණන්- සාහසිකයකුගේ වෙඩි පහරකින් ජීවිතක්ෂයට පත් වුණාට පස්සේ 1965 දී එතුමා පළමු වරට මැතිවරණයකට තරග කරලා එම ස්ථානයට පැමිණියා. එතැන් සිට එතුමා දීර්ඝ කාලයක් මන්ත්‍රීවරයකු, නියෝජ්‍ය අමාත්‍යවරයකු, රාජ්‍ය අමාත්‍යවරයකු සහ කැබිනට් අමාත්‍යවරයකු හැටියට කටයුතු කළා. එදා එතුමා මුලින්ම තරග කරලා පරාජයට පත් කළ රොනී ද මැල් මැතිතුමා සමඟ පසු කාලයකදී කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුන් හැටියට කටයුතු කරන්නටත් එතුමාට අවස්ථාව ලැබුණා.

ධර්මදාස බණ්ඩා මැතිතුමා බිබිල ප්‍රදේශයේ දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන වැදගත් පවුලක සාමාජිකයෙක්. එතුමාගේ පියා බිබිල මැදගම්පත්තුවේ කෝරලේ මහත්මයා. ඒ වාගේ පියකුගේ දරුවකු හැටියට ඒ ප්‍රදේශයේ නායකත්වය ගන්නට එතුමාට සහජ හැකියාවක් තිබුණා. ඒ ප්‍රදේශයේ සමාජ සේවකයකු හැටියටත්, සමුපකාර සංගම්වල නායකයකු හැටියටත්, ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියටත් එතුමා කටයුතු කළා.

එතුමා 1965 සිට 1970 දක්වා මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කළා. 1970 වර්ෂයේ මමත් රාජ්‍ය සේවය අත් හැරලා පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරන අවස්ථාවේදී, එතුමාත් බිබිල මැතිවරණ කොට්ඨාසයට තරග කළා. එම අවස්ථාවේදී අප දෙදෙනාම පරාජයට පත් වුණා. එතුමා එම කාලය ප්‍රයෝජනයට ගත්තා, විශේෂයෙන්ම තමන්ගේ අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කර ගන්නට. නීති විද්‍යාලයට ගොස්, නීතිඥයකු හැටියට සමත් වෙලා, නීතිඥයකු හැටියට කටයුතු කරන්නට එතුමාට ඒ කාලය ප්‍රයෝජනවත් වුණා. ඒ සමඟම දේශපාලන කටයුතුවල නිරත වෙමින්, අධ්‍යාපන කටයුතුත් කර ගෙන, ඊ ළඟ වතාවේ 1977 මැතිවරණයට තරග කළා. අසල්වැසි මැතිවරණ කොට්ඨාසවල අපේක්ෂකයන් හැටියට අපි තරග කරපු අවස්ථාවේදී, එතුමාටත්, මටත් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගන්නට පුළුවන් වුණා.

1977 දී පේෂකර්ම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට පත් වුණාට පස්සේ එතුමා පේෂ කර්මාන්තය පිළිබඳව විශාල උනන්දුවකින් කටයුතු කළා. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල අත් යන්ත්‍රවලින් රෙදි පිළි සකස් කිරීම සහ ඇඟලුම් කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා විශාල වැඩ කොටසක් එතුමාගේ කාලය තුළ ක්‍රියාත්මක කළා. පසු කාලයකදී විවෘත ආර්ථිකයත් සමඟ ඒ සඳහා වෙළෙඳ පොළක් නොමැති වීම නිසා එය දුර්වල තත්ත්වයකට පත් වුණත් ඒ අවස්ථාව අනුව ඇමතිවරයා හැටියට එතුමා ග්‍රාමීය ජනතාව වෙනුවෙන් විශාල සේවයක් ඉටු කළා. ගැමියෙකු හැටියට, ගමේ උපන් කෙනෙකු හැටියට එතුමා තුළ ගොවිතැන පිළිබඳව මනා අවබෝධයක් තිබුණා.

1989 මැතිවරණයෙන් ජයග්‍රහණයක් ලැබූ එතුමා උඩරට ගැමි පුනරුත්ථාපන ඇමතිවරයා හැටියට පත් වුණා. ඒ කාලයේදී මා ඉඩම් හා මහවැලි ඇමතිවරයා හැටියට කටයුතු කළ අවස්ථාවේදී අපට ඉතාම කිට්ටුවෙන් කටයුතු කරන්නට අවස්ථාව ලැබුණා. අධිරාජ්‍යවාදීන්ගේ සමයේදී, තමන්ගේ ඉඩම් නැති වෙලා, විශාල අවහිරතාවලට මුහුණ දෙන්නට සිදුවුණු උඩරට ප්‍රදේශයේ සිංහල ජනතාවට, ජලාශ ඇති කිරීම නිසා නැවත වරක් අලුත් ඉඩම් ලැබුණු ප්‍රදේශවලට යාමට සිදුවීම ගැන එදා යම්කිසි විරෝධයක් තිබුණා. ඒ කාලයේදී ගාමිණී දිසානායක ඇමතිතුමා එතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කළා, ඒ ප්‍රශ්නය විසඳන්නය කියලා; උඩරට ගැමි ප්‍රදේශවලට ගිහිල්ලා ඒ පිළිබඳව කතා කරලා ඒ අයට මේ ගැන තේරුම් කර දෙන්නය කියලා; දැනට පදිංචි ප්‍රදේශවලට වඩා එවැනි ව්‍යාපාරයක් තුළින් ඒ ප්‍රදේශවලට යන එක කොතරම් දුරට වැදගත්ද කියන එක ඒ අයට තේරුම් කර දෙන්නය කියලා. ඒ අනුව එතුමා කටයුතු කළා.

පසුව 2001 වර්ෂයේදී එතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට පත් වුණා. එතැනදි තමයි එතුමාගේ දක්ෂකම් දක්වලා විශේෂයෙන්ම ගම් පළාතේ ජනතාවට උදව් කරන්න එතුමාට අවස්ථාව ලැබුණේ. මොනරාගල දිස්ත්‍රික්කය කියන්නේ උතුරුමැද පළාතේ සමහර දිස්ත්‍රික්කවලට වඩා නොදියුණු දිස්ත්‍රික්කයක් හැටියටයි අපි දැනගෙන සිටියේ. ධර්මදාස බණ්ඩා මැතිතුමා තමයි ඒ ප්‍රදේශයෙන් බිහි වුණු පළමු දිස්ත්‍රික් නායකයා. එතුමා ඒ ප්‍රදේශයේ දියුණුව සඳහා විශාල වැඩ කොටසක් ඉෂ්ට කරන්නට ඉතා ඕනෑකමින් කටයුතු කළා. එදා එක්සත් ජාතික පක්ෂයේ දිස්ත්‍රික් නායකයා හැටියටත් කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියටත් විශාල සේවයක් කරන්නට එතුමාට පුළුවන් වුණා.

ඊට අමතරව ගරු රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලය තුළ එතුමා නියෝජනය කළ, එතුමා නායකත්වය දරපු දිස්ත්‍රික්කය තුළ දෙවතාවක්ම බුත්තල සහ කතරගම "ගම් උදාව" උත්සවය පවත්වන්නට තරම් එතුමා වාසනාවන්ත වුණා. අපි දන්නවා, "ගම් උදාව" උත්සව පැවැත්වීමෙන් ඒ ප්‍රදේශවලට විශාල යහපතක් සිද්ධ වුණාය කියන එක. මොකද, මුල් කාලයේ "ගම් උදාව" උත්සවවලට වඩා පසු කාලයේ පැවැත්වූ "ගම් උදාව" උත්සව තුළින් එය පැවැත්වූ ප්‍රදේශවල ජනතාවට විශාල සේවයක් සිද්ධ වුණා. තුන්වනුව, නැවත වරක් බුත්තල ප්‍රදේශයේ "දැයට කිරුළ" ප්‍රදර්ශනය පැවැත්වීම තුළිනුත් ඒ ප්‍රදේශයේ ඇති වුණු විශාල සංවර්ධනය ගැනත් එතුමා හුඟක් දුරට සතුටු වෙන්නට ඇතිය කියා අප හිතනවා.

එතුමා කලක් කතරගම මහා දේවාලයේ බස්නායක නිලමේ වශයෙන් කටයුතු කළා. ඒ වාගේම මාලිගාවිල බුදු පිළිමය නඟා සිටුවීමට ප්‍රේමදාස ජනාධිපතිතුමාත් සමඟ එතුමා කටයුතු කළ ආකාරය පිළිබඳව අප හොඳහැටි දන්නවා.

සීනි කර්මාන්තය පිළිබඳවත් එතුමා තුළ තිබූ උනන්දුව ඉතා විශාලයි. එක්තරා අවස්ථාවක -1970 - 1977 කාලයේ- සීනි පිට රටින් ගෙන්වීම අඩු කර තිබුණ කාලයක, සීනි වෙනුවට උක් හකුරු නිෂ්පාදනය කරන්නට ජනතාව උනන්දු කළ කාලයක මොනරාගල දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් උක් වගාව වැඩි වුණු බව මට මතකයි. එතුමා ඒ අනුව ඒ ප්‍රදේශයේ වාරි පහසුකම් නොමැති බිම්වල උක් වගා කරන්නට විශාල මෙහෙවරක් කළාය කියා අපට කියන්නට පුළුවන්. ඒ කාලය තුළදී තමයි බිබිලේ උක් කර්මාන්තශාලවක් ඇති කරන්නට යෝජනාවක් ඉදිරිපත් වුණේ. නමුත් යම් යම් විරෝධතා තිබුණා. පාරිසරික වශයෙන් ප්‍රශ්නයක් තිබෙනවාය කිව්වාට ඇත්ත වශයෙන්ම පාරිසරික ප්‍රශ්නයක් ඒ අවස්ථාවේ තිබුණේ නැහැ.

තම තමන්ගේ ගෙවතුවල උක් වගා කර ඒ උක් කර්මාන්තශාලාවලට සැපයීම තමයි යෝජනා කළේ. පළමුවන

[ගරු පී. දයාරත්න මහතා]

වරටයි එවැනි ව්‍යාපෘතියක් යෝජනා කළේ. එතුමා බොහොම ඕනෑකමින් ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නට උත්සාහ කළා. නමුත් එය අසාර්ථක වුණා. ඒ වාගේම තමයි සියඹලාණ්ඩුව ප්‍රදේශයේ තව උක් වගාවක් ඇති කරන්නටත් එතුමා ඒ කාලය තුළ විශාල උනන්දුවකින් කටයුතු කළා කියන එක. එම නිසාම තමයි අද අපට හිතන්නට පුළුවන්, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවලින් වැඩියෙන්ම උක් වගා කරන, උක් නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කය මොනරාගල දිසත්‍රික්කයයි කියා.

2004 වර්ෂයේ අප නැවත වරක් පාර්ලිමේන්තුවට පත්වුණා. 2005 වර්ෂයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා වශයෙන් පත් වුණාට පස්සේ යුද්ධය පැවැත්වෙන ආකාරය පිළිබඳව යම් කිසි වෙනසක් ඇති වන්නට පටන් ගත්තා. එක්තරා පිරිසක් එය දුටුවා. විශේෂයෙන් ධර්මදාස බණ්ඩා මැතිතුමා මේ පිරිස අතර නායකත්වය ගෙන කටයුතු කොට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහාය දෙන්නට තීරණයක් ගත්තා. අප 20ක විතර කණ්ඩායමක් එකතු කර ගෙන නිතරම සාකච්ඡා කර -ගරු ජනාධිපතිතුමාත් එක්ක නිතර සාකච්ඡා කර- රජයට සම්බන්ධ වෙලා රජයට සහයෝගය දෙන්නට වැඩ පිළිවෙළ සකස් කළා. ඒ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයට තිබුණු වැඩිපුර ඡන්ද ප්‍රමාණය ඉතාම සුළු ප්‍රමාණයක්. එම නිසා අය වැය විවාදයකදී පරජයට පත් වන්නට තිබුණු අවස්ථාවක අප 17 දෙනෙක් රජයට සම්බන්ධ වුණා. මමත් ඒ කණ්ඩායමේ කෙනෙකු හැටියට ඉදිරිපත් වුණා. එම නිසා කවුරුන් විශ්වාස කළත් නොකළත් යුද්ධය අවසන් කරන්නට විශාල මෙහෙවරක් එදා අපේ ඒ කණ්ඩායම තුළින් සිදු වුණාය කියා මා විශ්වාස කරනවා,

ඊට පසු 2010 වර්ෂයේ එතුමාට අතිරේක වැවිලි භෝග අමාත්‍යවරයා හැටියට කටයුතු කරන්නට අවස්ථාව ලැබුණා. ඒ රජයට සම්බන්ධ වුණාට පස්සේ. රජයට සම්බන්ධ වෙලා 2010 වර්ෂයේ පැවැති මැතිවරණයට අසනීප තත්ත්වය නිසා එතුමා ඉදිරිපත් වුණේ නැහැ. අසනීප තත්ත්වය නිසා අවසාන කාලය එතුමා ගත කළේ තමන්ගේ දූ දරුවන් සහ පවුලේ සියලු දෙනා සමඟයි.

ඒ කාලය තුළදීත් අපි නිතර එතුමා හමු වුණා; කථා බහ කළා; සුව දුක් විමසුවා. ඉතාමත් හිතවත් මිත්‍රයෙක් හැටියට ඒ කාලය තුළදීත්, විශේෂයෙන්ම රජයට සම්බන්ධ වුණාට පස්සේත් ඒ කණ්ඩායම සමඟ එතුමා කටයුතු කරපු ආකාරය අපි නැවතත් සිහිපත් කරනවා. මොනරාගල වාගේ දිස්ත්‍රික්කයක පළමුවැනි වරට දිස්ත්‍රික්කයේ නායකත්වය රැගෙන හතළිස් අවුරුද්දකට වැඩි කාලයක් දේශපාලනඥයෙකු හැටියට දිස්ත්‍රික්කයට නායකත්වය දීලා දුප්පත් ජනතාව, විශේෂයෙන් ගොවි ජනතාව ජීවත් වන දිස්ත්‍රික්කයකට කරන ලද සේවය නිසා මම හිතනවා, දේශපාලන භේදයකින් තොරව එම දිස්ත්‍රික්කයේ සියලුම ජනතාව එතුමාගේ අභාවය පිළිබඳව එදා ශෝක වුණාය කියා. අද එතුමා පිළිබඳව අපේ මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා කළ කථාවලදී එතුමාගේ ගුණ යහපත්කම් ගැන, එතුමා කරන ලද සේවය පිළිබඳව ඒ ඒ අය දන්නා ආකාරයට නොයෙකුත් දේවල් ප්‍රකාශ කරන්නට යෙදුණා. සමහර දේවල් අපි මීට පෙර අහලා තිබුණේත් නැහැ. එවැනි ඉතා වැදගත් කාරණා පිළිබඳවත් අද අපට අහන්නට ලැබුණා.

ගරු ධර්මදාස බණ්ඩා හිටපු ඇමතිතුමා අප අතරින් වෙන් වීම පිළිබඳව අපගේ ශෝකය එතුමාගේ ආදරණීය බිරිඳටත්, පුතුන් දෙදෙනාටත්, දියණියන් දෙදෙනාටත් පළ කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව මෙතෙකින් සමාප්ත කරනවා. ස්තුතියි.

[අ. භා. 4.41]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙකු හැටියටත්, ඒ වාගේම ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෙකු හැටියටත් ධර්මදාස බණ්ඩා මැතිතුමා අපි දීර්ඝ කාලයක් තිස්සේ හඳුනාගෙන සිටියා. විශේෂයෙන් අද මේ පාර්ලිමේන්තුවේදී එතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ගෙනෙන ලද අවස්ථාවේ ඉතාමත්ම වැදගත් කරුණු රාශියක් එතුමා ගැන අනාවරණය වුණා.

මා 1994 දී මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙකු හැටියට පත් වුණා. ඒ කාලයට කලින් එතුමාත් එක්ක කටයුතු කරන්න මට වාසනාවක් ලැබුණා. විශේෂයෙන් 1993 දකුණු පළාත් සභා මැතිවරණය අවස්ථාවේ හක්මන මැතිවරණ කොට්ඨාසයේ සංවිධාන කටයුතු භාර දීලා තිබුණේ ධර්මදාස බණ්ඩා මැතිතුමාටයි. එතුමා මගේ ආසනයට එන කොට මම වරක් ආසනයේ සංවිධායක හැටියටත්, ඒ වාගේම දෙවරක් දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියටත් තේරී පත් වෙලායි හිටියේ. ඒ අවස්ථාවේදී එතුමා මගේ ආසනයට ඇවිල්ලා මැතිවරණ සංවිධාන කටයුතු කරන අවස්ථාවේ මට කිව්වා, -ඒක එතුමාගේ තිබුණු පුදුම ගුණයක්- "අනෙක් ආසනවල වැඩ කටයුතු බලා ගන්න, මම ආසනය බලා ගන්නම්. පිටට ගිහින් ඡන්ද ටික සොයා ගන්න" කියලා. ඒ විධියට එතුමා මගේ ආසනය භාර අරගෙන තමාගේ මැතිවරණයක් හා සමානව මගේ ඡන්ද පදනම හදන්න අල්ලපු ආසනයට පමණක් නොවෙයි කඹුරුපිටිය ආසනයටත් ගිහිල්ලා මා වෙනුවෙන් කථා කළා.

එහෙම කථා කළා පමණක් නොවෙයි, මැතිවරණය අවසන් වුණාම එම්.එස්. අමරසිරි මැතිතුමා දකුණු පළාත් සභාව පිහිටුවන්න සූදානම් වන විට දිස්ත්‍රික්කයෙන් ඇමතිවරු දෙදෙනෙක් පත් කරන අවස්ථාවේ කෘෂිකර්ම ඇමතිකම මට ලබා දෙන්න ධර්මදාස බණ්ඩා මැතිතුමා ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා සමඟ කථා කළා. ඒ වෙලාවේ මගේ නම නිර්දේශ වෙලා ඒ බව මට දැන්වුවා. නමුත් නඩුවක් නිසා දකුණු පළාත් සභාව තියන්න බැරි වුණා. එතුමා එදා මට ප්‍රකාශ කළේ, අපට එකතු වෙලා වැඩ කොටසක් කරන්න පුළුවන් නිසා එතුමා මාව නම් කළාය කියලායි.

මට විතරක් නොවෙයි, ඒ විධියට එතුමා හඳුනා ගත්ත, එතුමාට ආදරය කළ හැමෝටම එතුමාගේ ඒ ගුණවත්කම තිබුණා.

1964 දී එතුමා දේශපාලනයට ඉදිරිපත් වුණේ ගම් සභාවේ සභාපතිවරයකු හැටියටයි. මම දන්නා දේශපාලන ඉතිහාසය අනුව නම් රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ පියා එදා ගම් සභා කොට්ඨාස 14ම දිනුවා. ඒ නිසා එතුමාට දේශපාලන තර්ජන ඇවිල්ලා එතුමා මිය ගියා. තම සහෝදරයා මිය ගියාට පසුව ධර්මදාස බණ්ඩා මැතිතුමා පාර්ලිමේන්තුවට තරග කරලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා වසර 34ක් වැනි දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් සහ ඇමතිවරයෙක් හැටියට කටයුතු කළා.

මා එතුමාගේ දැක්ක විශේෂ ගුණයක් තමයි අදාළ විෂය පිළිබඳව හැම තිස්සේම අධ්‍යයනය කිරීම. අපි දැක්කා එතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට කටයුතු කරන කාලයේ කෘෂිකර්ම විෂය පිළිබඳව -තාක්ෂණය, බීජ වර්ග, බෝග වර්ග වාගේ හැම දෙයක් පිළිබඳවම- එතුමාට විශාල දැනුම් සම්භාරයක් තිබුණු බව.

ඒ වාගේම එතුමාට හොඳ මතකයක් තිබුණා. කිසිම කලබලයක් නැතිව ඕනෑම ප්‍රශ්නයකට මුහුණ දෙන්න පුළුවන් ශක්තියක් එතුමාට තිබුණා. එතුමා ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරයා හැටියට හිටපු කාලයේත්, ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා හැටියට කටයුතු කළ කාලයේත් විශේෂයෙන්ම එතුමාට පාර්ලිමේන්තුවේ තිබුණු පළපුරුද්ද අපි දැක්කා. එතුමා පාර්ලිමේන්තුවේදී කථාවක් පවත්වන විට ඒ විෂය පිළිබඳව ඉතාමත්ම හොඳින් කථා කළා. බොහෝ වෙලාවට විෂයයෙන් පරිබාහිරව කථා කළේ නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායේදී අපට එතුමාගේ ජීවිතයෙන් ගන්න පුළුවන් ආදර්ශ රාශියක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා තමන්ගේ ප්‍රදේශයට විශාල සේවයක් කළා. ඒ ප්‍රදේශයේ අධිරාජ්‍යවාදීන් කඩා බිඳ දැමූ වැව් අමුණු සකස් කිරීම විශාල වශයෙන්ම ආරම්භ කළේ ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ කාලයේදීයි. 1977න් පසුව එම ප්‍රදේශයට විදුලිය ලැබුණේ ධර්මදාස බණ්ඩා ඇමතිතුමාගේ කාලයේයි. එතුමා මේ රටටත්, තමන්ගේ ආසනයටත්, ඒ වාගේම ජනතාවටත් විශේෂ වැඩ කොටසක් ඉටු කළා. ගමෙන් ආපු දේශපාලනඥයෙක් හැටියට එතුමා කොයිම අවස්ථාවකවත් ග්‍රාමීය පරිසරය අමතක කළේ නැහැ. ග්‍රාමීය පරිසරය තුළ මිනිසුන් පිළිබඳව එතුමාට හොඳ අවබෝධයක් තිබුණා. එතුමාගේ ජීවිතයෙන් ගොඩක් ආදර්ශ ගන්න පුළුවන්.

එතුමා ඉතාමත් පරිණත දේශපාලනඥයෙක්. ඒ වාගේම එතුමා දේශපාලනය කරන කාලය තුළ නිර්භයව තමන්ගේ දේශපාලන කටයුතු කළා. එතුමා තුළ තමන්ගේ පක්ෂයට පුදුමාකාර කැපවීමක් තිබුණා. ඒ වාගේම මට මතකයි අපි රජයට එක් වන තීන්දුවක් ගන්න අවස්ථාවේ රජයට එක් විය යුතු හේතු පිළිබඳව එතුමා හොඳ අධ්‍යයනයක් කරලා තිබුණා. ඒ අධ්‍යයනයත් එක්ක එතුමා කථා කළා. "මේ වෙලාවේ අපි රජයත් සමඟ කටයුතු කළ යුතුයි. මේ අවස්ථාවේදී අපි රජයට එකතු වෙලා කටයුතු කළේ නැත්නම් මේ රටේ අනාගතයක් ඇති වෙන්නෙත් නැහැ. අපි මේ වෙලාවේ රටට සේවයක් කරන්න ඕනෑ. ඒ නිසා එක පැත්තකින් අපි ඒ තීන්දුව නිවැරදිව ගන්න ඕනෑ. භය විය යුතු නැහැ." ආදී වශයෙන් අපි සාකච්ඡා කරන හැම අවස්ථාවකදීම එතුමාගේ අදහස් ප්‍රකාශ කළා. ධර්මදාස බණ්ඩා මැතිතුමා ගරු කළ යුතු දේශපාලනඥයෙක්. ඒ වාගේම එතුමාගේ පැවැත්මෙන් සහ එතුමාගේ දේශපාලන කටයුතුවලින් අපේ ජීවිතයට ගන්න පුළුවන් ආදර්ශ රාශියක් තිබෙන බව මා නැවතත් මතක් කරන්න ඕනෑ.

එතුමා හොඳට යුතුකම් දන්නා කෙනෙක්. ධර්මදාස බණ්ඩා මැතිතුමා යුතුකම් දන්නා කෙනෙක් හැටියට රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ පියා නැති වුණාට පසුව එතුමාට දේශපාලන ගමන යන්න උදවු කළා වාගේම ඒ පවුල ගැන සොයා බලමින් යුතුකම් ඉෂ්ට කළා. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට තිබෙන ඉවසීමත්, පළපුරුද්දත් ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ ආභාසයෙන් ලැබුණු දේවල් හැටියට මම දකිනවා.

අවසාන වශයෙන් මගේ පෞද්ගලික ශෝකයත් මගේ බිරිඳ ඇතුළු පවුලේ ශෝකයත් ධර්මදාස බණ්ඩා මැතිනියට, ඒ පවුලේ දූ දරුවන්ට ඒ වාගේම මා හිතවත් රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාටත් මේ අවස්ථාවේදී පිරිනමමින් ධර්මදාස බණ්ඩා මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 4.49]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ආදරණීය ඥාතිවරයාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයේම මැතිඇමතිවරුන් කරන ලද කථා මා අහගෙන හිටියා. ඒ පවුලේ සාමාජිකයෙක් විධියට පවුලේ සියලු දෙනා වෙනුවෙන් ඒ මන්ත්‍රීවරුන් සියලු දෙනාට මගේ ගෞරවණීය ස්තුතිය පිරිනමනවා. මගේ ඥාතිවරයාගේ අභාවය පිළිබඳව කනගාටු වෙද්දි අපේ ශෝකය, කනගාටුව තුරන් කර ගන්න ඒ මන්ත්‍රීවරුන් සියලු දෙනා අපට දුන්න ශක්තිය, ඒ සහෝදරත්වය, මිත්‍රත්වය ගැන මගේ ගෞරවණීය ස්තුතිය නැවත වරක් පිරිනමනවා. අද පාර්ලිමේන්තුවේදී ඒ වාගේ ස්තුතියක් කරන්න මට පුළුවන්කම ලැබුණේ මගේ ආදරණීය බාප්පා මගේ දේශපාලන ගුරුවරයා විධියට, මගේ පියා විධියට මට මේ ගමන එන්න අවස්ථාව ලබා දීම නිසයි. මේ වෙලාවේ එතුමා ගැන මන්ත්‍රීවරු කථා කළ නිසා මා කථා කිරීමේ අවශ්‍යතාවක් නැහැ. නැවත වරක් මේ ගරු සභාවේ සියලු දෙනාටම අපේ පවුල වෙනුවෙන් -මගේ පුංචි අම්මා ඒ වාගේම සහෝදර සහෝදරියන් වෙනුවෙන්- ස්තුතිය ප්‍රකාශ කරමින් මා නවතිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

Order, please! හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.එම්. ධර්මදාස බණ්ඩා මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් මම ඒ හා සමඟ එකතු වීමට කැමැත්තෙමි. අද දිනයට අදාළ නිල වාර්තාවේ -හැන්සාඩ් වාර්තාවේ- පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම විධාන කරමි.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன் - காணி, காணி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Janaka Bandara Tennakoon - Minister of Lands and Land Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභානායකතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2011 ඔක්තෝබර් මස 06 වැනි බ්‍රහස්පතින්දා අ.භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉඩම් ලියා පදිංචි කිරීමේ අලුත් වැඩ පිළිවෙළ අවලංගු කිරීම
வடக்கு, கிழக்கில் காணிகளைப் பதிவுசெய்யும் புதிய முறைமையை இரத்துச் செய்தல்
CANCELLATION OF NEW SYSTEM FOR REGISTRATION OF LANDS IN NORTHERN AND EASTERN PROVINCES

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Mr. Presiding Member, I thank you very much for giving me permission to move the Adjournment Motion regarding the unsatisfactory arrangement to register ownership of lands in the Northern and Eastern Provinces.

Sir, I move,

"The Secretary, Ministry of Lands and Land Development has made announcement requesting people in the Northern Province to apply for a new Deed. According to the News Item appearing in the "Island" newspaper of 09th September, 2011,

Ministry of Lands and Land Development will verify the authentication of each application and that the respective land will be surveyed before a new Deed is issued to the rightful owner.

The Law applicable to registration of ownership in Sri Lanka is the Registration of Documents Ordinance except in areas in which Registration of Title Act has been brought into operation.

The Bar Association of Sri Lanka has pointed out numerous deficiencies in Registration of Title Act and called for amendments to that Act before it is implemented.

The ownership of any land can be registered in accordance with an applicable Law but the Ministry of Lands and Land Development cannot seek to give Deeds and decide on the Title and ownership of lands without having legal provision therefor.

The Grama Sevakas in the Nallur area have started distributing forms and collecting information.

The indication at the bottom of the form is that authentication of Title will be ultimately decided on observation and certification from the Grama Niladharis which arrangement is unsatisfactory.

This Assembly directs the Secretary, Ministry of Lands and Land Development to cancel the announced system of registering lands."

There are people who own lands but do not have deeds. What can they do?

Some owners of the property in Jaffna live outside Jaffna and in foreign countries. What is the arrangement that the Secretary to the Ministry of Lands and Land Development has made for these types of persons to apply and get a new deed? This can be made applicable only to those people who are living and having deeds in the Northern Province. There is another type of people in Jaffna who own lands but they do not have deeds. When a person dies intestate, his properties devolve around his children. They need not have deeds unless, of course, they make a deed of declaration.

Registration of Title Act, No. 21 of 1998 was passed in Parliament under very unfortunate circumstances in spite of opposition from the Bar Association of Sri Lanka and from certain Members of Parliament, both in the Government and the Opposition. The Bar Association of Sri Lanka appointed a committee to study the Registration of Title Bill of which Mr. Nihal B. Pieris, Attorney at Law and Notary Public was the convener. Among the other members who actively participated in the committee were Messrs Nehru Gunathileke, PC, - Chairman, Mahinda Ellapola, K. Sivanathan, Elmo Perera and K. Neelakanthan.

People of Sri Lanka are indeed very unfortunate that a Minister holding a responsible portfolio, who from the observation of the Bar Association of Sri Lanka relating to 35 Clauses, accepting 83 points as requiring amendment, was later instrumental in having the Bill passed in Parliament without any amendment whatsoever and also without considering the observations of the Bar Association of Sri Lanka on the balance 40 Clauses of the Bill.

In fact, it is the view of the members of the committee that existing laws relating to the establishment of title to lands are generally adequate. The Registration of Documents Ordinance is well framed and it has worked satisfactorily over the years. There is no problem as far as the law is concerned.

If the Government intends proceeding with the registration of title to lands, the Government should repeal the Act and introduce a new Bill drafted by the Legal Draftsman's Department, in consultation with a committee comprising of persons from the public and private sector who are well conversant with registration of title.

According to Section 1 of the Registration of Title Act, it shall apply to such Province, Administrative Districts or Administrative Divisions specified and the Minister's Order published in the gazette and in the newspapers. To my knowledge, no area has been gazetted as yet.

The Government has prevented people from Mullikulam in Mannar, Keppapulavu in the Mullaitivu District, Mandaithivu and parts of Valigamam North including Myliddy and about 6,000 persons from Sampur from resettling in their own lands.

If the main objective of the Act is to facilitate the establishment of title to lands and to make marketable the title that is defective, the objective can be achieved more efficiently and speedily under a voluntary system of registration of title. Even in Western Australia, registration of title is not compulsory.

As the proposed system of registration of title is irregular, illegal, cumbersome and expensive, I want the Secretary to the Ministry of Lands and Land Development to cancel the proposed system of registration of lands.

Hon. Presiding Member, I know that the Minister of Lands and Land Development is a very good person. He will understand the difficulties and take steps to see that some relief is given.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Will an Hon. Member second the Motion? [*Pause.*] No. Order, please! Standing Order No. 34 (1) states, I quote:

"A motion or amendment which by these Standing Orders is required to be seconded, and is not, shall lapse."

Therefore, the Motion has lapsed.

எனவே, உங்களால் சமர்ப்பிக்கப்பட்டுள்ள பிரேரணை மீதான விவாதத்தைத் தொடர்ந்து முன்னெடுத்துச் செல்ல முடியாதெனத் தீர்ப்பளிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.00ට, අද දින සභා සම්මතිය අනුව 2011 ඔක්තෝබර් මස 06 වන බ්‍රහස්පතින්දා අ.භා.1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 5.00 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 2011 ஒக்ரோபர் 06, வியாழக்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 5.00 p.m. until 1.00 p.m. on Thursday, 6th October, 2011, pursuant to the Resolution of the Parliament of this Day.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: ගුරු ඌනතා
## கொட்டபொல கோட்டக்கல்வி அலுவலகம் நிருவகிக்கும் பாடசாலைகள் : ஆசிரியர் பற்றாக்குறை
## SCHOOLS ADMINISTERED BY KOTAPOLA DIVISIONAL EDUCATION OFFICE : TEACHER SHORTAGE

0811/'10

1. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் தெனியாய வலயக் கல்வி காரியாலயத்திற்குரிய கொட்டபொல கோட்டக்கல்வி அலுவலகத்தினால் நிருவகிக்கப்படுகின்ற அரசாங்க பாடசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,

(ii) இப்பாடசாலைகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவையென்பதையும்,

(iii) இப்பாடசாலைகளில் நூறு மாணவர்களுக்குக் குறைவாக உள்ள பாடசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,

(iv) அப்பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ஆ) (i) இக்கோட்டத்தில் ஆசிரியர் மிகை நிலவுகின்ற பாடசாலைகள் உள்ளனவா என்பதையும்,

(ii) இப்பாடசாலைகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவையென்பதையும்,

(iii) ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலைகளின் பெயர்களையும்,

(iv) ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடங்களையும்,

(v) இவ்வாசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலைகளுக்கு ஆசிரியர்களைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்,

(vi) ஆமெனில், இதற்காக எவ்வளவு காலம் எடுக்குமென்பதையும்

அவர் இச்சபைக்குக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of -

(i) the number of schools administered by the Kotapola Divisional Education Office of the Deniyaya Zonal Educational Office in the Matara District ?

(ii) the names, addresses and telephone numbers of those schools;

(iii) the number of schools in which the total number of students is less than one hundred out of the schools mentioned above ?

(iv) the names of those schools?

(b) Will he state in this House -

(i) whether there are schools in which there are excess teachers in this Division;

(ii) the names, addresses and telephone numbers of those schools;

(iii) the names of the schools in which there is a shortage of teachers;

(iv) the subjects for which there is a shortage of teachers;

(v) whether action will be taken to provide teachers to those schools in which there is a shortage of teachers; and

if so, the period of time taken for it ?

(c) If not, why?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

(අ) (i) රජයේ පාසල් 24

(ii) පාසල්වල නම් හා ලිපිනයන් අමුණා ඇත. (ඇමුණුම – 01) දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(iii) 05

(iv) • මාර/ කිරිවලගම ක. වි.
• මාර/ යටිහොරගල ක. වි.
• මාර/ මුගුණුමුල්ල ක. වි.
• මාර/ පෝරුපිටිය ක. වි.
• මාර/ උඩහොරගල ක. වි.

(ආ) (i) ඔව්.

(ii) පාසල්වල නම් හා ලිපිනයන් අමුණා ඇත. (ඇමුණුම - 02)

(iii) පාසල්වල නම් හා ලිපිනයන් අමුණා ඇත. (ඇමුණුම - 03)

(iv) විත්‍ර, සංගීත, නැටුම්, ප්‍රාථමික, චිත්‍ර, ගණිත, ඉංග්‍රීසි

(v) කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් කළමනාකරණය කරනු ඇත.

(vi) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම 01

කොටපොල අධ්‍යාපන කොට්ඨාසයේ රජයේ පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | කිරිවලගම ක.වි. | මෙදේරිපිටිය, දෙනියාය |
| 2 | පෝරුපිටිය ක.වි. | වරල්ල |
| 3 | යටිහොරගල ක.වි. | වරල්ල |
| 4 | උඩහොරගල ක.වි. | උඩහොරගල |
| 5 | මුගුණුමුල්ල ක.වි. | කොටපොල |
| 6 | කන්දිල්පාන ක.වි. | බටයාය, දෙනියාය |
| 7 | ඉලුක්පිටිය ක.වි. | කොටපොල |
| 8 | ගොඩකුඹුර ක.වි. | කොටපොල |
| 9 | කිරිවැල්දොල ක.වි. | කිරිවැල්දොල, දෙනියාය |
| 10 | විහාරහේන ක.වි. | විහාරහේන, දෙනියාය |
| 11 | මෙදේරිපිටිය ක.වි. | මෙදේරිපිටිය, දෙනියාය |
| 12 | පරගල ක.වි. | පරගල, මොරවක |
| 13 | හැන්ඩ්ෆර්ඩ් දෙ.ක.වි. | හැන්ඩ්ෆර්ඩ්, දෙනියාය |
| 14 | එනසාල්වත්ත දෙ.ක.වි. | විහාරහේන, දෙනියාය |
| 15 | අනින්කන්ද දෙ.ක.වි. | දෙනියාය |
| 16 | කොළවෙනිගම ක.වි. | කොලවෙණිගම, දෙනියාය |
| 17 | බෙවර්ලි දෙ.ක.වි. | බෙවර්ලිගම, දෙනියාය |
| 18 | වරල්ල එම්.ඩී. යාපා ම.වි. | දෙනියාය පාර, වරල්ල |
| 19 | දෙනියාය රාජපක්ෂ ම.වි. | ප්‍රධාන පාර, දෙනියාය |
| 20 | ශාන්ත මැතිව්ස් ම.වි. | දෙනියාය |
| 21 | පල්ලේගම ම.වි. | පල්ලේගම, කොළවෙනිගම |
| 22 | කීර්ති අබේවික්‍රම ම.ම.වි. | දෙනියාය පාර, මොරවක |
| 23 | කොටපොල ජාතික පාසල | කොටපොල |
| 24 | දෙනියාය ම.ම.වි. | දෙනියාය |

ඇමුණුම 02

කොටපොල අධ්‍යාපන කොට්ඨාසයේ ගුරු අතිරික්ත පවතින පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | පෝරුපිටිය ක.වි. | වරල්ල |
| 2 | යටිහොරගල ක.වි. | වරල්ල |
| 3 | උඩහොරගල ක.වි. | උඩහොරගල |
| 4 | මුගුණුමුල්ල ක.වි. | කොටපොල |
| 5 | ඉලුක්පිටිය ක.වි. | කොටපොල |
| 6 | කිරිවැල්දොල ක.වි. | කිරිවැල්දොල, දෙනියාය |
| 7 | වරල්ල එම්.ඩී. යාපා ම.වි. | දෙනියාය පාර, වරල්ල |

ඇමුණුම 03

කොටපොල අධ්‍යාපන කොට්ඨාසයේ ගුරු ඌනතා පවතින පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | හැන්ඩ්ෆර්ඩ් දෙ.ක.වි. | හැන්ඩ්ෆර්ඩ්, දෙනියාය |
| 2 | එනසාල්වත්ත දෙ.ක.වි. | විහාරහේන, දෙනියාය |
| 3 | අනින්කන්ද දෙ.ක.වි. | දෙනියාය |
| 4 | බෙවර්ලි දෙ.ක.වි. | බෙවරලියගම, දෙනියාය |
| 5 | දෙනියාය රාජපක්ෂ ම.වි. | ප්‍රධාන පාර, දෙනියාය |
| 6 | ශාන්ත මැතිව්ස් ම.වි. | දෙනියාය |
| 7 | පල්ලේගම ම.වි. | පල්ලේගම, කොළවෙනිගම |
| 8 | කීර්ති අබේවික්‍රම ම.ම.වි. | දෙනියාය පාර, මොරවක |
| 9 | කොටපොල ජාතික පාසල | කොටපොල |
| 10 | දෙනියාය ම.ම.වි. | දෙනියාය |

## පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් : යටිතල පහසුකම්

## பஸ்கொட கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள் : உட்கட்டமைப்பு வசதிகள்

## SCHOOLS ADMINISTERED BY PASGODA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILITIES

0813/'10

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවන්ගේ ඌනතාවන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் தெனியாய வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் பஸ்கொட கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலைகளின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்,

(ii) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்,

(iii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்குமென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the government schools administered by the Pasgoda Divisional Education Office of the Deniyaya Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity; and

(v) the number of schools with furniture requirements ?

(c) Will he state-

(i) the names, addresses and telephone numbers of schools with aforesaid shortages;

(ii) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

if so, the period of time taken for it?

(d) If not, why?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

(අ) ඌනතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) 03

(ii) පුස්තකාල හා විද්‍යාගාර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ. සමහර පාසල්වල පංති කාමරය තුළ කුඩා පුස්තකාල ඇත.

(iii) 15

(iv) විදුලිය නොමැති ගුරු නිවාස නැත.

(v) ලී භාණ්ඩ අවශ්‍යතා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබාදේ.

(ඇ) (i) සඳහන් කරමි. ඇමුණුම අංක 1හි ඇත. දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබාගත හැක.

(ii) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත පළාත් සභාව මගින් කළමනාකරණය කරනු ලැබේ.

(iii) මූල්‍ය පහසුකම් ලැබෙන ආකාරය අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ඇමුණුම 1

දෙනියාය අධ්‍යාපන කලාපයේ පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසලේ නම සහ ලිපිනය | විදුලිබලය | පුස්තකාල | විද්‍යාගාර | ගුරු නිවාස | [illegible] |
|---|---|---|---|---|---|---|
| 01 | මාර/ඌරුබොක්ක ම.ම.වි ඌරුබොක්ක | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 02 | මාර/ඕලකුඹුර ක.වි. දෙනියාය | නැත | නැත | නැත | නැත | ඇත |
| 03 | මාර/පහලබටාදුර ක.වි. බටාදුර, දෙනියාය | ඇත | නැත | නැත | නැත | ඇත |
| 04 | මාර/තලපල කන්ද ක.වි. දෙනියාය | නැත | නැත | නැත | ඇත | ඇත |
| 05 | මාර/කිරිලිපන ක.වි. මොරගල - කිරිලිපන | ඇත | ඇත | නැත | නැත | ඇත |
| 06 | මාර/මොලොග්ගමුව ක.වි. මොරගල් - කිරිලිපන | ඇත | නැත | නැත | නැත | ඇත |
| 07 | මාර/මැකිලියතැන්න ක.වි. ඌරුබොක්ක | ඇත | නැත | නැත | නැත | ඇත |
| 08 | මාර/කිරිපිටිය ක.වි. කිරිපිටිය, ඌරුබොක්ක | ඇත | නැත | නැත | නැත | ඇත |
| 09 | මාර/දම්පහල ක.වි. දම්පහල | ඇත | ඇත | නැත | නැත | ඇත |
| 10 | මාර/හුලංකන්ද ක.වි. දම්පහල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 11 | මාර/ගින්නලිය ම.වි. ගින්නලිය - ඌරුබොක්ක | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 12 | මාර/අලකොලදෙනිය ක.වි. අලකොලදෙනිය - ඌරුබොක්ක | ඇත | නැත | නැත | නැත | ඇත |
| 13 | මාර/සුහුල්හේනකන්ද ක.වි. බෙරලපනාකර | ඇත | ඇත | නැත | ඇත | ඇත |
| 14 | මාර/පටිටිගල ක.වි. පටිටිගල,බෙරලපනාකර | ඇත | නැත | නැත | නැත | ඇත |
| 15 | මාර/කැටවල ක.වි. බෙරලපනාතර | ඇත | නැත | නැත | ඇත | ඇත |
| 16 | මාර/බෙරලපනාතර ම.වි බෙරලපනාතර | ඇත | නැත | නැත | නැත | ඇත |
| 17 | මාර/කෝංගහදෙනිය ක.වි. පොත්දෙනිය | ඇත | නැත | නැත | ඇත | ඇත |
| 18 | මාර/විලයාය ක.වි. දම්පහල | ඇත | නැත | නැත | නැත | ඇත |
| 19 | මාර/බෙංගමුව ම.වි. බෙංගමුව | ඇත | ඇත | නැත | ඇත | ඇත |
| 20 | මාර/ශ්‍රීමත් අනගාරික ධර්මපාල ම.වි. - ගොමිල - මාවරල | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 21 | මාර/ඇහැලකන්ද ම.වි ගොමිල, මාවරල | ඇත | ඇත | නැත | ඇත | ඇත |
| 22 | මාර/ගොමිල ක.වි ගොමිල, මාවරල | ඇත | නැත | ඇත | නැත | ඇත |
| 23 | මාර/පුවක්ගහහේන ක.වි. ගොමිල, මාවරල | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 24 | මාර/රොටුඹ විජය බා.ම.වි. රොටුඹ, මාතර | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 25 | මාර/දෙන්කන්දලිය ක.වි. දෙන්කන්දලිය රොටුඹ, මාතර | ඇත | නැත | ඇත | නැත | ඇත |
| 26 | මාර/පනාකඩුව ක.වි. පනාකඩුව, රොටුඹ, මාතර | ඇත | නැත | නැත | නැත | ඇත |
| 27 | මාර/පස්ගොඩ ම.වි. පස්ගොඩ | ඇත | ඇත | ඇත | නැත | ඇත |
| 28 | මාර/බෙරලපනාතර ප්‍රාථමික වි. බෙරලපනාතර | ඇත | ඇත | ඇත | ඇත | ඇත |
| 29 | මාර/බෙංගමුව ක.වි. බෙංගමුව | නැත | නැත | නැත | නැත | ඇත |

## දෙවිනුවර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: ගුරු ඌනතා

## தெவிநுவர கோட்டக்கல்வி அலுவலகம் நிருவகிக்கும் பாடசாலைகள்: ஆசிரியர் பற்றாக்குறை

## SCHOOLS ADMINISTERED BY DEVINUWARA DIVISIONAL EDUCATION OFFICE : TEACHER SHORTAGE

0815/'10

**3. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දෙවිනුවර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் மாத்தறை வலயக் கல்வி காரியாலயத்திற்குரிய தெவிநுவர கோட்டக்கல்வி அலுவலகத்தினால் நிருவகிக்கப்படுகின்ற அரசாங்க பாடசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,

(ii) இப்பாடசாலைகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசிகளின் இலக்கங்கள் யாவையென்பதையும்,

(iii) இப்பாடசாலைகளில் நூறு மாணவர்களுக்குக் குறைவாக உள்ள பாடசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,

(iv) அப்பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்,

(v) மூடுவதற்காக தற்போது தீர்மானிக்கப்பட்டுள்ள பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இக்கோட்டத்தில் ஆசிரியர் மிகை நிலவுகின்ற பாடசாலைகள் உள்ளனவா என்பதையும்,

(ii) இப்பாடசாலைகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவையென்பதையும்,

(iii) ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்,

(iv) ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடங்கள் யாவையென்பதையும்,

(v) இவ்வாசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலைகளுக்கு ஆசிரியர்களைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்,

(vi) ஆமெனில், இதற்காக எவ்வளவு காலம் எடுக்குமென்பதையும்

அவர் இச்சபைக்குக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of -

(i) the number of schools administered by the Devinuwara Divisional Education Office of the Matara Zonal Educational Office in the Matara District ?

(ii) the names, address and telephone numbers of those schools;

(iii) the number of schools in which the total number of students is less than one hundred;

(iv) the names of those schools?

the names of schools that have been identified to be closed down by now?

(b) Will he state in this House -

(i) whether there are schools in which there are excess teachers in this Division;

(ii) the names, addresses and telephone numbers of those schools;

(iii) the names of the schools in which there is a shortage of teachers;

(iv) the subjects for which there is a shortage of teachers;

(v) whether action will be taken to provide teachers to those schools in which there is a shortage of teachers; and

if so, the period of time to be taken for it ?

(c) If not, why?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

(අ) (i) රජයේ පාසල් - 16

(ii) පාසල්වල නම් හා ලිපිනයන් අමුණා ඇත. (ඇමුණුම් 01) දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(iii) 03

(iv) • මාර/ නාඹටුන්න ක. වි.
• මාර/ උඩ අපරැක්ක ක. වි.
• මාර/ වාච්ච ක. වි.

(v) ඉන් කිසිවක් වසා දැමීමට අධ්‍යාපන අමාත්‍යාංශය දැනට තීරණය කර නැත.

(ආ) (i) ඔව්.

(ii) පාසල්වල නම් හා ලිපිනයන් අමුණා ඇත. (ඇමුණුම් - 02)

(iii) • මාර/ දෙවිනුවර ජාතික පාසල
• මාර/ තලල්ල උතුර ම. වි.

(iv) නැටුම්, චිත්‍ර, සංගීත, ප්‍රාථමික, විද්‍යා, ගණිත, ඉංග්‍රීසි

(v) කලාප අධ්‍යාපන කාර්යාලය මගින් කළමනාකරණය කරනු ඇත.

(vi) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

*ඇමුණුම - 01*

දෙවිනුවර අධ්‍යාපන කොට්ඨාසයේ රජයේ පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | නාඹටුන්න දකුණ ක.වි. | නාඹටුන්න, කෝට්ටගොඩ |
| 2 | උඩ අපරැක්ක ක.වි. | උඩ අපරැක්ක, අපරැක්ක |
| 3 | වාච්ච ක.වි. | වාච්ච, දෙවිනුවර |
| 4 | කපුගම ක.වි. | කපුගම, දෙවිනුවර |
| 5 | අපරැක්ක ආදර්ශ ප්‍රා.වි. | අපරැක්ක |
| 6 | අල් - අසාර් මු.වි. | ගන්දර |
| 7 | දෙල්ගල්ල ක.වි. | දෙල්ගල්ල, ගන්දර |
| 8 | සිරි පියරතන ක.වි. | ගන්දරවත්ත, දෙවිනුවර |
| 9 | නාඹටුන්න මිශ්‍ර ක.වි. | කැකණදුර |
| 10 | අපරැක්ක ම.වි. | අපරැක්ක |
| 11 | ගන්දර ආදර්ශ ප්‍රා.වි. | ගන්දර |
| 12 | ගන්දර ම.වි. | ගන්දර |
| 13 | සරණපාල ක.වි. | දෙවිනුවර |
| 14 | තලල්ල දකුණ ම.වි. | තලල්ල, කෝට්ටගොඩ |
| 15 | දෙවිනුවර ජාතික පාසල | දෙවිනුවර |
| 16 | තලල්ල උතුර ම.වි. | කැකණදුර, මාතර. |

ඇමුණුම - 02

දෙවිනුවර අධ්‍යාපන කොට්ඨාසයේ ගුරු අතිරික්ත පවතින පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | නාඹටුන්න දකුණ ක.වි. | නාඹටුන්න, කෝට්ටගොඩ |
| 2 | උඩ අපරැක්ක ක.වි. | උඩ අපරැක්ක, අපරැක්ක |
| 3 | වාච්ච ක.වි. | වාච්ච, දෙවිනුවර |
| 4 | කපුගම ක.වි. | කපුගම, දෙවිනුවර |
| 5 | අපරැක්ක ආදර්ශ ප්‍රා.වි. | අපරැක්ක |
| 6 | අල් - අසාර් මු.වි. | ගන්දර |
| 7 | දෙල්ගල්ල ක.වි. | දෙල්ගල්ල, ගන්දර |
| 8 | සිරි පියරතන ක.වි. | ගන්දරවත්ත, දෙවිනුවර |
| 9 | නාඹටුන්න මිශ්‍ර ක.වි. | කැකණදුර |
| 10 | අපරැක්ක ම.වි. | අපරැක්ක |
| 11 | ගන්දර ආදර්ශ ප්‍රා.වි. | ගන්දර |
| 12 | සරණපාල ක.වි. | දෙවිනුවර |
| 13 | තලල්ල දකුණ ම.වි. | තලල්ල, කෝට්ටගොඩ |

## සමෘද්ධිලාභීන්: මාතර දිස්ත්‍රික්කය
சமுர்த்திப் பயனுகரிகள்: மாத்தறை மாவட்டம்
SAMURDHI BENEFICIARIES: MATARA DISTRICT

1151/'11

4. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මාතර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ,

(i) 2005 සිට 2010 දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30වැනි දින දක්වා හිමිකම් ලැබූ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2010 දක්වා සමෘද්ධිලාභීන් වෙනුවෙන් වාර්ෂිකව වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2005 සිට 2009 දක්වා සමෘද්ධිලාභීන්ව සිට ඉවත් කරන ලද අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) එසේ ඉවත් කරනු ලැබුවේ නම්, එම පුද්ගලයන් ඉවත් කරන ලද පදනම කවරේද;

(v) 2010 ජුනි මාසයෙන් පසු සමෘද්ධිලාභීන් ලෙස අලුතින් එක් කරන ලද අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவிலும்,

(i) 2005 ஆம் ஆண்டு தொடக்கம் 2010 ஆம் ஆண்டு வரையிலான சகல வருடங்களிலும் யூன் மாதம் 30 ஆம் திகதி வரை உரித்துரிமை பெற்றிருந்த சமுர்த்திப் பயனுகரிகளின் எண்ணிக்கை தனித்தனியாக எத்தனையென்பதையும்;

(ii) 2005 ஆம் ஆண்டு தொடக்கம் 2010 ஆம் ஆண்டு வரை சமுர்த்திப் பயனுகரிகளின் சார்பாக வருடாந்தம் ஒதுக்கப்பட்ட பணத் தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) 2005 ஆம் ஆண்டு தொடக்கம் 2009 ஆம் ஆண்டு வரை சமுர்த்திப் பயனுகரிகளாகவிருந்து பின்னர் நீக்கப்பட்டவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்;

(iv) இவ்வாறு நீக்கப்பட்டிருந்தால் இவர்கள் நீக்கப்பட்டதன் அடிப்படை யாதென்பதையும்

(v) 2010 யூன் மாதத்தின் பின்னர் சமுர்த்திப் பயனுகரிகளாக புதிதாக சேர்க்கப்பட்டோரின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House-

(i) separately of the number of persons who were entitled for Samurdhi benefits up to June30th in each year from 2005 up to 2010;

(ii) separately of the amount of money allocated for Samurdhi beneficiaries in each year from the year 2005 up to 2010;

(iii) of the names and addresses of the persons who had been Samurdhi beneficiaries from 2005 up to 2009 and were deprived of Samurdhi benefits subsequently;

(iv) of the basis on which the aforesaid persons were deprived of their Samurdhi benefits, if they have been deprived of it;

(v) of the names and addresses of the persons who were granted Samurdhi benefits anew after the month of June 2010;

in each Divisional Secretary's Division in the Matara district ?

(b) If not, why?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)

(අ) (i) 2005 සිට 2010 දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 වැනි දින දක්වා හිමිකම් ලැබූ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව

| වර්ෂය | සමෘද්ධිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| 2005 | 99,341 |
| 2006 | 97,349 |
| 2007 | 94,540 |
| 2008 | 77,267 |
| 2009 | 75,902 |
| 2010 | 75,290 |

(ii) 2005 සිට 2010 සමෘද්ධිලාභීන් වෙනුවෙන් වාර්ෂිකව වෙන් කරන ලද මුදල

| වර්ෂය | වෙන් කළ මුදල |
|---|---|
| 2005 | 458,599,812.00 |
| 2006 | 581,342,471.00 |
| 2007 | 466,573,860.00 |
| 2008 | 478,046,755.00 |
| 2009 | 451,561,159.00 |
| 2010 | 455,661,782.00 |

(iii) නිර්ණායකයන් අනුව ඉවත් වන අය හැර කිසිම සමෘද්ධිලාභියෙකු ඉවත් කර නැත.

(iv) ඉවත් කරන ලද පදනම

- සාමාජිකයා මියයාම
- පවුලේ ආදායම ඉහළයාම -

පවුලේ සාමාජිකයෙකු රජයේ රැකියාවකට අනුයුක්ත වීම.

ස්වයං රැකියා මාර්ගයෙන් පවුලේ ආදායම ඉහළ යාම

පවුලේ සාමාජිකයෙකු විදේශ රැකියාවක් සඳහා විදේශගතව මාස 06ක් සම්පූර්ණ වීමෙන් පසු එම ආදායම පවුලේ ආදායම ලෙස ගණනය කිරීම.

- පදිංචි ස්ථානය මාරුවීම නිසා අලුතෙන් පදිංචි ස්ථානයට මුද්දරය මාරුකිරීමට සිදුවීම
- පවුලේ ආදායම වසන් කරමින් අයුතු ලෙස මුද්දර පත්‍රිකා ලබා ගන්නා බව තහවුරු කර ගැනීම

(v) සමෘද්ධිලාභීන්ගේ නම් සහ ලිපියන් සඳහන් කිරීමේදී පුද්ගලයාගේ ගෞරවයට හානි සිදුවන බැවින්, මීට ඉහත පාර්ලිමේන්තුවේදී නම් හෙළි නොකිරීමට කථානායකවරයා විසින් දන්වන ලදී. එහෙත් යම් කෙනෙකුට සමෘද්ධි හිමිකම (සුදුසුකම තිබියදී) අහිමි වී ඇත්නම් ඒ ගැන තොරතුරු ඉදිරිපත් කළහොත් අදාළ සාධාරණය ඉටු කළ හැක.

(ආ) පැන නොනඟී.

(a) (i) Number of Samurdhi recipients who were entitled on 30th June in each year from 2005 to 2010

| **Year** | **Number of Samurdhi recipients** |
|---|---|
| 2005 | 99,341 |
| 2006 | 97,349 |
| 2007 | 94,540 |
| 2008 | 77,267 |
| 2009 | 75,902 |
| 2010 | 75,209 |

(ii) Amount of allocated money for Samurdhi recipients per annum from 2005 to 2010.

| **Year** | **Allocated amount** |
|---|---|
| 2005 | 458,599,812.00 |
| 2006 | 581,342,471.00 |
| 2007 | 466,573,860.00 |
| 2008 | 478,046,775.00 |
| 2009 | 451,561,159.00 |
| 2010 | 455,661,782.00 |

(iii) Any Samurdhi beneficiary has not removed except the persons who removed as per the criteria.

(iv) Removal basis:

- Death of the beneficiary
- Increase of the family income

  Recruitment of a family member to Government Service.

  Increase of the family income through self employments

  After a completion of 6 months of leaving out the country for overseas employments of the family member, the income is considered as the family income..
- Change of the stamp to new residence due to shifting of the residence.
- Ensuring the receiving of the stamp cards illegally by misleading the family income.

(v) Due to defaming the dignity of the Samurdhi beneficiaries in mentioning their names and addresses, the Speaker has informed not to reveal the names in the Parliament before that. If someone has lost the Samurdhi benefit (having qualified), the justice can be made if the information are presented.

(b) Does not arise.

### 5 වන ප්‍රශ්නය - 1156/'11

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නයට පිළිතුර දීමට වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මහතා මාස තුනක් කල් ඉල්ලා ඇත.

### 6 වන ප්‍රශ්නය - 1540/'11

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නයට පිළිතුර දීමට අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.